sinhalaebooks.com



sinhalaebooks.com

හර්කියුල පොයිරෝගේ රහස් පරීක්ෂණ කෙටිකතා

මෙවැනි ඉහළම තත්වයේ ගුණාත්මක PDF ලබා ගැනීමට
https://sinhalatranslationsofdetectivestories.blogspot.com/

වෙත පිවිසෙන්න.

sinhalaebooks.com

පෙර වදන . . .

'හර්කියුල පොයිරොගේ රහස් පරීක්ෂණ කෙටිකතා' මෙලෙස ඔබ අතට පත්වන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු කෙටි රහස් පරීක්ෂණ කතා කිහිපයක් හෙළ බසට හැරවීමට මා විසින් කළ වෑයමක් වශයෙනි.

මෙම පරිවර්තනයේ එන කෙටි කතා සියල්ල බ්‍රිතාන්‍ය ජාතික ගත්කතුවරියක් වන අගතා ක්‍රිස්ටි මහත්මියගේ රහස් පරීක්ෂක කෙටිකතා ග්‍රන්ථවලින් උපුටා ගත් කෙටිකතා ය. අගතා ක්‍රිස්ටි මහත්මිය ලොව පුරා පතළව ඇත්තේ 'රහස් පරීක්ෂක රැජිණ' යන විරුදාවලියෙනි. බයිබලය හා ශේක්ස්පියර්ගේ ග්‍රන්ථ හැරුණු විට මෙතෙක් වඩාත්ම ජනප්‍රිය වුණු පොත්වල හිමිකාරීත්වය දරන්නේ ඇයයි. ඇය රහස් පරීක්ෂක නවකතා හා කෙටිකතා සංග්‍රහ 80 ක් ද නාට්‍ය 19 ක් ද ලියා ඇත. ඇයගේ ග්‍රන්ථ අලෙවි වූ ප්‍රමාණය කෝටි සියය ද ඉක්මවූ ගණනකි.

මෙහි එන 'හර්කියුල පොයිරෝ' නමැති බෙල්ජියන් ජාතික රහස් පරීක්ෂකවරයාගේ ප්‍රථම කරළියට ඒම සිදුවන්නේ අගතා ක්‍රිස්ටි මහත්මියගේ 'The Mysterious Affair At Styles' යන ග්‍රන්ථයෙනි.

එයින් පසු ඔහු ඇයගේ නවකතා 40 ක පමණ ද කෙටිකතා 51 ද පෙනී සිටියේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මෙහි දැක්වෙන කෙටිකතා උපුටා ගනු ලැබූ කෙටිකතා සංග්‍රහයන්ගේ ඉංග්‍රීසි ප්‍රකාශන පහත පරිදි වේ.

- Poirot's Early Cases
  - Affair at the Victory Ball
  - The Plymouth Express
- Poirot's Investigations
  - The jewel robbery at the Grand Metropolitan
- The adventure of the Christmas Pudding
  - Four and Twenty Blackbirds

මෙහි ඇලකුරුවලින් දක්වා ඇත්තේ පොයිරෝ ප්‍රංශ බසින් කියන කියුම් බව පවසමින් ඔබ හට මෙම පොත කියවා බැලීමට ආරාධනා කරන අතරම අවසාන වශයෙනුත් මේ සඳහා අතහිත දුන් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

පටුන

01.විධිමත් පාරිභෝගිකයා 7
Four and Twenty Blackbirds

02.සොහොන් කොතෙහි ශාපය 29
The Adventure of The Egyptian Tomb

03.ප්ලයිමත් ශීඝ්‍රගාමි දුම්රිය 57
The Plymouth Express

04.ග්‍රෑන්ඩ් මෙට්‍රොපොලිටන්හි සිදුවීමක් 83
Jewel Robbery at Grand Metropolitan

05.වික්ටරි බෝල් නර්තන රාත්‍රිය 108
The Affair at The Victory Ball

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

01. විධිමත් පාරිභෝගිකයා

"Four And Twenty Blackbirds" ප්‍රථම වරට ඇමරිකා එක්සත් ජනපදයේ *කොලියර්ස්සඟරාවේ* 1940 නොවැම්බර් 9 වන කලාපයේ ප්‍රකාශයට පත් කරන ලද අතර පසුව එය 1941 මාර්තු මස, ද *ස්ට්‍රෑන්ඩ්* සඟරාවේ " Poirot And The Regular Customer" පළ විය.

හර්කියුල පොයිරෝ තම මිතුරෙකු වන හෙන්රි බොරිංග්ටන් සමඟ චෙල්සිහි කින්ග්ස් මාවතේ "ගැලන්" ආපනශාලාවෙන් රාත්‍රී ආහාරය ගනිමින් සිටියේ ය. බොරිංග්ටන් මහතා විවේකී වටපිටාවන්ට කැමති හෙයින් මෙම ආපනශාලාවේ රසිකයෙකු විය. ඔහුගේ ප්‍රියතම ආහාරයන් සාමාන්‍ය හෙවත් චාම් ඉංග්‍රීසි ආහාරයන් වුණු අතර ඔහු අවන්හලට පැමිණෙන අන් අයගේ චර්යාවන් ගැන ඔහු සමඟ ආහාර ගන්නා අයට පැවසීමට ආශා කළේ ය. කෙසේ වුව ද ඒ හැරුණු විට බොරිංග්ටන් මහතාට වෙනත් රසවින්දනයන් අවම වශයෙන් සතු විණි.

අවන්හලේ සේවිකාවක වන මොලී බොරිංග්ටන් මහතාට සැලකුවේ පරණ මිතුරෙකු ලෙසිනි. ඇය ද අවන්හලට නිරතුරුව එන අයගේ ප්‍රියතම ආහාරයන් ගැන තමා දැන සිටීම පිළිබඳ ආඩම්බර විණි.

" සුභ සන්ධ්‍යාවක් මහත්වරුනි." ඇය ඔවුන් දෙදෙනා අසුන් ගැනීමට සැරසෙන විටම පැමිණියා ය. "ඔබ දකින්න ලැබීම සතුටක් බොරිංග්ටන් මහත්මයා. චෙස්නට් සමඟ කළුකුම් මස් පිරවුමයි ඒ වගේම හොඳම ස්ටිල්ටන් චීස් ඔබ කැමතිම ඒවාට නේ ද මහත්මයා? කරුණාකර මුලින්ම මාළු ද සුප් ද කියන්න."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" අද නම් ඔබේ ප්‍රංශ කෑම නෑ පොයිරෝ මහත්මයා. හොඳ ඉංග්‍රීසි කෑම නම් තියෙනවා" බොරිංග්ටන් මහතා මෙනුපත හොඳින් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව පැවසුවේ ය. "මගේ යාළුවා, මට මොනවා තිබුණත් කමක් නෑ. ඇණවුම් කරන එක ඔයාට බාරයි"

"හොඳයි" යැයි මෙනුපත පරීක්ෂාකාරීව බලමින් බොරිංග්ටන් මහතා පැවසුවේ ය. කෑම හා බීම පිළිබඳ වූ ප්‍රශ්නයන් විසඳුණු පසු බොරිංග්ටන් මහතා පුටුවේ හොඳින් වාඩිවී සේවිකාව තබා අත් පිස්නය දිගහැර නැවතත් කතාවට මුල පිරුවේ ය.

"මොලී හොඳ කෙල්ලක්. ඈ ඉස්සර ලස්සන නිසා මෙහෙට එන චිත්‍ර අඳින අය ඇයගේ චිත්‍රත් ඇන්දා. ඇය කෑම ගැන හොඳින් දන්නවා.ගෑණු අය ගොඩක් කෑම ගැන මාතෘකාවේ දී අසාර්ථකයි. මොක ද කිව්වොත් ඔවුන් කෑමකට ගියොත් ඇනවුම් කරන්නේ ඇය මුලින්ම දකින දේ."

" *ඒක ඇත්ත* " පොයිරෝ හිස වනමින් එය අනුමත කළේ ය. " දෙවියන්ට ස්තූති වෙන්න පිරිමි අය එහෙම නැහැ." බොරිංග්ටන් මහතා සතුටින් පැවසුවේ ය. " හැම නිතරම ද?" පොයිරෝගේ කුඩා දෑසේ දීප්තියක් දැල්වුණි.

"හොඳයි සමහර විට තරුණ අය එහෙම නෙවෙයි. මේ දවස්වල ඉන්න ගොඩක් තරුණ අය ඔක්කොම එක වගේ. ධෛර්යයක් නැහැ ඉවසීමක් නැහැ ඔවුන් ගැනනම් කියලා වැඩක් නැහැ. මට නම් තරුණ කමින් ප්‍රයෝජනයක් නැහැ. ඔවුන් හිතන්නේ අවුරුදු හැටට වැඩි මනුස්සයෙක් ඕනම වෙලාවක මැරෙන්න පුළුවන් කියලයි. සමහර විට හරි වෙන්නත්

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

පුළුවන්. ඔවුන් මේ යන විදියට වයසක ඥාතියෙකුටවත් උදව් කරන එකක් නැතෙයි කියලයි මට නම් හිතෙන්නේ."

"ඒක වෙන් පුළුවන්. ඒත් ඒ ඔවුන්ගේ විදිය" පොයිරෝ පැවසුවේ ය. ඔබට හොඳ දැක්මක් තියෙනවා පොයිරෝ ඒ දැක්මම පොලීසියටත් තිබුනනම් කොච්චර හොඳ ද?"

" *ගොඩක් දුරට තියෙනවා* " පොයිරෝ මද සිනහවකින් යුතුව පැවසුවේ ය. අවුරුදු හැටට වැඩිය වැඩි අය ඔය කියන විදියට මැරුණොත් පුදුමයක් තමයි. මට හිතෙන්නෙ ඔයාගේ ඔළුවේ මොකක් හරි අදහසක් තියෙනවා."

" ඔයාගේ ප්‍රශ්ණේ තමයි පොයිරෝ ඔබ හැමදෙයක් දිහාම බලන්නේ අපරාධයක් විදියටයි. අනික ඔබ එහෙම දෙයක් වෙනකම් තමයි හැම වෙලේ ම බලාගෙන ඉන්නේ"

" සමාවෙන්න යාළුවා. ඒකට කමක් නැහැ. මට කියන්න ඔයාගේ අත්දැකීම් ගැන. මොනව ද ඔයා දන්න දේවල්." "පටලැවිල්ල" බොරිංග්ටන් මහතා පැවසුවේ ය.

" ඒක තමයි මේ දවස්වල වැඩියෙන්ම වෙන දේ. ගොඩක්ම පැටලැවිලා. ඒ වගේම හොඳ භාෂාව. හොඳ භාෂාවකින් පුළුවන් පටලැවිලි වහල දාන්න. හරියට බාල ගතිය හංගන්න මාලු කැල්ලක් සෝස් ගොඩකින් වහනවා වගේ. මට නම් ඕන කරන්නේ සෝස් වැඩිය දාලා නැති කටු නැති මාලු පෙත්තක් " ඔහු එය අවසන් කරනවාත් සමඟම මොලී පැමිණි අතර ඔහු තමාට අවශ්‍ය දේ ඇණවුම් කළේ ය.

https://sinhalatranslationofdetectivestories.blogspot.com

sinhalaebooks.com

“ ඔබ දන්නවනේ මට ඕන මොනව ද කියලා.” “ ඔබ මෙහෙට නිතරම එන කෙනෙක් එහෙම එකේ මම දැනගන්න එපැයි ඔබේ කැමතිම කෑම.” ඇය පැවසුවා ය. “ මිනිස්සු හැම නිතරම කැමති එකම දේට ද නැත්නම් ඒක එක එක වෙලාවට වෙනස් වෙනස් වෙනව ද?” පොයිරෝ ඇසුවේ ය.

“ පිරිමි අය නම් එකම විදිය තමයි මහත්මයා. ඒත් ගෑණු අය වෙනස් වෙනස් දේවලටයි කැමති.” “ මම ඔයාට කිව්වනේ. ගෑණු අය කෑම සම්බන්ධයෙන් ගොඩක් අවුල් සහගතයි.” බොරිංග්ටන් මහතා එසේ පවසමින් වටපිට බැලුවේ ය.

“ ලෝකය හරි අමුතු තැනක්. පෙනව ද අර මුල්ලේ ඉන්න රැවුලක් වවා ගත්ත කෙට්ටු වයසක කෙනා. මොලීත් ඔයාට කියාවි එයා මෙහෙට එන්නේ අඟහරුවාදා බ්‍රහස්පතින්දා දවස්වල රෑට විතරයි කියලා. එයා මෙහෙට එන්නේ අවුරුදු දහයක විතර ඉඳලා. එයා හරියට මේකෙම කොටසක් වගේ. ඒත් කවුරුවත් අඩුමතරමේ එයාගේ නමවත් දන්නේ නැහැ. ඒක ගැන හිතද්දිත් විහිළුයි වගේ.”

“ මට පේන්නේ ඔයාලා තාමත් අර වයසක වෙලාවට වැඩ කරන සීයව මෙහෙට ගෙන්න ගන්නවා වගේ ”ඒ මොහොතෙහි කළුකම් මස් රැගෙන පැමිණි වේටර්වරියට ඔහු විහිළුවට මෙන් පැවසුවේ ය.

“ ඒක හරි සර්. ඔහුගේ දවස් ඉතින් අඟහරුවාදයි බ්‍රහස්පතින්දයිනේ. පුදුමෙ කියන්නේ ඔහු ගිය සතියේ සඳුදා මෙහේ ආවනේ. මට හිතුනේ මට දවස් ගණන වැරදිලා. අද අඟහරුවාදා වෙන්න ඇතියෙයි කියලා. ඒ වුණත් ඔහු ඊට පස්සේ දවසෙ රෑත් ආවා. ඒක නිකම් අමතර දවසක් විතරයි.”

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" අමුතු විදියේ කාලසටහනින් ඇත් වීමක්." පොයිරෝ මිමිණීය." මට පුදුමෙ හේතුව මොකක් ද කියලා" " සර්, ඔබ ඇහුව නිසා කියන්නෙ ඔහු හිටියේ හිතේ අවුලෙන් වගේ." " ඔබ හිතන්නේ ඒ ඔහුගේ විදිය කියල ද?" " නෑ සර්, ඔහු කොහොමත් ගොඩක් නිහඬ කෙනෙක් ඔහු අඩුම තරමේ යද්දියි එද්දියි 'සුභ සන්ධ්‍යාවක්' කියලවත් කියන්නේ නැහැ. ඒක තමයි ඔහුගේ විදිය" " ඔහුගෙ විදිය?"

" මම දන්නේ නැහැ ඔය මහත්වරු මට හිනාවේවි ද කියලා. ඒත් අවුරුදු දහයක් තිස්සෙ මෙහෙට එන මහත්මයෙක් කැමති දේවල් අකැමැති දේවල් මම නොදැන ඉන්න විදියක් නැහැනේ. ඔහු කවදාවත් තෙල් පුඩිමක්වත්, බ්ලැක්බෙරිවත්, උකු සුප් එකක්වත් ඇණවුම් කළේ නැහැ."

" ඒත් සඳුදා රෑ ඔහු උකු තක්කාලි සුප් එකයි, හරක් මස් පෙත්තයි, තෙල් පුඩිමකුයි, බ්ලැක්බෙරි ජෑම් එකකුයි ඇණවුම් කළා. මට නම් පෙනුණේ ඔහු දැනන් හිටියේ නැහැ ඔහු ඇණවුම් කරන්නේ මොනව ද කියලාවත්."

" ඔයා දන්නව ද යාළුවා, මට පේන්නේ මේක ගොඩක්ම අමුතුයි වගේ." පොයිරෝ පැවසී ය. කෑම පිළිගැන්වීමෙන් අනතුරුව මොලී සිනාසී පිටව ගියා ය. " අපි බලමු ඒ ගැන ඔයාගේ අර අමුතු උපකල්පනයක් අහලා." " මුලින් ඔයා කියන්නකෝ යාළුවා."

" හොඳයි අපි හිතමු. සමහරවිට ඔහුට දොස්තර කෙනෙක් කියන්න ඇති රෑ කෑම වෙනස් කරන්නෙයි කියලා."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" මට හිතාගන්න බැහැ කිසිම දොස්තර කෙනෙක් ඒ කැම ජාති ගන්න කියාවි කියලා යාළුවා."
" එහෙම කියන්න බැහැ. දොස්තර කෙනෙක්ට ඔයාගේ ඔළුවට ඕන දෙයක් දාන්න පුළුවන්." " ඒක ද ඔයාට තියෙන එකම අදහස?"

"හොඳයි ඇත්තටම ඒක තමයි මට පේන විදියට වෙන්න පුළුවන් එකම දේ. එහෙමත් නැත්නම් ඒ හාදයට හිතේ අවුලක් තිබුණු නිසා හිතන්නේ නැතිවම මොනහරි කෑමක් ඇණවුම් කරන්න ඇති."

" හැබැයි ඔයා මට කියන්න ඕන ඔයාගේ ඔළුවෙ තියෙන්නෙ මොකක් ද කියලා? සමහරවිට ඔබ කියාවි ඔහු මිනීමැරුමක් ගැන සැලසුම් හදමින් හිටියයි කියලා." ඔහු මොහොතක් නතර වී නැවතත් පවසා සිනහසුණේ ය. එනමුත් හර්කියුල පොයිරෝ සිනාසුණේ නැත. ඔහු ඇත්තෙන්ම දුකින් සිටින බවක් පේන්නට තිබුණේ ය.

ඔහුට ඇත්තෙන්ම අමුතු යමක් සිදුවෙමින් පවතින බවක් හැඟෙමින් තිබුණි. එනමුත් බොරිංග්ටන් මහතා එම අදහස පොයිරෝගේ සිතේ මැවුණු එකක් බව පවසා ප්‍රතික්ෂේප කළේ ය.

ඊට සති තුනකට පමණ පසුව ඔවුන් දෙදෙනා නැවතත් උමං දුම්රියේ දී මුණ ගැසුණු අතර ඔවුන් අත් රැඳවුම් පටිවල එල්ලීගෙනම එකිනෙකාට ආචාර කර ගත්තෝ ය. පිකැඩිලි සර්කස් භූමියේ බොහෝ දෙනෙක් බැස ගිය විට ඔවුන් දෙදෙනාට මැදිරියේ කෙළවර අසුන් දෙකක් ලැබුණි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ලෝකය දැන් හරි ආත්මාර්ථකාමියි සල්ලි පස්සෙමයි දුවන්නේ. වයසක මනුස්සයෙක්ට වුණත් ඇඟුවෙ නැත්නම් වාඩිවෙන්න තැනක් දෙන්නේ නැහැ." බොරිංග්ටන් මහතා කථාවට මුල පිරූ අතර එයට ප්‍රතිචාරයක් ලෙස පොයිරෝ තම උරහිස් වැනී ය. " කොහොම ද ඉතින් ඔයාට? ජීවිතයනම් හරිම අඩමානයි නේ ද?" පොයිරෝ ඇසී ය.

" ඒක කතාව නම් ඇත්ත. අද ඉන්නවා හෙට යනවා. ආ මම කියන්න හිටියේ මතකද අර 'ගැලන්' එකේ හිටපු වයසක මනුස්සයා. ඔහු පහුගිය සතියෙම ඇවිල්ලා නැහැ. මම නම් පුදුම වෙන්නේ නැහැ ඔහු මීට වැඩිය ලස්සන ලෝකෙකට ගිහිල්ලා නම්" බොරිංග්ටන් මහතා පැවසී විටම හර්කියුල පොයිරෝගේ දෑස්වල ක්ෂණික දීප්තියක් ඇති විය. "ඇත්තම ද?" ඔහු දෙවරක්ම එසේ ඇසී ය.

" ඔයාට මතක ද මම කිව්වා ඒ මනුස්සයට කවුරුහරි දොස්තර කෙනෙක් කෑම වෙනස් කරන්න කියන්න ඇති. පස්සෙ මටත් තේරුණා ඒක වෙන්න බැරි බව. මට දැන් නම් හිතෙන්නේ ඒ මනුස්සයා බෙහෙත් ගන්න දොස්තර කෙනෙක් ගාවට ගියාම ඒ දොස්තර සමහරවිට ඔහුට මේ ලෝකෙන් ඉක්මනටම යන්න වෙනවා වගේ හිත අවුල් වෙන විදියෙ දෙයක් කියන්න ඇති. ඊට පස්සේ ඔහු නිකන් පාර දිගේ ඇවිදන් ඇවිත් ඇවිල්ලා හිතන්නේ නැතිවම කෑම ඇණවුම් කරන්න ඇති. මම නම් කියන්නේ දොස්තරලා දෙයක් කියද්දී මීට වැඩිය හිතන්න ඕන කියලයි."

sinhalaebooks.com

" එයාලා සාමාන්‍යයෙන් එහෙම තමයි." පොයිරෝ පැවසීමෙන් අනතුරුව " මම මෙතනින් බහිනවා. සුභ ගමන් යාළුවා අපි කොහොමහරි දැනගත්ත නේ ද වයසක මනුස්සයගේ වැඩේ ගැන" යැයි කියමින් බොරිංග්ටන් මහතා දුම්රිය මැදිරියෙන් බැස ගියේ ය. කෙසේ වුව ද හර්කියුල පොයිරෝ ඉන් සෑහීමට පත්වූ බවක් පෙනෙන්නට නොතිබුණි. ඔහු කල්පනා කරන බවක් පෙනුණි. ඔහු නිවසට ගිය පසු සේවක ළමයා වූ ජෝර්ජ්ට කිසිවක් කියා පිටත් කර හැරියේ ය.

ඉන් මොහොතකට පසුව එම ප්‍රදේශයේ සිදුවූ මරණ ලයිස්තුවක ඇඟිල්ල ගෙන යමින් සිටි අතර එක් තැනක ඔහුගේ ඇඟිල්ල නැවතිණි. " හෙන්රි ගැස්කොයින්, අවුරුදු හැට නමයයි මම මුලින්ම ඔහු ගැන බලන්න ඕන."

නොබෝ වේලාවකින් හර්කියුල පොයිරෝ කින්ග්ස් මාවතේ වෛද්‍ය මැක්ඇන්ඩෲගේ ආරෝග්‍ය ශාලාවේ වාඩිවී සිටිනු දක්නට ලැබුණේ ය. වෛද්‍ය මැක්ඇන්ඩෲ තද රතු හිසකේ ඇති උස ස්කොට්ලන්ත ජාතිකයෙකි.

"ගැස්කොයින්. අනේ පව්! ඔහු ජීවත්වෙලා හිටියේ අර අයින් කරලා දාපු අබලන් ගෙවල්වලින් එකක. මම ඔහු ගැන හොයල බලල නෑ. ඒ වුණත් මම දන්නවා ඔහුව. කිරිකාරයා තියල යන කිරිබෝතල් හැම එකම ගේ ඉස්සරහ ගොඩගැහෙන්න ගත්ත නිසා අල්ලපු ගෙදර අය පොලීසියට කෝල් කරලා පොලීසිය ඇවිල්ල දොර කඩල තමයි වෙලා තියෙන දේ දැක්කේ. ඔහු පඩිපෙළෙන් කකුල පැටලිලා ඇදන් වැටිලා බෙල්ල කැඩිල තමයි මැරිලා තියෙන්නේ."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ඔහු ඇඳන් හිටියේ දිග කබායක් නිසා ලේසියෙන්ම කකුල පැටලෙන්න ඇති." වෛද්‍ය මැක්ඇන්ඩ්‍රෑ පැවසුවේ ය. "මට හිතාගන්න පුළුවන් මහත්මයා. ඒක නිකම් හදිසි අනතුරක්" පොයිරෝ පැවසීය.

" ඒක හරි" "ඔහුට නෑදෑයෝ හිටිය ද?" "ඔව්. දොස්තර බෑනා කෙනෙක් ඉන්නවා. ඔහු මාසෙකට එකපාරක් වගේ මාමාව බලන්න එනවා. ඔහුගේ නම ජෝජ් ලොරිමෝර් ඉන්නෙ විම්බල්ඩන්වල." " ඔහු මාමාගේ මරණය ගැන දුක්වුණා ද?" "මෙහෙමයි. ඔහුට මාමා එක්ක සම්බන්ධයක් තිබුණත් ඔහු මාමාව හොඳට දැනන් හිටියේ නැහැ."

" සිරුර හම්බවෙද්දී ඔහු මැරිල කොච්චර වෙලා ගිහින් ද?" " ඒ ගැන කිව්වොත් පැය හතළිස් අටට වැඩියි පැය හැත්තෑ දෙකට අඩුයි. සිරුර හොයාගත්තේ හයවෙනිදා උදේනේ. අපිට මේක වැඩියෙන්ම ලේසි වුණේ සාක්කුවේ තිබිලා හොයාගත්ත ලියුමක් නිසා. ලියුම තැපැල් කරලා තිබුණේ තුන්වැනිදා හවස විම්බල්ඩන්වලින්."

"එදා රෑ ලියුම් බෙදුවේ රෑ නවයයි විස්සට විතරනේ. ඒ කියන්නේ මරණය සිදුවෙලා තියෙන්නේ රෑ නවයයි විස්සෙන් පස්සේ. ඒක ආහාර දිරවල තියෙන ප්‍රමාණයත් එක්ක ගැළපෙනවා. ඔහු මැරෙන්න පැය දෙකකට කලින් ආහාර අරගෙන තියෙනවා. මම සිරුර හයවෙනිදා පරීක්ෂා කරද්දී ඔහු මැරිලා පැය හැටක් විතර ගිහිල්ල තිබුණා. පැය හැටක් ආපස්සට ඒ කියන්නේ තුන්වෙනිදා රෑ දහයට විතර"

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" මට කියන්න ඔහු අන්තිමට පණපිටින් දැක්කේ කවද ද කියලා" පොයිරෝ විමසී ය. "ඔහු තුන්වෙනිදා කින්ග්ස් පාරේ රෑ හතට විතර ඉඳලා තියෙනවා. ඊට පස්සේ රෑ හතහමාරට 'ගැලන්' හෝටලයෙන් රෑ කෑම අරගෙන. ජේන විදියට ඔහු හැම බ්‍රහස්පතින්ද ම එහෙන් රෑ කෑම අරගන්නවා වගෙයි. එක විදියකට බැලුවොත් ඔහුත් කලාකාරයෙක් නේ ද පොයිරෝ මහත්තයා?"

" ඔහුට නෑදෑයෙක්ට හිටියේ මේ බෑණා විතර ද?" පොයිරෝ ඇසීය. "තව නිවුන් සහෝදරයෙක් හිටියා. ඒ වුණත් ඔවුන් දෙන්නා අවුරුදු ගාණකින් එකිනෙකාව හම්බවෙලා නැහැ. මට මතක විදියට නම අන්තෝනි ගැස්කොයින්. ඔහු ගොඩක් සල්ලි තියෙන ගෑණු කෙනෙක්වයි කසාද බැන්දේ. ඊට පස්සේ ඔහු අහංකාර වුණා. සහෝදරයෝ දෙන්නා ඒ ගැන රණ්ඩු වෙලා දැන් මූණ ගැහෙන්නේවත් නැහැ. ඒ වුණත් අමුතුම දේ තමයි ඔවුන් දෙන්නම මැරුණේ එකම දවසේ. අන්තෝනි එදා හවස තුනට නින්දේ දිම මියගිහින් තිබුණා. ඒක පුදුමයි නේ ද?"

"අන්තෝනිගේ බිරිඳ ජීවත්වො ඉන්නව ද?" " නෑ, ඇය මැරුණේ අවුරුදු ගාණකට කලින්." " කොහේ ද ඔහු ජීවත් වුණේ" " කින්ග්ස්ටන් හිල්වල. ලොරිමෝර් මහත්මයා කිවුව විදියට ඔහුත් තනියම ඉන්න කැමති කෙනෙක්" පොයිරෝ කල්පනාබරව හිස වැනූ අතර වෛද්‍යවරයා ඔහු දෙස උනන්දුවෙන් සිටියේ ය.

"ඇත්තෙන්ම ඔබ මොනවද හිතන්නේ පොයිරෝ මහත්මයා, මට නම් තේරුම් ගන්න බැහැ ඔබ මොනවා හිතනව ද කියලා."

https://sinhalatranslationofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ඔබට හිතෙන්නේ නැද් ද මේක හදිසි අනතුරක් නෙවෙයි පොඩි තල්ලුවක් කියලා." පොයිරෝ එසේ පැවසූ විට වෛද්‍යවරයා ඔහු දෙස මවිතයෙන් බැලුවේ ය. " ඒ කිව්වේ මිනීමැරුමක් ඔබට මොනව ද තියෙන සාක්ෂි." " නෑ, නෑ ඒක පොඩි සැකයක් විතරයි." " ඒ වුණත් මොනවහරි දෙයක් තියෙන්න ඕන" පොයිරෝ පිළිතුරක් දුන්නේ නැත.

" ඔබ හිතන්නේ ඔහුගේ බෑණා ගැනනම් ඒක හරියන්නේ නැහැ. මොක ද පරීක්ෂණයේ දී සාක්ෂි ලැබුණු විදියට ඔහු විම්බල්ඩන්වල බ්‍රිජ් සෙල්ලම් කර කරයි ඉඳලා තියෙන්නේ අටහමාරේ ඉඳලා මැදියම වෙනකම්."

" ඒක පැහැදිලියි. පොලීසියේ අය හොයල බලනවා" පොයිරෝ මිමිණීය. " සමහරවිට ඔබට ඇති ඔහුට විරුද්ධව සාක්ෂියක්." "මම ඔහු ගැන දන්නෙවත් නැහැ ඔබ කියනකම්" "ඔබ දැන් කව්රුහරි සැක කරනව ද?" "නැහැ, කොහෙත්ම නැහැ. මේක මේ මනුස්සයෙක්ගෙ නොවරදින පුරුද්දක් ගැන ප්‍රශ්නයක්. ඒක ගොඩක් වැදගත්. ඔබට පේනව ද ගැස්කොයින් මහත්මයාගෙ මරණය ගැළපෙන්නේ නැහැ කියලා"

" ඇත්තෙන්ම මට නම් තේරෙන්නේ නැහැ." වෛද්‍යවරයා පැවසීය. " ප්‍රශ්නේ තමයි මාළු කෑල්ලට උඩින් සෝස් ගොඩක් තියෙනවා." "සර්?" වෛද්‍යවරයා අවුල් වුණු සිතින් ඇමතූ අතර පොයිරෝ සිනාසුණේ ය.

https://sinhalatranslationsdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔබ හිතනවා ඇති මට පිස්සු හැදීගෙන එනවා කියලා *දොස්තර මහත්මයා*. ඇත්තෙන්ම මහත්මයා ඔබ හිතන්න එක මනුස්සයෙක් පුරුද්දක් විදියට එක දෙයක් නොවැරදීම කරනවා. ඒක එකපාරටම වෙනස් වුණොත් ඒක ගැළපෙන්නේ නැහැ. මම හිතනවා ඔබට කරදර කළාට ඔබ මට සමාව දේවි කියලා."

පොයිරෝ සහ වෛද්‍යවරයා එකවරම තම ආසනවලින් නැගිට ගත්තෝ ය. " ඔබට කියන්න මහත්මයා මට නම් තාමත් හිතාගන්න බැහැ ඒක මිනීමැරුමක් වෙන්න පුළුවන් පොඩි ඉඩක්වත්. දෙවියෝ තමයි ඒක දන්නේ.

" ඒක ඇත්තෙන්ම හොඳ දක්ෂයෙක්ගේ වැඩක්." " ඔබ තාමත් හිතන්නේ..." "මම පොඩි අදහසක් හිතේ තියන් ඉන්න මුරණ්ඩු වයසක මනුස්සයෙක්. ඒ වුණත් ඒ අදහසට තාමත් කිසි උදව්වක් නැහැ. කොහොමින් කොහොමහරි ගැස්කොවින් මහත්මයා බොරු දත් ද දාන්නේ?"

" නෑ, ඇත්තෙන්ම ඔහුගේ වයසෙ හැටියට පුදුමයි. ඔහුගේ දත් ගොඩක් හොඳ තත්වෙක තිබුණා." " ඔහු ඒවා හොඳින් බලාගන්නවා ඇති. ඒවා සුදු පාටට හොඳින් මැදලා තිබුණ ද?" " ඔව් , සාමාන්‍යයෙන් නම් දත් මනුස්සයෙක් වයසට යද්දී තරමක් කහ පාටට හැරෙනවා. ඒත් ඔහුගේ දත් ගොඩක් හොඳ තත්වෙකයි තිබුණේ."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" දත් දුර්වර්ණ වෙලා තිබුණෙම නැද් ද?" " මම නම් හිතන්නේ නැහැ ඔහු දුම්වැටි පාවිච්චි කරන කෙනෙක් කියලා." "මම එහෙම දෙයක් නෙවෙයි හිතුවේ. ඒක ගොඩක් දුර ඉඳන් විදපු ර්තලයක්. ඔබට ස්තූතියි මැක් ඇන්ඩෲ මහත්මයා." ඔහු වෛද්‍යවරයාට ආචාර කොට පිටව ගියේ ය.

" ර්ළඟට තමයි වැඩේ පටන් ගන්නේ." ඔහු මිමිණීය. ඉනතුරුව ' ගැලන්' ආපනශාලාවේ පෙරදින බොරිංග්ටන් මහතා සමඟ වාඩිවී සිටි මේසයේම ඔහු අසුන් ගෙන සිටියේ ය. ඔහුට සංග්‍රහ කළ තරුණිය මොලී නොවීය. ඇය පැවසූ පරිදි මොලී නිවාඩු ගොස් තිබුණේ ය.

සේවිකාව සමඟ ගැස්කොයින් මහතා ගැන මාතෘකාවක් පටන් ගැනීම පොයිරෝට අසීරු කාර්යයක් නොවී ය.

" ඇත්තෙන්ම මහත්මයා, ඔහු මෙහේ එනවා අවුරුදු ගාණක ඉඳන්. ඒ වුණත් අපේ ගැහැණු ළමයින් ඔහුගේ නමවත් දන්නේ නැහැ. මම ඔහු ගැන දැනගත්තේ පත්තරේ තිබුණ පින්තූරෙන්. 'මොලී' මම ඇයට කතාකරලා ' මේ අපේ වයසක මනුස්සයා නේ ද?' කියලා ඇහුවා.

"ඔහු මියගිය දවසේ රෑ මෙහෙන් රෑ කෑම ගත්තා නේ ද?" " ඔව්, තුන බ්‍රහස්පතින්දා. ඔහු බ්‍රහස්පතින්දාටයි, අඟහරුවාදාටයි හැමදාම එනවා. ඔහු හරියට එලාම් ඔරලෝසුවක් වගේ. " මම හිතන්නේ ඔබට මතක ඇති ඔහු මොනව ද කෑමට ගත්තේ කියලා."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

“ පොඩ්ඩක් ඉන්න බලන්න, මොලගතන්නි[1] සුප් එකකුයි තව පුඩිමකුයි ඒක එළු මස් ද හරක් මස් ද එළු මස් වෙන්න ඇති. තව බ්ලැක්බෙරියි ඇපල් පයි එකකුයි චීසුයි. ඔහු තරප්පුවෙන් වැටිල මැරුණෙත් එදාම තමයි. ඔහුගේ වැරහැලි වෙච්ච දිග කබායම තමයි ඒකට හේතුව වෙන්න ඇත්තේ. ඔහු කොහොමත් අඳින්නේ වැරහැලි වෙච්ච පරණ කාලේ මෝස්තර තමයි. කොහොම වුණත් ඔහු වැදගත් කෙනෙක්.” එසේ පවසා ඇය ඉවත්ව ගියා ය.

හර්කියුල පොයිරෝ තම කටු රහිත මාළු පෙත්ත සෙමෙන් අනුභව කළ අතර ඔහුගේ දෑස් කොළ පැහැයෙන් බැබළුණි. “ඒක වැරදියි.කොහොම ද මිනිස්සු මේ වගේ දේවල් දකින්නේ නැත්තේ. බොනිංග්ටන් නම් මේකට ආසවේවි.” ඔහු තමාටම කියා ගත්තේ ය. එහෙත්තවමත් ඒ මොහොත නොපැමිනුණි.

යම් පැහැදිලි කිරීමකින් අනතුරුව දිස්ත්‍රික් මරණ පරීක්ෂකවරයා සමඟ ගනුදෙනු කිරීම ඔහුට අපහසු කාර්යයක් නොවී ය. “ අර මැරච්ච මනුස්සයා ගැස්කොයින් ද? අසරණ වයසක තනියම හිටපු මනුස්සයෙක්. ඒ වුණත් ඔහුගේ මරණයට රහස් පරීක්ෂකවරයෙක්ට කරන්න දෙයක් නැහැ. ඒක සාමාන්‍ය එකක්නේ” මරණ පරීක්ෂකවරයා පොයිරෝ දෙස කුතුහලයෙන් බලා සිටි නිසා පොයිරෝ ප්‍රවේශමෙන් තම වචන තෝරා ගත්තේ ය.

1 - ඉන්දියානු සුප් විශේෂයක්.

sinhalaebooks.com

"ඒකෙ පොඩි පොඩි දේවල් ටිකක් තියෙනවා මහත්මය පරීක්ෂණය වෙන අතකට හරවන්න පුළුවන්." " හොඳයි මට කොහොමද ඔබට උදව් කරන්න පුළුවන්?" " ඔබලාට හමුවුණානේ ලියුමක් ගැස්කොයින් මහත්මයාගේ දිග කබායේ සාක්කුවක තිබිලා. මට දැනගන්න ඕන ඒක විනාශ කළා ද කියලා"

" ඔව් ඉතින්" " ඒක ඔහුගේ බෑණා ජෝර්ජ් ලොරිමෝර්ගෙන් නේ ද?" " හරියට හරි, ඒක උදව් වුණා පරීක්ෂණයෙදී මරණය සිදුවෙච්ච වෙලාව දැනගන්න." " ඒක වෛද්‍ය සාක්ෂි එක්කත් ගැළපුණා නේ ද?" " ඇයි නැත්තේ?" " ඒ ලියුම තාම තියෙනවා ද" පිළිතුරක් ලැබෙන තුරු නොඉවසිල්ලෙන් සිටි අතර පරීක්ෂකවරයා එය තිබෙන බව පැවසූ පසු ඔහුගේ මුහුණට සිනහවක් නැගුණි.

ඔහුට එය අවසානයේ දී ලැබුණු අතර ෆවුන්ටන් පෑනකින් ලියන ලද බැඳි අකුරු සහිත එකක් විය. එය පහත පරිදි විය.

ආදරණීය හෙන්රි මාමේ,

මට කියන්න කනගාටුයි අන්තෝනි මාමාගේ ප්‍රශ්නෙදි මට මුකුත් කරන්න පුළුවන් කමක් තිබුණෙ නැහැ. ඔහු පුදුම වුණේ නැහැ ඔබ ඔහු බලන්නට එන්න ද ඇහුව එක ගැන. ඒ වුණත් ඔහු තාමත් ඉන්නේ අර මතේමයි. ඔහු දැන් මරණාසන්නයි සිහිකල්පනාවත් හොඳ නැහැ. මම හිතන්නේ ඔහුට තව වැඩි කල් නැහැ. ඔහුට ඔබ මොනවගේ ද කියල මතකත් නැහැ. ඔබව අසමත් කළාට කණගාටුයි. මම කරන්න පුළුවන් හැමදේ ම කළා.

මීට සදා ලැදි,
ජෝර්ජ් ලොරිමෝර්

https://sinhalatranslationofdetectivestories.blogspot.com

sinhalaebooks.com

ලියුම තුන්වෙනිදා ලිවූ එකක් වූ අතර තැපැල් මුද්‍රාවෙහි හතරහමාර ලෙස සටහන්ව තිබුණේ ය. "හැමදෙයක්ම හොඳට තියෙනවා" ඔහු මිමිණීය. ඔහුගේ ඊළඟ ඉලක්කය කින්ග්ස්ටන් හිල් විය. දැවැන්ත උත්සහයකින් පසු ඔහු මියගිය අන්තෝනි මහතාගේ මුළුතැන්ගෙයි පාලිකාව වූ අමේලියා හිල් මහත්මියත් සමඟ කථා කිරීමට හැකියාව ලැබුවේ ය.

මුල දී ඇය පොයිරෝ දෙස සැකයෙන් බැලුවත් පසුව මේ කුඩා විදේශිකයා හොඳ පුද්ගලයෙක් බව ඇයට සිතුණු පසු ඇය මදක් ලිහිල් බවක් පෙන්වීමට ගත්තා ය. ඉන්පසු ඇය දඅනිත් ගැහැණු අය කරන ආකාරයටම තමාගේ දුක් ගැනවිලි ඔහුට පවසන්න ගත්තා ය.

ඇය අන්තෝනි මහතාගේ මුළුතැන්ගෙයි පාලිකාව ලෙස පැමිණ ඇත්තේ වසර දහහතරකට පෙර ය. එය කිසිසේත් පහසු එකක් වී නොමැති අතර ඇය බොහෝ වෙහෙස වී වුව ද සේවය කර ඇත. ඔහු ලෝබයෙකු බව දැන දැනම ඇය ඔහුට සේවය කර ඇත්තේ පසුව අන්තිම කැමැත්තේ දී ඇයවද සිහිවෙනු ඇතැයි සිතා ය.

නමුත් අවසානයේ ඇයට කිසිවක් ලැබී නැත. ඔහු සියලු දේ තම බිරිඳට ද ඇයගෙන් පසු තම සොහොයුරාට ද ලැබෙන ලෙස 'හිල් මහත්මියට අනුව' අසාධාරණ අන්තිම කැමැත්තක් සකස් කර ඇත. එය අසාධාරණයක් බව පවසා ඇයගේ සිත සනසා පොයිරෝ ඇයව සැනසීය. ඔහු මසුරෙකු බව දන්නා බැවින් හිල් මහත්මිය කණගාටු වී නැත.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ලොරිමෝර් මෙහේ ආවේ ඇයි?" "මම හිතන්නේ ඒ ඔහුගේ සහෝදරයා වෙනුවෙන්. මම හිතන විදියට ඔහුට උවමනා වෙලා තිබුණා සමාදාන වෙන්න. ඔබ දන්නවා ඇති ඔවුන් රණ්ඩු වුණු බව." " ඔව් මම දන්නවා" "අන්තෝනි මහත්මයා ඒක ප්‍රතික්ෂේප කළා ද?" " ඒ වගේ තමයි. ඔහු කිව්ව හෙන්රි මෙච්චර දවසක් හිටියේ නැති එකේ ඉස්සරහටත් ඕනෙ නැතෙයි කියල." නැවතත් හිල් මහත්මිය දුක්ගැනවිල්ල පටන්ගත්තා ය.

බොහෝ අසීරුවෙන් පොයිරෝ ඇයගෙන් ගැලවී ගෙන රාත්‍රී ආහාර ගන්නා වෙලාව සුවී ගෙන යන විට විම්බල්ඩන්හි පිහිටි ලොරිමෝර් මහතාගේ නිවසට ළඟාවිය. වෛද්‍යවරයා එවෙලෙහි රාත්‍රී ආහාරය ගෙන අවසන් කරමින් සිටි අතර පොයිරෝ සේවිකාවකගේ මග පෙන්වීමෙන් ආරෝග්‍යශාලාව වෙත ගියේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

" මම ලෙඩෙක් නෙවෙයි මහත්මයා" "මම මෙහෙට ආවේ එච්චර හරි නැති වැඩක් ගැන අහන්න. කොහොම වුණත් මම වයසක මනුස්සයෙක් මම කැමතියි කෙලින්ම ගනුදෙනුව ගැන කතා කරන්න. මම කොහොමත් ඔය නීතිඥයොයි ඔවුන්ගේ ක්‍රමයි පිළිගන්නේ නැහැ." ඔහු වෛද්‍යවරයාගේ උනන්දුව ඉහළ නැංවීය. ඔහු සාමාන්‍ය උසක් තිබූ රැවුල මුඩු කළ පුද්ගලයෙක් විය.

" නීතිඥයෝ! මම නම් ඔවුන්ට කැමති නැහැ. ඔබ මගේ උනන්දුව වැඩිකරනවා මහත්මයා." පොයිරෝ තම ආගන්තුක පත්‍රයක් ඔහුට ලබා දුන් විට ඔහුගේ ඇහි බැම් ඇකිළිණි. "මගේ ගොඩක් සේවාදායකයෝ ගැහැණු අය" පොයිරෝ සෙමින් පැවසීය.

sinhalaebooks.com

" එහෙම තමයි." වෛද්‍යවරයා මඳ සිනහවකින් යුතුව පැවසීය. "ඔබ කිව්ව විදියටම ගැහැණු අය නීතිඥයොයි පොලීසියයි විශ්වාස කරන්නෙ නෑ. ඔවුන්ට ඕන පුද්ගලික රහස් පරීක්ෂකවරු. ඔවුන්ට ඕන නැහැ තමන්ගේ ප්‍රශ්න ප්‍රසිද්ධ කරන්න. මේ ළඟ දී මගේ ළඟට ආවා ගැහැණු කෙනෙක්. ඇය අසතුටින් ඉන්නේ ඔහුගේ මහත්මයා එක්ක අවුරුදු ගණනකට කලින් රණ්ඩු වුණු එක ගැන. ඒ ඔබේ මාමා ගැස්කොයින්ගේ බිරිඳ."

"මගේ මාමාගේ. වෙන්න බැහැ, ඇය මැරුණේ මීට අවුරුදු ගාණකට කලින්." " නෑ, නෑ අන්තෝනිගේ නෙවෙයි හෙන්රිගේ බිරිඳ" " ඒත් ඔහු බැඳලා නෑනේ." "ඔව් ඉතින්. ඇය ගත්තේ විවාහ සහතිකය විතරයි."පොයිරෝ ලැජ්ජාවකින් තොරව බොරු පැවසුවේ ය.

"මම ඒක විශ්වාස කරන්නේ නැහැ. ඒක බොරුවක්, ඔබ බොරුකාරයෙක්." ලොරිමෝර්ගේ මුහුණ දම් පැහැයට හැරුණි. " ඒක ගොඩක් නරකයි මොක ද ඉතින් එහෙම වුණොත් ඔබ කිසි පලක් නැති මිනීමැරුමක් කළා වෙනවනේ. " මිනීමැරුමක්?" ඔහුගේ දෑස් බියපත් මුවපොව්වෙකුගේ මෙන් විය.

" දැන් බැලුවොත් මම දැක්කා ඔබ ආයෙත් බ්ලැක්බෙරි ජෑම් කනවා. ඒක මෝඩ වැඩක්. බ්ලැක්බෙරි වල ගොඩක් විටමින් තියෙනවා තමයි ඒත් ඒවා සමහර වෙලාවට මාරාන්තික වෙන්නත් පුළුවන්. මේ වෙලාවෙදි නම් ඒවා උදව් කරාවි ඔබේ බෙල්ල වටේ කඹයක් දාන්න ලොරිමෝර්."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔයාට පේනව ද *මගේ යාළුවා*, ඔබට වැරදුණු තැන?" හර්කියුල පොයිරෝ බොනිංග්ටන් මහත්මයාගෙන් ඇසුවේ ය. " හිතේ ප්‍රශ්නෙකින් ඉන්න මනුස්සයෙක් එයා කවදාවත් කරපු නැති දෙයක් කොහෙත්ම කරන්නේ නැහැ. ඔහු හැමදාම කරන දේ තමයි ඉබේම කරන්න හිතදෙන්නේ. හිතේ ප්‍රශ්නෙකින් ඉන්න කෙනෙක් රෑ කෑමට යද්දී ගොඩක් වෙලාවට කරන්නේ පිජාම ඇඳුම පිටින්ම යන එක. හැබැයි ඒ එයාගෙම පිජාමාවෙන් වෙන කෙනෙක්ගේ එකකින් නෙවෙයි."

"උකු සුප් වලටයි, තෙල් පුඩිම්වලටයි, බ්ලැක්බෙරිවලටයි කැමති නැති මනුස්සයෙක් එකපාරටම ඒ තුනම ඇණවුම් කරනවා. ඔබ කිවුවා ඔහු හිතේ ප්‍රශ්නෙකින් ඉන්න නිසා හිතෙන එකක් ඇණවුම් කරන්න ඇති කියලා. ඒත් හිතේ ප්‍රශ්නෙකින් ඉන්න මනුස්සයෙක් කරන්නේ හිතන්නේ නැතිවම නිතරම කන දේ ඇණවුම් කරන එක."

"*හොඳයි*, එහෙනම් දෙන්න පුළුවන් පැහැදිලි කිරීම මොකක් ද? හදිසි අනතුර බොරුවක්. ඒක ගැළපෙන්නේ නැහැ. ඊට පස්සේ ඔයා මට කිව්වා ඔහු අතුරුදහන් කියලා. ඔහු පළවැනි වතාවට අඟහරුවාදායි බ්‍රහස්පතින්දායි ඇවිල්ලා නෑ කියලා. මගේ ඔළුවේ පොඩි අදහසක් තිබුණා. ඒක හරි නම් ඒ මනුස්සයා මැරිලා. ඔහු පේන විදියට මැරිලා තිබුණේ හදිසි අනතුරකින්. වෙන විදියකට කිවුවොත් නරක් වෙච්ච මාළු කැල්ලේ අමුතු රස වහන්න සෝස් ගොඩක් දාලා. "

https://sinhalatranslationofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ඔහු හතට කින්ග්ස් පාරේ පේන්න හිටියා. ඔහු මැරෙන්න පැය දෙකකට කලින් ඒ කිච්චේ හතහමාරට ඔහු 'ගැලන්' එකෙන් රෑ කෑම අරගෙන. ඒක ඔප්පු වෙනවා කෑම දිරවල තිබුණු ප්‍රමාණෙනුයි, ලියුමෙනුයි. තව තවත් සෝස් ඔයාට කීයටවත් මාළුවව පේන්නේ නෑ"

" 'හොඳ' බෑණා ලියුමක් ලියලා. 'හොඳ' බෑණා අනතුර වෙච්ච වෙලාවේ හිටියේ වෙන තැනක. පොඩි අනතුරක් ද? පොඩි මිනීමැරුමක් ද? කවුරුත් කියන්නේ පළවෙනි එක තමයි."

" 'අහිංසක' බෑණා තමයි ඉන්න එකම නෑයා. 'අහිංසක' බෑණාට තමයි මාමාගේ උරුමය. ඒත් මාමා දුප්පත්. එතකොට කොහොම ද බෑණාට සල්ලි ලැබෙන්නේ. ඒ වුණත් සහෝදරයෙක් ඉන්නවා. ඔහු පොහොසත්. ඔයාට පේනව ද වෙන දේ අන්තෝනිගෙන් බිරිඳට, බිරිඳගෙන් හෙන්රිට, හෙන්රිගෙන් ලොරිමෝර්ට"

"ඒක හරි, ඒත් කොහොම ද ඒක කළේ?" බොරිංග්ටන් ඇසුවේ ය. "මෙහෙමයි හෙන්රි මැරුණේ කෑම අරන් පැය දෙකකට පස්සේ. මෙන්න මෙතනින් තමයි පරීක්ෂණය වැරදි පාරට වැටුණේ. මොක ද හෙන්රි මැරුණේ රෑ කෑමෙන් පස්සේ නෙමෙයි දවල් කෑමෙන් පස්සේ නම්. හිතන්න ඔයා ලොරිමෝර් කියලා. ඔයාට කොහොමහරි මේ වෙලේ සල්ලි ඕන."

" අන්තෝනි මැරෙමින් ඉන්නේ. ඔහුගේ සල්ලි හෙන්රිට යනවා. ඒත් හෙන්රි තව අවුරුදු ගණනක් ජීවත් වෙවි."

https://sinhalatranslationfordetectivestories.blogspot.com

sinhalaebooks.com

"කොහොම හරි හෙන්රි අන්තෝනිට මැරුණට පස්සේ ඉක්මනින්ම මැරුණොත් , ඒත් එහෙම නම් ලොරිමෝර්ට ඒ වෙලාවට තමන් වෙන තැනක හිටි බව පෙන්වන්න වෙනවා. සතියේ දවස දෙකක් ඔහු අනිවාර්යයෙන්ම රෑ කෑමට එළියට යන එක ඔහුට වාසියක් වුණා."

" බුද්ධිමත් කෙනෙක් හැටිය ඔහු සැලැස්ම හරියයි ද කියලා බලන්න උත්සහ කළා. ඒ විදියට තමයි ඔහු තමන්ගේ මාමා විදියට සඳුදා රෑ 'ගැලන්' එකේ දී රඟපාලා බැලුවේ. ඒක හරිගියා. හැමෝම හිතුවේ ඔහු හෙන්රියි කියලා. ඔහු ඒකෙන් තෘප්තිමත් වුණා. ඔහුට තිබුණේ අන්තෝනි මැරෙනකම් ඉන්න විතරයි. වෙලාව ආවහම ඔහු තුන්වැනිදා දිනේ විදියට දාලා දෙවෙනිදා ලියුමක් ලිව්වා."

" ඊට පස්සේ ඔහු තුන්වැනිදා දවල් ටවුමට ආවා. හෙන්රි මාමාගේ ගෙදර ගිහින් තරප්පුවෙන් තල්ලු කරල ඔහුව මරල දැම්මා. ඊට පස්සේ ඔහු ලිව්ව ලියුම අරන් මාමාගේ දිග කබායේ සාක්කුවට දැම්මා. ඊට පස්සේ හතට මාමා වගේ ඇඳගෙන එළියට ගිහින් හතහමාරට 'ගැලන්' එකෙන් රෑ කෑම අරගෙන වැසිකිළියකට ගිහින් ඇඳුම් මාරුකරගෙන පුළුවන් තරම් වේගෙන් විම්බල්ඩන් වලට ගිහින් බ්‍රිජ් සෙල්ලම් කරා."

"ඒත් තැපැල් මුද්‍රාව?" බොරිංග්ටන් මහතා විමසුවේ ය. " ඒක නම් ලේසි වැඩක්, ඒක පැල්ලම් ගැහිලයි තිබුණේ. මොක ද ලාම්පු දැල්ලෙන් ඒක නොවැම්බර් දෙකෙන් තුනට වෙනස් කරලයි තිබුණේ. ඒ වුණත් ඒක හෙව්වේ නැත්නම් හම්බවෙන්නේ නැහැ."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"තව කිවුවොත් බ්ලැක්බර්ඩ්ලා ." " බ්ලැක්බර්ඩ්ලා?" "'ගැලන්' එකේ බ්ලැක්බර්ඩ්ලා විසි හතරක් දානවා ජෑම් එකකට. හරියට කිවුවොත් බ්ලැක්බෙරි තමයි ඉතින්. ඔක්කොගෙන්ම පස්සේ ලොරිමෝර් හොඳ නළුවෙකුත් නෙවෙයි. මේක වෙනවා ගොඩක් අපරාධකාරයින්ගෙන්. ඔහු ඔහුගේ මාමා වගේ ඇවිද්දා , ඔහු මාමා වගේ පේන්න ඇඳගත්තා, මාමා වගේ කතා කළා. ඒ වුණත් ඔහුට අමතක වුණා මාමා වගේ කන්න."

"ඔහු ඇණවුම් කළේ ඔහු නිතරම කන ඒවා. බ්ලැක්බෙරිවලින් දත් කහට පාට වෙනවා. ඒත් හෙන්රිගේ දත්වල කහට පාටක් තිබුනේ නැහැ. හෙන්රි එදා රෑ 'ගැලන්' එකෙන් කෑවා නම් ඔහු බ්ලැක්බෙරීත් කන්න ඕන. ඒත් ඔහු ඒවා කාපු බවක් පෙනුනේ නෑ. ලොරිමෝර් මෝඩ වුණා ඉතුරු මේකප් බඩුයි, බොරු රැවුලයි ගෙදර තියාගන්න තරම්. "

"ඔබ එකපාරක් බැලුවා නම් එතන ඇතිතරම් සාක්ෂි තිබුණා. මම ලොරිමෝර්ට කතාකරලා ඔහුව බය කරා. ඒ වෙලෙත් ඔහු බ්ලැක්බෙරි කාලයි හිටියේ. ඒක ඔහුගේ දත්වලින් පෙණුනා. මම හිතන්නේ මම වැරදි නැත්නම් ඔහුගේ කෑදර කම ඔහුව එල්ලුම් ගස් යවාවි." එවෙලෙහි සේවිකාවක් ඔවුන්ට බ්ලැක්බෙරි පානයක් හා ඇපල් පුඩිමක් රැගෙන ආවා ය. " ඒක අතෑරලා දාන්න. කාටවත් අපරාධයක් කරලා පරිස්සම් වෙන්න බෑ. දැන් මට උදව් කරන්න මේ සව් පුඩිම ඉවරකරන්න." බොනිංග්ටන් මහතා පැවසුවේ ය.

නිමි. . .

http://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

02. සොහොන් කොතෙහි ශාපය

" **The Adventure Of The Egyptian Tomb** " ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරන ලද්දේ " **The Egyptian Tomb** " ලෙස *ද ස්කෙච් හි* 1923 සැප්තැම්බර් 26 කලාපයේ දී ය.

I

ඊජිප්තු රජෙකු වන මෙන්-හ-රා රජුගේ සොහොන් කොත විවෘත කිරීමත් සමඟ සිදුවූ අද්භූත මරණ දාමය පිළිබඳ පරීක්ෂණය පොයිරෝ සහ මා විසින් පරීක්ෂණ කටයුතු කරන ලද ත්‍රාසජනකම හා අනපේක්ෂිතම පරීක්ෂණ වලින් එකක් බව මගේ මතකයේ රැඳී ඇත. එකල කැනවොන් සාමිවරයා, ශ්‍රීමත් ජෝන් විලාර්ඩ් සහ නිව්යෝර්ක්හි බ්ලීබ්නර් මහතා තූතන්කාමන් රජුගේ සොහොන සොයාගැනීමට කයිරෝවට නුදුරින් ගීසාහි පිරමීඩ පිහිටි ප්‍රදේශයේ කළ කැණීම් කටයුතු අසිරු අඩියකට ඇද හෙළමින් අනපේක්ෂිත ලෙස මරණ දාමයක් සිදුවිය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

එසේ වුව ද ඔවුන්ගේ ගවේෂණය නිසා ඊජිප්තු රාජ්‍යත්වය පිරිහීමට ලක් වූ කාලයේ රාජ වංශය වුණු අටවන රාජ වංශයේ රජකු වන මෙන්-හ-රා රජුගේ සොහොන් ගෙය විය හැකි සොහොන් කොතක් සොයාගනු ලැබුණි. ස්වල්ප දෙනෙක් පමණක් මේ කාලයේදී මේ ගැන දැන සිටිය ද පසු කලෙක ගවේෂණය ගැන වාර්තාවලින් පුවත්පත්වල පිටු ගණන් පිරුණි .

sinhalaebooks.com

ඒ කාලයෙහි සිදුවූ එක්තරා සිදුවීමක් මහජනයාගේ මනසෙහි මුල් බැස ගත්තේ ය.ඒ, ශ්‍රීමත් ජෝන් විලාර්ඩ් හෘදය අක්‍රිය වීමෙන් මිය යාමයි. විවිධ රැළි ඇතිකිරීමට වඩාත් දක්ෂකම් දැක්වූ පුවත්පත් වහාම පැරණි ඊජිප්තු නිධාන සමඟ පවතින ශාප වැනි මිථ්‍යා මත පුවත්පත්වල පළ කිරීමට පටන් ගත්තේ ය.

බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ අවාසනාවන්ත යැයි සැලකුණු මමීන් සම්පූර්ණයෙන්ම ප්‍රදර්ශන කුටි වලින් ඉවත් කෙරුණේ මේ ශාප පිළිබඳ මතය හේතුවෙනි. එහෙත් එහි ජනප්‍රියත්වය එසේ ම විය. ඉන් දෙසතියකට පසු බ්ලීබ්නර් මහතා දරුණු රුධිර විෂවීමකින් මිය ගිය අතර ඊටත් දින කිහිපයකට පසු ඔහුගේ ඥාති පුත්‍රයෙකු නිව්යෝර්ක්හි දී වෙඩි තබාගෙන මිය ගියේ ය.

ඒත් සමඟම "මෙන්-හ-රා රජුගේ ශාපය" යනු දවසේ ප්‍රවෘත්තිය විය. පැරණි ඊජිප්තුවේ මරණීය ශාප පිළිබඳ විශ්වාස එහි උච්චතම අවස්ථාවට ප්‍රාප්ත විය. මියගිය පුරාවිද්‍යාඥයාගේ බිරිඳ වන විලාර්ඩ් ආර්යාවගෙන් පොයිරෝට කෙටි සටහනක් ලැබුණේ එවිට ය. කෙන්සිංටන් චතුරස්‍රයේ පිහිටි ඇගේ නිවසට පැමිණෙන ලෙස එහි ලියා තිබුණේ ය. මම ද ඔහු සමඟ එම ගමනට සහභාගී වුණෙමි.

විලාර්ඩ් ආර්යාව උස සිහින් කාන්තාවකි. ඇගේ නිදි නැතිවීමෙන් වැහැරී ගිය මුහුණ ඇගේ ශෝකයට සාක්ෂ්‍ය සැපයුවේ ය. "පොයිරෝ මහත්තයා, ඔබ මෙතරම් ඉක්මණින් ආපු එකට මම ගෞරව කරනවා."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔබේ සේවයට, විලාර්ඩ් මැතිණිය. ඔබතුමිය මගෙන් උපදෙස් ගන්න කැමතිද?" "මම දන්නවා, ඔබ රහස් පරීක්ෂකයෙක්, මම ඔබෙන් උපදෙස් ඕන රහස් පරීක්ෂකයෙක් විදියටමත් නෙවයි. ඔබට නිවැරදි දැක්මක් තියෙනවා, මම දන්නවා, ඔබට පරිකල්පනය කියන දේ තියෙනවා, ඔබට ලෝකය ගැන අත්දැකීම් තියෙනවා; මට කියන්න, පොයිරෝ මහත්තයා, අද්භූත දේ ගැන ඔබේ අදහස මොකක් ද?"

පිළිතුරු දීමට පෙර පොයිරෝ මොහොතකට පසුබට විය. ඔහු සිතන බවක් පෙනෙන්නට තිබුණි. අවසානයේ ඔහු මෙසේ පැවසීය. "අපි එකිනෙකා වරදවා තේරුම් ගන්නේ නැතිව ඉන්න බලමු, විලාර්ඩ් ආර්යාව. ඔබතුමිය මගෙන් මෙතන දී ඇහුවේ සාමාන්‍ය ප්‍රශ්නයක් නෙවෙයි. ඒකට ඔබේ පෞද්ගලික දෙයක් සම්බන්ධයි. එහෙම නෙවේ ද? ඔබ මේ අහන්න හදන්නේ ඔබේ ස්වාමිපුරුෂයාගේ මරණය ගැන නේ ද?"

"ඔව්" ඇය පිළිගත්තා ය. "ඔහුගේ මරණය ගැන මට කියලා පරීක්ෂණයක් කරන්න ඔබට ඕන ද?" "මට ඕන පත්තරවල තියෙන දේවල්වල හරි වැරැද්ද හොයලා බලන්න. මරණ තුනක්- පොයිරෝ මහත්මයා ඒවා තනි තනියෙන් ගත්තොත් පැහැදිලි කරන්න පුළුවන් ඒත් ඔක්කොම එකට ගත්තාම එතන තියෙන්නේ විශ්වාස කරන්න බැරි මරණ ගොඩක්. ඔක්කොම වෙලා තියෙන්නේ සොහොන් ගෙය ඇරලා මාසයක් ඇතුළත ඒක නිකන්ම මිථ්‍යාවක් වෙන්න පුළුවන්, ඒක අතීතයේ ඉඳන් එන දැන් තියෙන විද්‍යාවෙන් හිතාගන්නත් බැරි තරම් බලගතු ශාපයක් වෙන්නත් පුළුවන්."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ඇත්ත තාමත් දන්නේ නැහැ- මරණ තුනක්! මට බයයි, පොයිරෝ මහත්තයා, ඒක තාමත් ඉවර නොවෙන්න පුළුවන්. " " ඔබතුමිය භය වෙන්නේ මොකක් ගැන ද?" "මගේ පුතා ගැන. මගේ ස්වාමිපුරුෂයාගේ මරණය ගැන ආරංචි වෙද්දී මම අසනීපෙන් හිටියේ. මගේ පුතා, ඔහු ඔක්ස්ෆර්ඩ් වලින් පිටවුණා විතරයි. පුතා තමයි එහේ ගිහින් සිරුර ගෙනාවේ, ඒත් දැන් ඔහු මම ආයාචනා කරද්දීත් ආයෙත් එහේ ගියා.

දැන් පුතා තාත්තාගේ කැණීම් දිගටම කරන් යන්නයි හදන්නේ. ඔබ හිතාවි මම හැමදේටම කලබල වෙන මෝඩ ගෑණු කෙනෙක් කියලා, ඒත් පොයිරෝ මහත්තයා, මට බය. මියගිය රජුගේ ආත්මය තවම සන්සුන් වෙලා නැත්නම්? සමහරවිට ඔබට පේනවා ඇති මම විකාර කියවනවා වගේ. " "නැහැ, ඇත්තෙන්ම විලාර්ඩ් ආර්යාව," පොයිරෝ ඉක්මනින් පැවසීය. "මමත් අද්භූත දේවල්වල බලය විශ්වාස කරනවා. මම දන්න බලගතුම බලවේගවලින් එකක් තමයි අද්භූත බලවේග"

මම පුදුමයෙන් ඔහු දෙස බැලුවෙමි. මම කවදාවත් පොයිරෝ මිථ්‍යා විශ්වාස අදහනු දැක නැත. ඒත් කුඩා මිනිසා පැහැදිලිවම උනන්දුවෙන් සිටියේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

“ඔබ ඇත්තටම කියන්නේ මට ඔබතුමියගේ පුතාව ආරක්ෂා කරන්න කියල ද? ඔහුව හානියක් නොවී බේරගන්න පුළුවන් උපරිමය කරන්නම්.”“ඔව්, ඇත්තෙන්ම ඒත් දුෂ්ට බලවේගයකට විරුද්ධව සටන් කරන්න ඔබට පුළුවන් ද?”

“මධ්‍යකාලීන යුගයේ පොත්වලින් දුෂ්ට මායාවන් නිෂ්ඵල කරන්න පුළුවන් ක්‍රම හොයාගන්න පුළුවන්, විලාර්ඩ් ආර්යාව. සමහරවිට මේ නවීන විද්‍යාව දන්න ඔක්කොම දේවල්වලට වඩා දේවල් ඒවල තියෙනවා. දැන් අපි කාරණාවලට එමු අපිට පුළුවන් වේවි ඒවලින් මොකක්හරි දෙයක් හොයාගන්න. ඔබේ ස්වාමිපුරුෂයා ඊජිප්තු පුරාවිද්‍යාඥයෙක් විදියට සලකන කෙනෙක් නේ ද? ”

“ඔව්, ඔහුගේ තරුණ කාලේ ඉඳන්. ඔහු දැන් ජීවත් වෙන හොඳම විශේෂඥයෙක්. ” “බ්ලීබ්නර් මහත්මයා, ආධුනිකයෙක් ද ඊට වඩා වැඩි කෙනෙක් ද?” “ඔහ්, ටිකක් විතර. ඔහු ලොකු සල්ලි කාරයෙක් ඒහු ඔහු කැමති ඕනම දෙයක් ඔහුට හිතුණු ගමන් කරනවා. මගේ ස්වාමිපුරුෂයා ඔහුට ඊජිප්තු පුරාවිද්‍යාව ගැන උනන්දුවක් ඇති කළා මොක ද ගවේෂණ කටයුතු වලට ඔහුගේ මුදල් ගොඩක් වැදගත්. ”

“ එතකොට බැණා? ඔහුගේ රුචි අරුචිකම් ගැන ඔබතුමිය දන්නේ මොනව ද? ඔහු මේ සමාගමයේ හිටිය ද? ”

sinhalaebooks.com

“ මම එහෙම හිතන්නේ නැහැ. ඇත්තෙන්ම මම ඔහුගේ මරණය ගැන පුවත්පතේ කියවනකන්ම ඔහුගේ චරිතය ගැන දැනගෙන හිටියේ නැහැ. මම හිතන්නේ නැහැ ඔහුයි බ්ලීබ්නර් මහත්මයායි සමීප සම්බන්ධයක් පැවැත්තුවයි කියලා. ඔහු කවදාවත් යාළුකම් ගැන කථා කළේ නැහැ. ”

“පිරිසේ අනෙක් අය කවුද? ” “හොඳයි, එක්කෙනෙක් ආචාර්ය ටොස්විල් ඔහු බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සුළු නිලධාරියෙක්; නිව් යෝර්ක්වල මෙට්‍රොපොලිටන් කෞතුකාගාරයේ ෂ්නයිඩර් මහත්මයා; තව තරුණ ඇමරිකානු ලේකම් කෙනෙක් හිටියා. ඊළඟට ආචාර්ය ආමෙස් ඔහු මහත්තයගේ ගවේෂණ ගොඩකට සහභාගී වෙලා තියෙනවා; මගේ මහත්තයාගේ කළු ජාතික සේවකයා හසන්. ” ඇමරිකානු ලේකම්ගේ නම ඔබතුමියට මතකද? ”

“හාපර්, මම හිතන්නේ,ඒත් මට හරියටම කියන්න බැහැ. ඔහු බ්ලීබ්නර් මහත්මයා එක්ක වැඩි කාලයක් හිටියේ නැහැ. ඔහු හරිම ප්‍රසන්න තරුණ කෙනෙක්. ” "ස්තූතියි, විලාර්ඩ් ආර්යාව." “තව තියෙනවම් අහන්න” “මේ වෙලාවෙනම් තව මුකුත් නැහැ. දැන් ඒක මට භාර දෙන්න,මම ඔබතුමියගේ පුතාව බේරගන්න පුළුවන් ඔක්කොම කරන බවට සහතික වෙන්නම්. ”

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

ඒවා කිසිසේත් සැනසිලිදායක වචන නොවන අතර, ඔහු ඒවා පවසා අවසන් වූ විට විට විලාර්ඩ් ආර්යාවගේ මුහුණ බයින් හැකිළෙනු මම දුටුවෙමි. ඒ අතරම, ඔහු ඇයගේ බිය අවඥාවෙන් බැහැර නොකරන බව ද මම දුටුවෙමි.මගේ පැත්තෙන් බැලූ කළ පොයිරෝ මෙතරම් තදින් මිථ්‍යා විශ්වාස විශ්වාස කරතැයි මා කිසිදාක සැක කළේ නැත. මම නවාතැනට ගිය පසු මේ ගැන පොයිරෝගෙන් ඇසුවෙමි. ඔහු අවංකවම හා බැරෑරුම්ව පැවසුවේ,

"ඔව්, හේස්ටිංග්ස්. මම මේ දේවල් විශ්වාස කරනවා. ඔයා මිථ්‍යා විශ්වාසවල බලය අවතක්සේරු කරන්න එපා." "දැන් අපි මොකක් ද කරන්නේ?"
"*තවම හිතනවා,* හොඳ හේස්ටිංග්ස්! *හොදයි,* අපි නිව්යෝර්ක්වලට කේබල් පණිවිඩයක් යවමු තරුණ බ්ලීබ්නර් මහත්මයාගේ මරණේ සම්පූර්ණ විස්තරයක් ඉල්ලලා. " ඔහු කේබල් පණිවිඩය පිටත් කර හැරියේ ය. පිළිතුරු පණිවිඩය සම්පූර්ණ හා නිර්වද්‍ය එකක් විය.

රූපට් බ්ලීබ්නර් තරුණ කාලයේ මුහුදු වෙරළ ආශ්‍රිතව දිවි ගෙවා ඇත. ඔහු දක්ෂිණ සාගරයේ දූපත් කිහිපයක රස්සාවක් නොකරන වෙරළ ආශ්‍රිත සංක්‍රමණිකයෙකු එසේත් නැත්නම් සරණාගතයෙකු ලෙස ජීවත් වෙමින් සිට අවුරුදු දෙකකට ඉහත දී ඔහු නැවත අධික වශයෙන් ණයවී සිටි නිව්යෝර්ක් වෙත පැමිණ ඇත. මගේ මනසට වැඩි වශයෙන් දැනුණු දේ වන්නේ ඔහු මෑතක දී ඊජිප්තුවට යාමට සෑහෙන තරම් අවශ්‍ය මුදල් සපයාගත්තේ කෙසේ ද යන්නයි.ඔහු පවසා ඇත්තේ ඔහුට හොඳ යහළුවෙකු සිටින බැවින් එය ප්‍රශ්නයක් නොවන බවයි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

කෙසේ වුව ද ඔහුගේ සැලසුම් වැරදුණේ ය. ඔහු ආපසු නිව්යෝර්ක් පැමිණ ඇත්තේ පරණ මිය ගිය රජවරුන්ගේ ඇටකටු තමන්ගේ මස් මාංශවලටත් වඩා ප්‍රවේශම් කරන මාමා කෙනෙකුට ශාප කරමිනි. ඔහු ඊජිප්තුවේ සිටින විට ශ්‍රීමත් ජෝන් විලාඩ්ගේ මරණය සිදුවී ඇත.

රූපට් නැවත වරක් ඔහුගේ නිව්යෝර්හි ණයකාර ජීවිතයට ඇද වැටුණේ ය. අවසානයේ දී කුතුහලය දනවන වාක්‍ය ඛණ්ඩ කිහිපයක් අඩංගු ලිපියක් ලියා තබා ඔහු සිය දිවි හානි කරගෙන ඇත. එය හදිසි ආවේගයකින් ලියා තිබෙන බවක් පෙණුනි. ඔහු ලාදුරු රෝගියෙකු බවත් නෙරපා හරින ලද අයෙකු ලෙස තමාටම පවසාගෙන තිබූ අතර, ලිපිය අවසන් වී තිබුණේ ඔහුගේ මරණය හොඳ එකක් බවයි. දිගු කලකට පෙර මියගිය ඊජිප්තු රජවරුන්ගේ පළිගැනීම් ගැන මම කිසි විටෙකත් විශ්වාස නොකළෙමි.

මෙයට වඩාත් සුදුසු කාලීන විසඳුමක් මගේ මනසට ආවේ ය . මෙම තරුණයා තම මාමා මරා දැමීමට අදහස් කර ඇත්නම්! (වස වලින් විය යුතු ය). වැරදීමකින් ශ්‍රීමත් ජෝන් විලාර්ඩ් මාරාන්තික මාත්‍රාව ගත්තේ නම් එම තරුණයා නැවත නිව්යෝර්ක් වෙත පැමිණි පසු ඔහු අතින් සිදුවුණ අපරාධය ගැන දැනගෙන පසුතැවිල්ලෙන් වෙඩි තබාගෙන මියයාමට හැකියාවක් තිබේ.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මම පොයිරෝට මගේ විසඳුම ගෙනහැර දැක්වූවෙමි. ඔහු ඒ ගැන උනන්දු විය. "ඔයා හිතපු දේත් වෙන්න පුළුවන්. ඒත් ඔයා සොහොනේ ශාපය ගැන හිතලා නැහැ " මම මගේ උරහිස් ගසා දැමුවෙමි. "ඔයා තාමත් හිතන්නේ ඒකයි මේකයි අතර සම්බන්ධයක් තියෙනවා කියල ද?" "මොන තරම් ද, *මගේ යාළුවා,* අපි හෙට ඊජිප්තුවට යමු."

"මොකක්?" මම පුදුමයෙන් කෑ ගැසුවෙමි. "මම ඒක කිව්වා." වීරත්වයක් පොයිරෝගේ මුහුණ පුරා පැතිර ගියේය. ඉන්පසු ඔහු කෙඳිරිගෑවේ ය. "ඒත්, මුහුද! භයානක මුහුද! "

II

ඉන් සතියකට පසු අපේ පා යට තිබුණේ කාන්තාරයේ රන්වන් වැලි ය. අප හිසට ඉහළින් චණ්ඩ සූර්යයා බැස යමින් තිබුණි. පොයිරෝගේ මැලවී ගිය මුහුණින් යුතුව මගේ අසලින් සිටියේ ය. කුඩා මිනිසා හොඳ සංචාරකයෙකු නොවීය. අපි මාර්සෙයිල්ස්වලින් ආරම්භ කළ දින හතරක ගමන ඔහුට මුහුදු අසනීපය ගෙන දුන්නේ ය. ඔහු ඇලෙක්සැන්ඩ්‍රියාවට ගොඩ බසින විට ඔහුගේ පිළිවෙළ පවා ඔහු හැරගොස් තිබුණි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

අපි කයිරෝවට පැමිණීමෙන් පසුව අප පළමුවෙන්ම ගියේ මහා පිරමීඩයන්ට දකුණින් පිහිටි මේනා හවුස් හෝටලයට ය. ඊජිප්තුවේ චමත්කාරය මගේ සිතට දැනුණි. එහෙත් පොයිරෝට එසේ නොවීය. ලන්ඩනයේ මෙන් රාජකාරීමය ඇඳ පැළඳගෙන සිටි ඔහු ඉනතුරුව සාක්කුවෙන් කුඩා බුරුසුවක් රැගෙන ඇඳුම්වලට කා වැදී ඇති දූවිල්ලට එරෙහිව නොනවතින යුද්ධයක් කරමින් "මගේ බූට් සපත්තු" යැයි දුක්බරව පැවසුවේ ය.

"බලන්න හේස්ටිංග්ස්. මගේ බූට්ස්, ඒවා හොඳ පොලිෂ් ලෙදර් බූට් ඒවා ඇතුළට වැලි ගිහින් හරි වේදනයි. මගේ ඇසුත් වැලි ගිහින් දනවා. ඒ විතරක් නෙවෙයි රස්නෙට මගේ යට රැවුලත් පණ නැතිව ගිහින්. "ස්පින්ක්ස් දිහා බලන්න" කියා මම ඉල්ලා සිටියෙමි.

" ඒවල ලස්සනයි අද්භූත ගතියයි දැනෙනව ද?" පොයිරෝ ඒ දෙස බැලුවේ අතෘප්තියෙනි. " හුළඟ ගැන නම් ඒවා සතුටු වෙන්නේ නැතුව ඇති." "ඒවාට මෙච්චර අපිරිසිදු විදියට වැලිවලින් බාගෙට බාගයක් වැහිලා යන්න ඉඩ දුන්නේ ඇයි? අහ්, මේ කරදරකාර වැලි! "

"එන්න, දැන්, බෙල්ජියමේත් වැලි ගොඩක් තියෙනවා," "බ්‍රසල්ස්වල නෙවෙයි" කියා පොයිරෝ පැවසුවේ ය. ඔහු පිරමීඩ දෙස කල්පනාකාරීව බැලීය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ඒවල ඇත්තටම ත්‍රිමාන පෙනුමකුයි ජ්‍යාමිතික හැඩයකුයි තියෙනවා. ඒත් ඒවල මතුපිට වළ ගොඩැලි තියෙනවා එහෙම වුණාම අප්‍රියජනකයි.මම තල් ගස්වලට කැමතිත් නැහැ. අඩුම තරමේ ඒවා පේළියට හිටවලාවත් නැහැ!"

අප විවේක නිකේතනයකට යන බව පවසා මම ඔහුගේ දුක් ගැනවිල්ල නැවැත්වුවෙමි. අපිට එතනට යාම සඳහා ඔටුවන් භාවිත කිරීමට තිබුණු අතර අප පිටට නගින තෙක් තිරිසනුන් අරාබි බස කථා කරන තෝල්කයන්ගේ පාලනය යටතේ දණ ගසාගෙන ඉවසිලිවන්තව සිටියෝ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

මම ඔටුවෙකු පිට යමුදැයි පොයිරෝගෙන් ඇසුවෙමි. ඔහු කෙඳිරිය හා විලාපය නැවත පටන්ගත් අතර එය අවසන් වූයේ කන්‍යා මරියතුමිය සහ දින දර්ශනයේ සිටින සෑම සාන්තුවරයෙක්ටම තම යාඥා හා දුක් ගැනිවිලි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය. අවසානයේ ඔහු අවමන් සහගතව කුරු බූරුවෙකු පිට නැගී ගමන අවසන් කළේ ය. ඔටුවෙකු පිට යාම ආධුනිකයෙකුට අසීරු කටයුත්තක් බව මට තේරුම් ගැනීමට හැකිවිය.

මට දින කිහිපයක්ම ඒ වෙහෙස දැනුණේ ය. අවසානයේ අප කැණීම් කටයුතු කරන ස්ථානයට පැමිණියෙමු. පැසුණු රැවුලක් සහිත අවුවට පිළිස්සුණු සමක් සහිත මිනිසෙක් අප හමුවට පැමිණියේ ය. ඔහු සුදු පැහැති ඇඳුම් කට්ටලයකින් සැරසී හෙල්මටයක් දමාගෙන සිටියේ ය.

sinhalaebooks.com

“පොයිරෝ මහත්මයා සහ කැප්ටන් හේස්ටිංග්ස් නේ ද? අපිට පොයිරෝ මහත්මයාගේ කේබල් පණිවිඩය ලැබුණා. මට කණගාටුයි කයිරෝවලදී ඔබව හමුවෙන්න කවුරුවත් හිටියේ නැති එක ගැන. අපේ සැලසුම් ඔක්කොම එක අවාසනාවන්ත සිද්ධියක් නිසා වෙනස් වුණානේ.” පොයිරෝ සුදුමැලි වුණු අතර ඔහුගේ ඇඳුම් පිසදමමින් සිටි අත එක්වරම තම කාර්යය අත් හැරියේ ය.

“තව මරණයක් නෙවේ නේ ද?” ඔහු සුසුමක් හෙළුවේ ය. "ඔව්." “සර් ගයි විලාර්ඩ් ද?” මම ඇසුවෙමි.“ නැහැ, කැප්ටන් හේස්ටිංග්ස්. මගේ ඇමරිකානු සගයා ෂ්නයිඩර් මහත්මයා. ” “මොකකින් ද?” පොයිරෝ ඇසුවේ ය. “පිටගැස්මෙන්.” මම සුදුමැලි වී ගියෙමි. මට අවට තිබෙන සෑම දෙයක්ම නපුරු බලවේග බවට දැනෙන්නට විය.

භයානක සිතුවිලි මගේ මනසට ඇතුළු වී පැතිර ගියේ ය. ඊළඟට මම වුණොත්? පොයිරෝ ඉතා පහත් හඬින් පැවසුවේ: “*මම මැරෙනවා,* මට මේක තේරෙන්නේ නැහැ. ඒක භයානකයි. මට කියන්න, මහත්මයා, ඒ පිටගැස්මෙන් බවට කිසිම සැකයක් නැහැ නේ ද? ”

“මම නම් විශ්වාස කරන්නේ නැහැ. ඒත් වෛද්‍යවරයා මට වඩා හොදට ඔබට කියාවි. ” “ආහ්, ඇත්තෙන්ම ඔබ වෛද්‍යවරයා නෙවේ.” “මගේ නම ටොස්විල්.” එවකට මේ බ්‍රිතාන්‍ය විශේෂඥයා විලාර්ඩ් ආර්යාව බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සුළු නිලධාරියෙකු ලෙස විස්තර කරන ලදී.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

ඔහු ගැන එකවරම බරපතළ යමක් මගේ මනසට ආවේ ය. "ඔබ මා එක්ක එනවනම් මම ඔබව සර් ගයි විලාඩ් ගාවට අරන් යන්නම්," වෛද්‍ය ටොස්විල් තවදුරටත් පැවසීය.

"ඔබ ආ ගමන් දැනුම් දෙන්න කියලා ඔහු කිව්වා. " අපව කඳවුර හරහා විශාල කූඩාරමකට රැගෙන ගිය අතර එයට ඇතුළු වුණ පසු එහි ඇතුළත තිදෙනෙකු වාඩිවී සිටිනවා අපි දුටුවෙමු. "පොයිරෝ මහත්මයා හා කැප්ටන් හේස්ටිංග්ස් ඇවිල්ලා" යැයි ටොස්විල් මහතා පැවසුවේ ය. මිනිසුන් තිදෙනාගෙන් බාලයා වහා නැගිට අපට ආචාර කිරීමට ඉදිරියට පැමිණියේ ය.

ඔහුගේ ඉක්මන් බව හේතුවෙන් මට ඔහුගේ මව මතක් වුණි. ඔහු අන් අය තරම් අව්වට පිළිස්සී නොතිබුණ ද ඇස් වටා නිදි නොමැති වීමෙන් සෑදුණු ලප දක්නට ලැබුණේ ය. ඔහු වයස අවුරුදු විසි දෙකක් පමණ වයසැති පුද්ගලයෙකි. ඔහු පැහැදිලිවම තමාගේ මානසික පීඩාවන් යටපත් කර ගැනීමට අරගලයක යෙදෙන බවක් දක්නට ලැබුණේ ය. ඔහු පළමුවෙන්ම තම සගයෙකු වන තැනින් තැන හිස කෙස් ද පැසී ඇති තිස්හැවිරිදි වෛද්‍ය අමෙස්ව හඳුන්වා දුන්නේ ය.

තරුණ සිහින් ලේකම්වරයා සත්ත්ව අනින් රාමු කළ උපැස් යුගළක් පැළඳගෙන සිටියේ ය. කෙටි සංවාදයකින් පසු සර් ගයි විලාඩ් හා වෛද්‍ය ආමෙස් අප සමඟ තනි කර අනිත් දෙදෙනා ඉවතට ගියේ ය. " ඔබට තියෙන ප්‍රශ්නයක් අහන්න, පොයිරෝ මහත්තයා," සර් ගයි විලාර්ඩ් පැවසීය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"අපි මේ අවාසනාවන්ත සිද්ධි නිසා ලොකු ප්‍රශ්නෙකට මුහුණ දීලයි ඉන්නේ. ඒත් ඒක වෙන්න බැහැ - ඒක හැම එකක්ම අහම්බයක් වෙන්න බැහැ. " ඔහුගේ පුරුදු නොසන්සුන් බව නිසාම ඔහුට වචන පැටළුනේ ය. පොයිරෝ ඔහුව උනන්දුවෙන් අධ්‍යනය කරනු මම දුටුවෙමි.

"සර් ගයි? ඔබ තවමත් මේ වැඩ කරගෙන යනව ද?" "ඇත්තෙන්ම, මොනවා සිද්ධ වුණත් කවුරු ආවත් ඒකෙ වැඩ කරගෙන යනවා " පොයිරෝ අනෙකාගේ දෙසට හැරුණේ ය."*ඩොක්ටර්*, ඔබට මේ ගැන මොනව දකියන්න තියෙන්නේ? "

"හොඳයි, මම ඉල්ලා අස්වෙන්නේ නැහැ" කියා වෛද්‍යවරයා කතාව ඇරඹුවේ ය. පොයිරෝ ඔහුගේ විරිත්තීම්වලින් එකක් ප්‍රදර්ශනය කළේ ය. "එහෙම නම්, අපිට දැන් ඕන සාක්ෂි. ෂ්නයිඩර් මහතාගේ මරණය වුණේ කවදා ද? " "දවස් තුනකට කලින්." " ඔබට විශ්වාසද ඒ පිටගැස්මමයි කියලා? " "අනිවාර්යයෙන්ම." "නිකමට වගේ බලමු, ඒ ස්ට්‍රිච්නීන් නෙවෙයි ද? "

"නෑ, පොයිරෝ මහත්තයා, මට තේරෙනවා ඔබ මොකක් ද අදහස් කරන්නේ කියලා. ඒත් ඒ පිටගැස්ම කියලා මට පැහැදිලියි. " "ඔබ ප්‍රති එන්නත එන්නත් කළේ නැද්ද?" "ඇත්තෙන්ම අපි කළා" කියා වෛද්‍යවරයා පැවසුවා. " අපි කරන්න පුළුවන් හැම දෙයක්ම කළා."

sinhalaebooks.com

"ඔබ ළඟ ප්‍රති එන්නත තිබුණද?" "නැහැ. අපි ඒක කයිරෝවෙන් ගෙන්න ගත්තා " "කඳවුරේ තව කාටහරි පිටගැස්ම හැදිලා තියෙනව ද ? " "එකක්වත් නැහැ." බ්ලීබ්නර් මහත්මයා මැරුණේ පිටගැස්මෙන් නෙවෙයි කියලා ඔබට විස්වාස ද? "

"නිසැකවම. ඔහුගේ මාපටැඟිල්ලේ තිබුණ සීරීමෙන් තමයි ලේ විස වීම පටන් අරන් තියෙන්නේ. මම කියන්නේ කාරණ දෙක එකිනෙකට වෙනස්. " "දැන් අපට මරණ හතරක් තියෙනවා.ඒවා එකක්වත් එකිනෙකට සමාන නැහැ, එකක් හෘද අක්‍රීය වීමක් තව ලේ විසවීමක්, සිය දිවි නසාගැනීමක්, අනෙක පිටගැස්මෙන්. "

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

"හරියටම හරි, පොයිරෝ මහත්තයා." "මරණ හතර එකට සම්බන්ධ කරන්න පුළුවන් මොකක්වත්ම නැත් ද? " " මට තාම ඔබව තේරුණේ නැහැ පොයිරෝ මහත්මයා? " " මම එය පැහැදිලිව ඉදිරිපත් කරමි. " මම කියන්න හදන්නේ මැරුනු අය හතර දෙනා මැරුනේ මෙන්-හ-රා රජුගේ ආත්මයට අගෞරව කරපු නිසා ද?" වෛද්‍යවරයා පොයිරෝ දෙස පුදුමයෙන් බලා සිටියේ ය.

"ඔයා කතා කරන්නේ හිතන්නේ නැතිව, පොයිරෝ මහත්තයා. ඇත්තෙන්ම ඔබ ඒ මෝඩ කටකතාව විශ්වාස කරන්නේ නැහැ නේ ද? " "විකාර" විලාඩ් කෝපයෙන් කතා කළේ ය. පොයිරෝ සන්සුන් ලෙස සිටි අතර ඔහුගේ කොළ පැහැති ඇස් දිදුළනු මා දුටුවෙමි. "ඉතින් ඔබ ඒක විශ්වාස කරන්නේ නැහැ, නේ ද *ඩොක්ටර්?* "

sinhalaebooks.com

"නැහැ මම විශ්වාස කරන්නේ නැහැ" කියා වෛද්‍යවරයා ස්ථිරව ප්‍රකාශ කළේ ය. "මම විද්‍යානුකූල මිනිහෙක්, මම විශ්වාස කරන්නේ විද්‍යාවෙන් ඔප්පු කරපු දේ විතරයි." "පුරාණ ඊජිප්තුවේ විද්‍යාවක් තිබුණේ නැද්ද? " පොයිරෝ මෘදු ලෙස ඇසීය. ඔහු පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටියේ නැතත් වෛද්‍ය ආමෙස් මේ අවස්ථාවේදී පසුබැස්සේ ය.

"නෑ නෑ, මට උත්තර දෙන්න ඕනෙ නැහැ, ඒත් මට කියන්න මේ කළු ජාතික කම්කරුවෝ මොනව ද කියන්නේ කියලා? " "මම හිතන්නේ සුදු ජාතිකයින්ගේ කටකතා ඔවුන්ගේ ඔළුවේ නැහැ. ඒත් මම හිතන්නේ ඔවුනුත් ටික ටික බයවෙන්න අරගෙන. ඒත් ඔවුන්ට හේතුවක් නැහැ"

"මට පුදුමයි" පොයිරෝ පැවසීය. සර් ගයි ඉදිරියට නැඹුරු විය. "ඇත්තෙන්ම ඔබට ඒක විශ්වාස කරන්න බැහැ. ඒක විකාරයක්. ඔබට පුරාණ ඊජිප්තුව ගැන කිසි දෙයක් දන්නේ නැතෙයි කියලා හිතෙනවා ඔබ ඒක විශ්වාස කළොත්. " පිළිතුර සඳහා පොයිරෝ සිය සාක්කුවෙන් කුඩා පරණ කඩමාල්ලක් වැනි පොතක් එළියට ගත්තේ ය. ඔහු පෙන්වූ පරිදි එහි මාතෘකාව '*ඊජිප්තුවරුන්ගේ හා බැබිලෝනුවන්ගේ මායාවන්*' යන්න ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

ඔහු එක්වරම වටපිට බලා කූඩාරමෙන් එළියට සැණෙකින් ගියේ ය. වෛද්‍යවරයා මා දෙස පුදුම වී බලා සිටියේය. “ ඔහුගේ අදහස මොකක් ද? ” පොයිරෝගේ සුපුරුදු වාක්‍යයක් වෙන කිසිවෙකුගේ මුවින් නික්මෙණ විට මට සිනහ නැගුණේ ය. “ඇත්තෙන්ම මමත් දන්නේ නැහැ,” මම පැවසුවෙමි. "ඔහුට නපුරු ආත්මයන් නැති කරලා දාන සැලැස්මක් ද කොහේ තියෙන්නේ." මම පොයිරෝ සොයා ගිය අතර, ඔහු මියගිය බ්ලීබ්නර් මහතාගේ ලේකම් වන කෙට්ටු මුහුණැති තරුණයා සමඟ කතා කරමින් සිටිනු දුටුවෙමි.

හාපර් මහතා මෙසේ පැවසීය, “මම කැණීම්වලට හිටියේ මාස හයක් විතරයි. ඔව්, මම හොඳින් දන්නවා බ්ලීබ්නර් මහත්මයාගේ විස්තර. ” “ඔහුගේ බෑණා ගැන මට ඔබ දන්න දේවල් කියන්න පුළුවන්ද?” “ඔහු දවසක් මෙහේ ආවා එයා නරක පෙනුමක් තියෙන කෙනෙක් නෙවෙයි. මට මීට කලින් කවදාවත් දැකලා නැහැ, හැබැයි මං හිතන්නේ අමෙසුයි ෂ්නයිඩරුයි කලින් ඔහුව දන්නවා. වැඩිමහල් බ්ලීබ්නර් මහත්මයා නම් ඔහුව දකිනනවත් කැමති වුණේ නැහැ.

ඔවුන් හිටියේ හැමවෙලේම හිටයේ කැත්තට පොල්ල වගේ. 'සතයක්වත් දෙන්නේ නැහැ' යැයි වැඩිමහල් බ්ලීබ්නර් එහෙම කියලා දවසක් කෑගැහුවා.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

‘ මම ඉන්නකනුත් මැරුණට පස්සෙත් සතයක්වත් දෙන්නේ නැහැ. මම මගේ සල්ලි මගේ අනාගතේට යොදවනවා. මම අද ඒ ගැන කතා කළා ෂ්නයිඩර් එක්ක.’ තරුණ බ්ලීබ්නර් කයිරෝවට පිටවෙලා ගියා ආපහු යන්න. ”

“ ඔහු ඒ යද්දී හොඳින් හිටිය ද? “ වයසක බ්ලීබ්නර් ද?” “නැහැ, තරුණයා.” “මට හිතුණේ ඔහුගේ මොකක්හරි වැරැද්දක් තිබුණා වගේ. ඒත් ඒක බරපතළ දෙයක් නෙවෙයි, නැත්නම් මට මතක හැටි වෙන්න ඇති. ” “තව එක දෙයක්, බ්ලීබ්නර් මහතා අන්තිම කැමැති පත්‍රයක් ලියලා තියෙනවා ද?” “ ඇත්තටම අපි දන්න තරමින් නම් නැහැ.” “හාපර් මහත්මයා, ඔබ දිගටම කැණීම් කටයුතුවල යෙදෙනව ද?”

“නෑ සර්, නැහැ. මම මෙහේ තියෙන ගනුදෙනු ටික ඉවර වුණු ගමන් නිව්යෝර්ක්වලට යනවා. ඔබ කැමතිනම් හිනාවෙන්න පුළුවන් මට මෙන්-හ -රා රජුගේ ඊළඟ ගොදුර වෙන්න ඕන නැහැ. මම මෙහෙ හිටියොත් ඊලඟ ගොදුර වෙන්නෙ මම තමයි. ” තරුණයා ඔහුගේ නළලට ගැලූ දහදිය පිස දැමීය. පොයිරෝ ඉවතට හැරී සිනහ වෙමින් මෙසේ පැවසුවේ ය: “මතක ද, ඔහු ගොදුරක් නිව්යෝර්ක්වලදීත් ගත්තා.” “ඔහ්,ඉවරයි!” හාපර් මහතා පැවසීය.

http://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔහු බයෙන්" යැයි පොයිරෝ කල්පනාකාරීව පැවසීය. "ඔහු කලබල වෙන්න ඕන ඒත් ඔහු ගොඩක් කලබලෙන් " මම කුතුහලයෙන් පොයිරෝ දෙස බැලුවෙමි, නමුත් ඔහුගේ ගුප්ත සිනහවෙන් මට කිසිවක් වටහා ගන්නට නොහැකි විය. සර් ගයි සහ ආචාර්ය ටොස්විල් අපව කැණීම් බිම වටා රැගෙන ගියෝ ය. ප්‍රධාන සොයාගැනීම් කයිරෝවට යවන ලද නමුත් සමහර පුරාවස්තු අතිශයින්ම සිත් ගන්නා සුළු විය.

තරුණයෙකු වූ සර් ගයිගේ උනන්දුව කැපී පෙණුනේ ය. ඒත් ඔහුගේ මද කැළඹීමක් දක්නට ලැබුණු අතර ඔහුට පරිසරයේ ගුප්ත බවින් සම්පූර්ණයෙන්ම මිදීමට නොහැකි වී ඇති බව මම ඉන් වටහා ගත්තෙමි . අපි දවල් කෑමට පෙර ඇඟ සෝදා ගැනීමට කූඩාරමට යද්දී සුදු ලෝගුවක් දමාගත් කළු ප්‍රතිමාවක් වන් පුද්ගලයෙකු අප පසු කර යන විට ඔහු අපට අරාබි බසින් ආචාර කළේ ය. පොයිරෝ නැවතුණේ ය.

"ඔබ හසන්, මියගිය සර් ජෝන් විලාර්ඩ්ගේ සේවකයාද?" "මම සර් ජෝන්ට සේවය කළා. දැන් මම ඔහුගේ පුතාට සේවය කරනවා." ඔහු අප වෙතට ළංවී පහත් හඬින් අප ආමන්ත්‍රණය කළේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔබ බුද්ධිමත් කෙනෙක්, ඔවුන් කියන්නේ ඔවුන් නපුරු ආත්ම එක්ක ගනුදෙනු කරන්න දන්නවයි කියලා. තරුණ ස්වාමියාව මෙතැනින් යවන්න. මේ අවට නපුරක් තියෙනවා." හදිසියේම අභිනයක් දක්වමින්, පිළිතුරක් බලාපොරොත්තුවෙන් නොසිටි ඔහු පලා ගියේ ය.

" අවට නපුරක් තියෙනවා" කියා පොයිරෝ මිමිණීය. "ඔව්, මට ඒක දැනෙනවා." අපේ ආහාරවේල සතුටුදායක එකක් නොවීය. ආචාර්ය ටොස්විල් ඊජිප්තු පුරාවස්තු ගැන කුඩා දේශනයක් කළේ ය. අපි විවේක ගැනීමට ආපසු යාමට සූදානම් වෙමින් සිටියදී, සර් ගයි විසින් පොයිරෝගේ අතින් අල්ලා කූඩාරම් අතරින් ගමන් කරන කිසිවෙකුගේ සෙවණැල්ලක් පෙන්වීය. එහි හිස මනුෂ්‍යයෙකුගේ හිසක් නොවීය.

එය මා සොහොනේ පුරාවස්තු අතරේ දුටු බල්ලෙකුගේ හිසක් තිබූ ප්‍රතිමාවේ සෙවණැල්ල මෙන් බව මතකයට නැඟී මගේ සිත හිරිවැටී ගියේ ය. "*මම මැරෙනවා!*"පොයිරෝ මිමිණීය. "හිවල් ඔළුව, මළවුන්ගේ දෙවියා අනුබිස්." "කවුරුහරි අපිට විහිළුවක් කරනවා" යැයි ආචාර්ය ටොස්විල් තරහින් කෑගැසුවේය.

"ඒක ඔබේ කූඩාරමට ගියා හාපර්," සර් ගයි සුදුමැලි වූ වතින් යුතුව පැවසීය. "නැහැ, ඒක වෛද්‍ය ආමෙස්ගේ කූඩාරමටයි ගියේ" පොයිරෝ පැවසීය. වෛද්‍යවරයා ඔහු දෙස විශ්වාස කිරීමට අපහසු ලෙස බලා සිටියේ ය. පසුව, ආචාර්ය ටොස්විල්ගේ වචනම නැවත පවසමින් ඔහු කෑගැසුවේ:

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" කවුරුහරි අපිව රවට්ටනවා. එන්න, අපි ඉක්මනින්ම මිනිහව අල්ලා ගනිමු. " සෙවණැල්ල පසුපස හඹා යාමේ දී ඔහු දක්ෂ ලෙස ක්‍රියා කළේ ය. මම ද ඔහු පසුපසින් දිව ගියෙමි, නමුත්, කිසිවෙකු එහි සිටි බවට සොයාගැනීමට නොහැකි වුණු බැවින් අපි ආපසු ආවෙමු. පොයිරෝ කුමක් කරනවාදැයි බැලීමට යාමට මට සිතුණි. ඔහු අපේ කූඩාරම වටා නානාප්‍රකාර රූප සටහන් අඳිමින් බෙහෙවින් කාර්යබහුලව සිටියේ ය.

මුළු පහක් සහිත තාරකා හෝ පංචාස්‍ර ඔහු වැඩි වශයෙන්අඳිනු මා දුටුවෙමි. ඒ අතරම පොයිරෝ මායාකර්ම හා සාමාන්‍ය ජීවිතයේ දී යොදා ගන්නා මැජික් ගැන හිටිවන දේශනයක් දුන්නේ ය. එහි හොඳ මායාවන් දුෂ්ට මායාවන්ට හරස් වන බවත් කා[2] හට කියන තවත් නම් ගැනත් එහි සඳහන් විය. ආචාර්ය ටොස්විල් කෝපයෙන් පිඹිමින් මා පසෙකට ඇදගත්තේ ය. "බොරුවක්, සර්" ඔහු කෝපයෙන් කීවේය.

" ලොකු බොරුවක්. ඔහු මධ්‍යකාලීන යුගයේ මිථ්‍යා විශ්වාසයි සහ පුරාණ ඊජිප්තුවේ විශ්වාසයන් අතර වෙනස දන්නේ නැහැ. මේ වගේ නූගත් ඒ වගේම මේ වගේ ලැජ්ජාවක් නැතිව කියන බොරු කථාවක් මම අහලම නැහැ. " මම කලබල වූ විශේෂඥයා සන්සුන් කර, කූඩාරමට පොයිරෝට එක් වුණෙමි. මගේ කුඩා මිතුරා සතුටු සිතින් සිටියේ ය.

[2] ඊජිප්තු දෙවි කෙනෙකි

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"අපට දැන් හොඳට නිදාගන්න පුළුවන්" කියා ඔහු සතුටින් ප්‍රකාශ කළේ ය. "මට ටිකක් නිදාගන්න පුළුවන්. මගේ ඔළුව. අහ්, ටිකක් කකියනවා හොඳ *හර්බල් තේ* එකක් ගත්තනම් හරි!" එයට පිළිතුරු වශයෙන් මෙන්, කූඩාරමේ තිරය ඔසවා හසන් ඇතුළට පැමිණ පොයිරෝට දුම් දමන පානයක් අඩංගු කොප්පයක් පිරිනැමුවේ ය.

එය පොයිරෝගේ ප්‍රියතම පානයක් වූ කැමොමයිල් තේ පානයක් බව පෙණුනි. හසන්ට ස්තූති කර මා හට පානයක් අවශ්‍ය නැති බව පැවසීමෙන් පසු ඔහු පිටව ගිය අතර අප නැවත වරක් කූඩාරමේ තනි වුණේ ය.

මම ඇඳුම් මාරුකරගෙන ටික වේලාවක් කූඩාරමේ පිවිසුම ළඟ සිටගෙන කාන්තාරය දෙස බලා සිටියෙමි. "පුදුමාකාර තැනක්, අපූරු වැඩක්. මට ඒක දැනෙනවා. මෙම කාන්තාර ජීවිතය වැනසුණු ශිෂ්ටාචාරයක හදවතට එබී බලනවා වගේ. ඇත්තෙන්ම පොයිරෝ ඔයාටත් ඒක දැනෙනව ද ? "

මට පිළිතුරක් නොලැබුණු අතර එබැවින් මම පොයිරෝ දෙස බැලුවෙමි. මගේ තරහව ඉක්මනින්ම බියක් බවට පත්විය. පොයිරෝ ලණු ඇඳෙහි වැතිර සිටි අතර ඔහුගේ මුහුණ දරුණු ලෙස ගැහෙමින් තිබුණි. ඔහු අසල හිස් වූ කෝප්පය තිබුණි. මම ඔහු දෙසට දිව ගොස් පසුව හැරී කඳවුර හරහා දොස්තර අමෙස්ගේ කූඩාරමට දිව ගියෙමි. "අමෙස්! " මම කෑ ගැසුවෙමි. "ඉක්මනට එන්න."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"මොකක් ද වුණේ?" පිජාමාවෙන් පෙනී සිටි වෛද්‍යවරයා ඇසීය. " මගේ යාළුවා. ඔහුට අසාධ්‍යයි. කැමොමයිල් තේ එක තමයි ඒ. හසන්ට කඳවුරෙන් එළියට යන්න දෙන්න එපා." සැණෙකින් වෛද්‍යවරයා අපේ කූඩාරමට දිව ගියේ ය. මම ඔහු හැර යන විට සිටි ආකාරයටම පොයිරෝ වැතිර සිටියේ ය. "අමුතුයි" අමෙස් කෑගැසුවේය. " හරියට අපස්මාරය වගේ එහෙමත් නැතිනම් ඔබ මොකක් ද අර ඔබ මොහු බිව්වයි කිව්වේ "

ඔහු හිස් කෝප්පය අතට ගෙන බැලුවේ ය. "මම ඒක බිව්වේ නැහැ!" සන්සුන් කටහඬක් පැවසීය. පොයිරෝ ඇඳ උඩ වාඩි වුණෙන් අපි පුදුමයට පත් වුණෙමු. ඔහු සිනාසෙමින් සිටියේය. "නැහැ" ඔහු මෘදු ලෙස කීවේය. "මම ඒක බිව්වේ නැහැ. මගේ යාළුවා හේස්ටිංග්ස් රෑ දිහා බලන් ඉන්නකොට, මම ඒක වක්කරගත්තේ උගුරට නෙවෙයි පොඩි කුප්පියකට. ඒ කුප්පිය රසායනික විශ්ලේෂණයකට යවන්න ඕන."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

වෛද්‍යවරයා ඉක්මනින් කිසියම් චලනයක් කළේ ය -" මම ඒක ඔබට දෙන්නේ නැහැ. බුද්ධිමත් මනුස්සයෙක් විදියට, ප්‍රචණ්ඩ කමින් ඒක අරගෙන ප්‍රයෝජනයක් නැතෙයි කියලා ඔබට තේරෙනවනේ. ඔබව එක්කන් එන්න හේස්ටිංග්ස් ගියාම මම බෝතලය පරිස්සමින් අරන් තිබ්බා. අහ්, ඉක්මන් කරන්න, හේස්ටිංග්ස්, ඔහුව අල්ලා ගන්න! " මම පොයිරෝගේ ප්‍රකාශය වරදවා වටහාගෙන මගේ මිතුරා බේරා ගැනීමට මම ඔහු ඉදිරිපිටට පැන්නෙමි.

sinhalaebooks.com

නමුත් වෛද්‍යවරයාගේ වේගවත් චලනයේ වෙනත් අර්ථයක් ඇති බව මට වැටහුණේ පසුව ය. ඔහුගේ අත මුඛය වෙත ගිය අතර කටුක ආමන්ඩ් ගන්ධයකින් වාතය පුරවා දමමින් ඔහු ඉදිරියට ඇද වැටුණේ ය. "තවත් ගොදුරක්, ඒත් අන්තිමයා. සමහර විට ඒක හොඳම එක වෙන්න ඇති. ඔහුට මරණ තුනක වගකීම තියෙනවා. "

"වෛද්‍ය ආම්ස්? " මම කෑගැසුවෙමි. "ඒත් මම හිතුවේ ඔබ මේක මොකක් හරි ගුප්ත බලවේගයක බලපෑමක් විශ්වාස කරනවා කියලනේ?"

"හේස්ටිංග්ස්, ඔබ මාව වරදවා වටහා ගත්තා. මම අදහස් කළේ මම අද්භූත විශ්වාසවල බිහිසුණු බලපෑම විශ්වාස කරනවා කියලනේ. පිට පිට මරණ කීපයක්ම අද්භූතයි කියලා විශ්වාස කරන්න සැලැස්සුවම මහ දවාලේ මිනිහෙකුට පිහියෙන් ඇන්නත් ඒකත් අද්භූත බලවේගයකින් වෙච්ච දෙයක් කියලයි මිනිස්සු හිතන්නේ.

මම මුල ඉඳන්ම විශ්වාස කළේ මිනිහෙක් මේ තත්වයෙන් ප්‍රයෝජනයක් ගන්නවා ඇතියි කියලා. සර් ජෝන් විලාඩ්ගේ මරණයෙන් පස්සේ ආව අද්භූත විශ්වාස රැල්ලෙන් තමයි ඔහුට මේ අදහස එන්න ඇත්තේ.මට පෙණුනු විදියට සර් ජෝන් විලාඩ්ගේ මරණෙන් තමයි ඔහුට මේ අදහස එන්න ඇත්තේ. බ්ලීබ්නර් මහත්මයාගේ සිද්ධිය වෙනස්. ඔහු සල්ලිකාර මිනිහෙක්. නිව්යෝර්ක්වලින් ආපු පණිවිඩයේ මට වැදගත් කාරණා කීපයක්ම තිබුණා."

https://sinhalatranslationofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මුලින්ම, තරුණ බ්ලීබ්නර් කියනවා ඊජිප්තුවෙ තමන්ට ණයට ඉල්ලගන්න පුළුවන් හොඳ යාළුවෙක් ඉන්නවා කියලා. ඔහු අදහස් කරන්න ඇත්තේ ඔහුගේ මාමා ගැන කියලා මම තේරුම් ගත්තත් මට තේරුණේ මෙවෙලේ ඔහු සම්පූර්ණයෙන්ම විවෘත වෙලා ඒක කියලා තියෙන බවයි. වචන වලින් කියවෙන්නේ ඔහුගේම හොඳ සගයෙක් ගැනයි. තවත් දෙයක්, ඔහු යන්තම් සල්ලි තිබුණේ ඔහුට ඊජිප්තුවට යන්න විතරයි.

ඔහුගේ මාමා විවෘතවම කියලා තියෙනවා ඔහු ඔහුට එක සතයක්වත් දෙන්නේ නැතෙයි කියලා. කවුරුහරි ඔහුට සල්ලි දීලා තියෙනවා. '' ''ඒ ඔක්කොම ගොඩක් සියුම්'' කියා මම විරුද්ධ වුණෙමි. ''ඒත් තව ගොඩක් දේවල් තිබුණා හේස්ටිංග්ස්, අපි සාහිත්‍යයේ දී පාවිච්චි කරන වචනවල තේරුම කථාකරන වෙලාවට වෙනස් වෙනවා . තරුණ බ්ලීබ්නර් පැහැදිලිවම ලිව්වා: 'මම ලාදුරු ලෙඩෙක්' ඒත් කිසිම කෙනෙක් ඒක තේරුම් ගත්තේ නැහැ. ඔවුන් හිතුවෙ ඔහුව කොන් කර ඇති බවයි.

ඇත්තටම වුණේ ඔහු ඔහුට ලාදුරු රෝගය හැදිලයි කියලා විශ්වාස කළ නිසා තමාටම වෙඩි තියාගත්තා. ''"මොකක්?" මම කෑ ගැසුවෙමි. ''එය දුෂ්ට මනසක දක්ෂ නිර්මාණයක්. තරුණ බ්ලීබ්නර් සමෙ රෝගයකින් කරදර වින්දා; ඔහු ජීවත් වුණේ දක්ෂිණ සාගර දූපත්වල නේ. අමෙස් ඔහුගේ යාළුවෙක් ඒ වගේම ප්‍රසිද්ධ වෛද්‍යවරයෙක් නිසා ඔහු ඒක විශ්වාස කළා.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මම මෙහේ එද්දී මගේ සැකය හාපර්ටයි වෛද්‍ය අමෙස්ටයි යෙදිලා තිබුණත් ඉක්මනටම මට තේරුණා අපරාධ කරල ඒවා හංගන්න පුළුවන් වෛද්‍යවරයට විතරයි කියලා. මම හාපර්ගෙන් තමයි මම දැන ගත්තේ ඔහු කලින් ඉඳන් තරුණ බ්ලීබ්නර් දන්නවයි කියලා. වෛද්‍ය අමෙස් දැක්කා ලොකු ධනයක් අත්පත් කර ගන්න අවස්ථාවක් දුටුවේය. මාරාන්තික විෂබීජ බ්ලීබ්නර් මහතාට එනනත් කරන එක ඔහුට ප්‍රශ්නයක් නෙවෙයි.

ඊළඟට බැණා, ඔහුට ලාදුරුයි කියලා හිතල වෙඩි තියාගන්නවා. බ්ලීබ්නර් මහත්මයාගේ සල්ලි ලැබෙන්නේ බැණට, බැණා මැරිලා හින්දා ඒක ඊළඟට හම්බවෙන්නේ අමෙස්ට. " " එතකොට ෂ්නයිඩර් මහත්මයා?"

"මට හරියටම කියන්න බැරිවුණත්. ඔහු තරුණ බ්ලීබ්නර් හොඳින් දැනන් හිටියා, ඔහු සැක කරන්න ඇති. නැත්නම් වෛද්‍යවරයා හිතන්න ඇති තව තවත් මරණ ගාණ වැඩි කරලා මිථ්‍යා විශ්වාස ගැන කථාව තව තවත් වැඩි කරන්න.

මම ඔයාට කියන්නම් පොඩි මනෝවිද්‍යාත්මක කාරණයක්, යාළුවා.මිනීමරුවෙක් හැම වෙලේම තමාගේ අපරාධ තව තවත් සාර්ථක කරගන්න ආසා කරනවා. තරුණ විලාර්ඩ් ගැන මට ඒක නිසා බයක් දැනුණා. අනුබිස් වගේ ඇඳගෙන ඇවිල්ලා ඇවිදින්න කියලා මම තමයි හසන්ට කිව්වේ. මම බැලුවේ මට අමෙස්ව බය කරන්න පුළුවන් ද කියලා.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මම හිතුව විදියටම ඔහුව බයකරන්න නම් ඒක ඊට වඩා අද්භූත වෙන්න ඕනෙ වුණා. මම බොරුවට මිථ්‍යා මත විශ්වාස කරනවයි කියලා කියපු කථාවට ඔහු සම්පූර්ණයෙන්ම රැවටුනේ නැතෙයි කියලා මට තේරුණා. ඔහු මම කරපු පොඩි නාට්‍යයට රැවටුණේ නැහැ."

"මම දැනගත්තා ඔහු මාව ඊළඟ ගොදුර විදියට ගන්න ලෑස්ති වෙන බව. අහ්, ඒත් *තාම ශාපය තියෙනවා තිබියදීත්,* රස්නෙ එපාවෙනවා, වැලි මහ කරදරයක් ඒත් මොළේ වැඩ! " පොයිරෝගේ අනුමාන නිවැරැදි බව තහවුරු වුණේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

තරුණ බ්ලීබ්නර්, මීට වසර කිහිපයකට පෙර, විහිළුවක් වශයෙන් අන්තිම කැමති පත්‍රයක් ලියා ඇති අතර, එහි අඩංගුව තිබී ඇත්තේ "මගේ ඔරලෝසුව බෙහෙවින් අගය කරන වරක් මගේ ජීවිතය දියේ ගිලීමෙන් ගලවාගත් මගේ මිත්‍රයා වන රොබට් ආමෙස් හට මගේ මරණයෙන් පසු මට අයත් සියළු දේ අයත් වන බව ප්‍රකාශ කරමි."

සිද්ධිය කෙමෙන් ජනයා අතරට ගිය අතර ජනතාව අදට ද ඊජිප්තු සොහොන් කොත්වල ශාප ගැන කථා කිරීමේ දී මෙය උදාහරණයක් ලෙස යොදා ගනියි. මෙය පොයිරෝ මට පෙන්වා දුන් පරිදි සියලු ඊජිප්තු විශ්වාසයන්ට සහ චින්තයන්ට පරස්පර වේ.

නිමි. . .

sinhalaebooks.com

03. ප්ලයිමත් ශීඝ්‍රගාමී දුම්රිය

'The Plymouth Express' ප්‍රථම වරට ප්‍රකාශයට පත්කරන ලද්දේ 'The Mystery Of The Plymouth Express' ලෙස *ද ස්කෙච්* 1923 අප්‍රේල් 04 කලාපයේදී ය.

I

රාජකීය නාවික හමුදාවේ සේවය කරන ඇලෙක් සිම්ප්සන් මහතා, නිව්ටන් ඇබෝහි දුම්රිය ස්ථානයේ වේදිකාවෙන් ප්ලයිමත් ශීඝ්‍රගාමී දුම්රියේ පළමු පන්තියේ මැදිරියකට පා තැබුවේ ය. පෝටර්වරයෙක් ඔහුගේ බරැති ගමන් බෑගය ගෙන ඔහු පසුපසින් පැමිණියේ ය. ඔහු එය රාක්කයට දැමීමට සූදානම් වන විට තරුණ නැවියා ඔහුව නැවැත්වීය. "ඕනෙ නැහැ,ඕක මෙතනින් තියන්න. මම ඒක පස්සේ උඩට දාගන්නම්. මෙන්න ඔයාට"

"ස්තූතියි, සර්." ත්‍යාගවන්ත ලෙස සන්තෝෂම පිළිගත් පෝටර්වරයා ඉවත්ව ගියේ ය. දොරවල් වැසුණු පසු ස්ථානාධිපතිවරයාගේ කටහඬ ඇසුණි "ප්ලයිමත්වලට විතරයි. ටෝර්කි යන අය මාරුවෙන්න. ඊළඟට නවත්තන්නේ ප්ලයිමත්වල" නළා හඬ ඇසුණු පසු දුම්රිය සෙමෙන් දුම්රිය ස්ථානයෙන් පිටතට ඇදෙන්නට විය.දුම්රිය මැදිරිය ලුතිනන් සිම්ප්සන්ටම වෙන්වී තිබෙන බවක් පෙනෙන්ට තිබුණි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

දෙසැම්බරයේ සිසිල් සුළඟ විඳ ගැනීමට ඔහු ජනේලය ඔසවා විවෘත කර ඔහු හොඳ හුස්මක් ගත්තේ ය. එක්වරම ඔහුගේ මුහුණින් අමුත්තක් පෙණුනි. "මේ මොන සුවඳක්ද!" ඔහුට රෝහලේ ගත කළ කාලය සහ එහිදී ඔහුගේ කකුලේ සිදුකළ සැත්කම ඒ සුවඳින් සිහි වුණේ ය. "ඔව්, ඒ ක්ලෝරෝෆෝම්; ඒ ඒක තමයි!" ඔහු යළිත් ජනේලය වසා දැම්මේ ය. ඔහු තම ආසනය එන්ජිමට පිටුපා තිබෙන එකකට මාරුකර ඉන් අනතුරුව සාක්කුවෙන් පයිප්පය ගෙන එය දල්වා ගත්තේ ය.

මද වේලාවක් ඔහු අලසව වාඩි වී පයිප්ය උරමින් රාත්‍රිය දෙස බලා සිටියේය. අන්තිමේදී ඔහු නැගිට ගමන් බෑගය විවෘත කර කඩදාසි සහ සඟරා කිහිපයක් එළියට ගෙන බෑගය නැවත වසා දමා ඉදිරියේ ඇති අසුන යටට තල්ලු කිරීමට උත්සහ දැරුවේ ය. නමුත් යම් දෙයක් එයට බාධාවක් වුණු හෙයින් එය සාර්ථක නොවුණි.

ඔහු නැඟී එන කෝපයෙන් යුතුව එය තවත් තදින් තල්ලු කළේ ය.නමුදු එය තවමත් අතරමැද හිරවී තිබුණේ ය. "ඇයි මේක ඇතුළට යන්නේ නැත්තේ?" ඔහු මුමුණමින් එය මුළුමුනින්ම එළියට ඇද අසීරුවෙන් පහතට නැමී ආසනය යට බැලුවේ ය. මොහොතකට පසු රාත්‍රියේ නිහඬ බව බිඳිමින් මහ හඬින් කළ කෑ ගැසීමක් ඇසුණු අතර හදිසි දම්වැල ඇදීමට අවනතවීමක් ලෙසින් විශාල දුම්රිය අකැමැත්තෙන් මෙන් නැවැත්වීය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

II

“ *මගේ යාළුවා,* මම හිතන්නේ ඔයාට පුළුවන් වේවි හොඳ විනෝදයක් ගන්න ජ්ලයිමත් ශීඝ්‍රගාමීයේ සිද්ධියෙන්, මේක කියවල බලන්න” මම පොයිරෝ මේසය දිගේ මා වෙත තල්ලු කර එවූ සටහන අතට ගත්තෙමි. එය කෙටි සහ කාරණයට අදාළව ලියා තිබුණු එකක් විය.

හිතවත් මහතාණෙනි,

ඔබ ඔබට පහසු දිනයක් ඉක්මනින්ම දන්වනවානම් මම ඔබට කෘතඥ වෙමි.

ඔබගේ විශ්වාසි,

එබනසර් හැලිඩේ

මට එබසනර් හැලිඩේට ජ්ලයිමත් ශීඝ්‍රගාමියේ සිද්ධිය සමඟ ඇති සබඳතාවය නොවැටහුණි. මම අවුල් සහගතව පොයිරෝ දෙස බැලුවෙමි. පිළිතුර වෙනුවෙන් ඔහු පුවත්පත අතට ගෙන ශබ්ද නඟා කියවීය: “ ඊයේ රාත්‍රියේ ඛේදජනක සිදුවීමක් අනාවරණය වී ඇත. ජ්ලයිමත් වෙත ආපසු යන තරුණ නාවික නිලධාරියෙකු ඔහු සිටි මැදිරියේ අසුන යට තිබී පපුවේ ඇනුණු පිහියක් සහිත කාන්තාවකගේ මළ සිරුරක් සොයාගෙන ඇත. නිලධාරියා එක්වරම හදිසි දම්වැල ඇද දුම්රිය නතර කර ඇත. වයස අවුරුදු තිහක් පමණ වූ, පොහොසත් ලෙස ඇඳ පැළඳ සිටි මෙම කාන්තාව තවමත් හඳුනා ගැනීමට හැකියාවක් ලැබී නැත.”

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

"ඊට පස්සෙ මෙහෙම දෙයක් තියෙනවා" "ප්ලයිමත් ශීඝ්‍රගාමී දුම්රියේ දී හමුවුණ මළසිරුර ගෞරවණීය රූපට් කැරිංග්ටන් මහත්මියගේ බව හඳුනාගෙන ඇත." ඔයාට දැන් පේනවද මගේ යාළුවා?"

"ඔයාට තේරුණේ නැතිනම් මමම ඒ ටිකත් එකතු තරන්නම්. ඔයා දන්නව ද රූපට් කැරිංග්ටන් මහත්මිය විවාහයට කලින් ෆ්ලොසී හැලිඩේ. එතකොට ෆ්ලොසී හැලිඩේ තමයි එබ්සනර් හැලිඩේගෙ දුව. ඇත්තෙන්ම හැලිඩේ මහත්මයා තමයි ඇමරිකාවේ වානේ ව්‍යාපාරවල ප්‍රධානියා. " "හැලිඩේ මහත්මයා ඔයාට කතාකරලා? නියමයි! " "මම ඔහුට ඉස්සර පොඩි උදව්වක් කළා.ඒ මේ චෙක් එකක ප්‍රශ්නයක්. එක පාරක්, මම පැරීසියට රාජකීය ආරාධනයකට ගිහින් ඉන්නකොට මම දැක්කා ෆ්ලෝසි මෙනෙවියව. ඇය සියුමැලි පොඩි ඇඟක් තියෙන කෙනෙක්. ඒක කරදර ඇති කරන දෙයක් වුණා. ඇය මේ ළඟ දී විවාහ ගිවිසිමක් ඇති කරගත්තා ඒත් ඒක අවලංගු වුණා."

"ඒ කොහොමද?" "රොචෙෆෝර් සිටුවරයා එක්ක. නරක කෙනෙක්, ඔබ ඇහුව ප්‍රශ්නෙට උත්තරය විදියට ඔහු දැන ගෙන හිටියා ආයාචනය කරලා අහිංසක තරුණියන්ව රවට්ටන්න. වාසනාවකට ඇයගේ පියාට ඒක ගැන අන්තිමට හරි දැන ගන්න ලැබුණා. ඔහු ඇයව ඉක්මනින් ඇමරිකාවට අරන් ගියා. අවුරුදු ගාණකට පස්සේ මට ඇගේ විවාහය ගැන දැනගන්න ලැබුණත් මම ඇය බැඳපු කෙනා ගැන නම් දන්නේ නැහැ. " "හ්ම්" මම කීවෙමි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"රූපට් කැරිංග්ටන් මහත්මයා හොඳ කෙනෙක් නෙවෙයි. ඔහු තමන්ගේ සල්ලි සෑහෙන තරමට නාස්ති කරනවා අශ්ව තරඟවලට, මම හිතන්නේ හැලිඩේගේ සල්ලි ආවේ යාන්තම් ඔහුගේ හරිම වෙලාවට. මම කියන්න ඕනේ ප්‍රතිපත්තියක් නැති ඔහු වගේ වංචනිකයෙකුට සහකාරියක් හොයාගන්න එක ගොඩක් අමාරු වැඩක්! "

"ආහ්, අසරණී! *ඇය දැන් සොහොනට යනවා!*" " මම හිතන්නේ ඔහු ඇයට නෙවෙයි ඇගේ සල්ලිවලටයි කැමති වුණේ. මම විශ්වාස කරන විදියට ඔවුන් සෙමෙන් එකිනෙකාගෙන් ඈත් වුණා. මට අහන්න ලැබුණු හැටියට මේක නීතිමය වෙන්වීමක් වෙනකම්ම ගියා." "මහලු මිනිසා හැලිඩේ මෝඩයෙක් නෙවෙයි. ඔහු ඇගේ මුදල් ඔක්කොම ඔහු ළඟ තියාගෙන කොටසක් ආයෝජනය කළා."

"ඒක නිසා ඇයට අන්තිමට අතේ සල්ලි නැතිව කරදර වෙලා." "ආහා! මට පුදුමයි-" "ඔයා පුදුම වෙන්නේ මොකක් නිසා ද?" "මගේ හොඳ යාළුවා, ඔය විදියට කඩා පනින්න එපා. ඔයා උනන්දුයි කියල මට පේනවා. හැලිඩේ මහත්තයා හම්බවෙන්න මාත් එක්ක යන්න එන්න. කෙළවරේ ටැක්සියක් තියෙනවා. "

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

III

ඇමරිකානු ධනවතා විසින් කුලියට ගත් පාක් පටුමගෙහි පිහිටි සුපිරි නිවස ළඟාවීමට අපට ගතවූයේ මිනිත්තු කිහිපයක් පමණි. අපට පුස්තකාලයට වෙත මග පෙන්වූ අතර, මද වේලාවකින් අපට තියුණු ඇස් හා උල් නිකටක් තිබූ විශාල ශක්තිමත් මිනිසෙකු ද එක් විය. "පොයිරෝ මහත්මයා? " හැලිඩේ මහතා ඇසීය.

"මම හිතන්නේ මම ඔබට කියන්න ඕන නැහැ මට ඔබව ඕනෙ කරන්නේ ඇයි කියලා. ඔබ දන්නවා ඒක. ඔබ පත්තර කියවන්න ඇති, මම මගේ කකුල් දෙක යට තණකොළ වැවෙනකම් ඉන්න කෙනෙක් නෙවෙයි. මට ආරංචි වුණා ඔබ ලන්ඩන්වල ඉන්න බව, මට මතක් වුණා ඔයා ඒ දවස්වල කරපු වැඩ. මම කියන්නේ නමක් කවදාවත් අමතක කරන්න එපා. මට තිබුණා ස්කොට්ලන්ඩ්යාඩ් එකට යන්න, ඒත් මට මම අඳුරන අපේම මිනිහෙක් ඉන්නවා. සල්ලි ප්‍රශ්නයක් නැහැ."

"සල්ලි ඔක්කොම මගේ කෙල්ලටයි වෙන් කරල තිබුණේ, ඒත් දැන් එයා නැහැ! මම ඒ දේ කරපු ඒ එපාකරපු වංචනිකයව අල්ලන්න මගේ අන්තිම සතේට වෙනකම් වියදම් කරනවා. ඒ නිසා ඒක කිරීම ඔබට භාරයි. " පොයිරෝ හිස නමා ආචාර කළේ ය. "මම ඔබේ දියණිය පැරිසියේදී කිහිප වතාවක්ම දැක්කා දැන් මම ඔබෙන් ඉල්ලන්නේ ඇය ප්ලයිමත් ගිය ගමනේ විස්තරයි සිද්ධියට අදාළ වෙන අනිත් විස්තරයි ඔක්කොම මට කියන්න කියලයි." හැලිඩේ කථාව ආරම්භ කළේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"හොඳයි, පටන් ගන්නේ කොහෙන් ද....? දුව ගියේ ප්ලයිමත්වලට නෙවෙයි. ඇවොන්මීඩ් චතුරස්‍රයේ ස්වැන්සී ආදිපාදවරියගේ ගෙදර සාදයකටයි දුව යමින් හිටියේ. දුව දොළහයි දාහතරට ලන්ඩන්වලින් පිට වුණේ පැඩිංග්ටන්වලිනුයි. ඊට පස්සේ දුව දෙකයි පනහ වෙද්දී බ්‍රිස්ටල්වල (ඇය දුම්රිය මාරුකළ යුත්තේ මෙහී දී ය).

ගොඩක් ප්ලයිමත් ශීඝ්‍රගාමී දුවන්නෙ වෙස්ට්බරි හරහානේ, ඒවා කීයටවත් බ්‍රිස්ටල් ගාවින් යන්නේ නැහැ. දොළහයි දාහතරේ එක කෙළින්ම නවත්වන්නේම නැතිව යන්නේ බ්‍රිස්ටල්වලට එතැනින් පස්සේ වෙස්ටන්වල ටෝන්ටන්වල එක්සිටර්වල ඊට පස්සේ නිව්ටන් ඈබේවලනේ නවත්තන්නේ. මගේ දුව තනියම මැදිරියේ ගියාට දුවගේ සේවිකාව තුන්වන පන්තියේ මැදිරියක ගියා." පොයිරෝ හිස වැනූ අතර, හැලිඩේ මහතා තවදුරටත් කථාකරගෙන ගියේ ය:

"ඇවොන්මීඩ්වල උත්සවේ ගොඩක් ලොකු එකක්, බාල් නැටුම් කීපයක්ම තිබුණා, ඒක නිසා දුව ඇගේ ආභරණ ඔක්කොම වගේ අරගෙන ගියා. එතන ඩොලර් ලක්ෂයක විතර ආභරණ තිබුණා " "*පොඩ්ඩක් ඉන්න,*" පොයිරෝ බාධා කළේ ය. "ඔබේ දුවද නැත්නම් සේවිකාව ද ආභරණ තියාගෙන හිටියේ? "

"මගේ දුව නිතරම ඒව භාරගෙන නිල් පාට මොරොක්කෝ පෙට්ටියක දාගෙන අරන් යන්නේ."
"කියාගෙන යන්න මහත්මයා." "බ්‍රිස්ටල්වලදී සේවිකාව ජේන් මේසන් දුවගේ ඇඳුම් බෑග් එකයි තෑගියි එකතුකරගෙන දුව හිටපු පෙට්ටියේ දොර ගාවට ඇවිත්.

sinhalaebooks.com

දුව බ්‍රිස්ටල්වලින් බහින්නේ නැතිව තව ටික දුරක් යනවයි කියලා ඇහුවාම ඇය පුදුම වෙලා. දුව ජේන්ට කියලා බෑග් එළියට අරගෙන බෑග් තියන තැනින් තියලා, තේ එකක් එහෙම බීලා දුව කෝච්චියකින් ආපහු බ්‍රිස්ටල්වලට එනකම් ඉන්න කියලා.

ජේන් පුදුම වුණත් එයා කිව්ව විදියටම කරලා. ඇය ගමන් මලු ටික තියන තැනින් තියලා තේ බොන්න ගිහිල්ලා. ඊළඟට ආපු කෝච්චි එකකවත් දුව ඉඳලා නෑ. අන්තිම කෝච්චියත් ආවට පස්සේ ජේන් බෑග් තිබ්බ තැනම තියලා රෑ ගත කරන්න ඒ ළඟ හෝටලයකට ගිහිල්ලා.

අද උදේ ඇය සිද්ධිය ගැන විස්තර අහල පුළුවන් වෙච්ච පළවෙනි කෝච්චියෙන්ම ටවුමට ගියා.'' ''ඔබේ දුව සැලැස්ම වෙනස් කරපු එකට පොඩි හේතුවක්වත් දන්නේ නැද්ද?'' ''හොඳයි මෙහෙම දෙයක් වෙලා: බ්‍රිස්ටල්වලදී ජේන් මේසන් කියනවිදියට දුව තනියම නෙවෙයි ඉඳලා තියෙන්නේ.තව පිරිමි කෙනෙක් හිටගෙන ඉඳලා ඉඳලා තියෙනවා. ඈත ජනේලයකින් එළිය බලාගෙන ඉඳපු නිසා මේසන්ට එයාගේ මූණ පෙනිලා නැහැ ."

''ඇත්තෙන්ම දුම්රියේ පැත්තෙන් හිටගන්න ඉඩ තීරුවක් තිබුණ ද ?'' ''ඔව්.'' ''ඉඩ තීරුව තුබුණේ මොන පැත්තෙන් ද?'' ''වේදිකාව පැත්තේ. මගේ දුවත් මේසන් එක්ක කතාකරද්දී ඒ ඉඩ තීරුවෙයි හිටගෙන ඉඳලා තියෙන්නේ.''

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඒ ගැන ඔබේ හිතේ සැකයක් නැහැ- සමාවෙන්න!" ඔහු නැඟිට ඇලවී තිබුණු තීන්ත රඳවනය කෙළින් කළේ ය. *"සමාව දෙන්න,"* ඔහු නැවත අසුන් ගත්තේය. " ඇද වෙච්ච දෙයක් දැක්කම ඒක මගේ ස්නායු වලට බලපානවා. අමුතුයි නේද? මම අහන්න හිටියේ, මහත්මයා ඔබට හොඳටම විශ්වාස ද දුව සැලැස්ම කරන්න හේතුව බලාපොරොත්තු වුණේ නැති අමුත්තෙක් කියලා?"

"වෙන්න පුළුවන් එකම දේ ඒකනේ." " ඒ කවු ද කියලා ඔබ දන්නේ නැද්ද?" කෝටිපතියා මොහොතකට පසුබට වී, "නැහැ, මට හිතාගන්න බැහැ" යනුවෙන් පිළිතුරු දුන්නේ ය."දැන් අපි මළසිරුර හොයා ගැනීම ගැන බලමු?" "තරුණ රාජකීය නාවිකහමුදාවේ ලුතිනන්වරයෙක් තමයි හොයාගෙන තියෙන්නේ. ඒකෙ වෛද්‍යවරයෙක් ඉඳපු නිසා ඔහු සිරුර පරීක්ෂා කරලා. ඔහු කියන විදියට ඇයට මුලින්ම ක්ලෝරෝෆෝම් අල්ලලා සිහි නැති කරලා පසුව තමයි පිහියෙන් ඇනලා තියෙන්නේ. "

" ඔහුගේ නිගමනයේ විදියට දුව මැරිලා ඒ වෙනකොට පැය හතරක් විතර ගිහිල්ලා, ඒ නිසා ඇයට ඇනලා තියෙන්නේ බ්‍රිස්ටල්වලින් පිටවෙලා ගොඩක් වෙලා ගිහිල්ලා නෙවෙයි. සමහරවිට බ්‍රිස්ටලුයි වෙස්ටනුයි අතර එහෙමත් නැතිනම් වෙස්ටනුයි ටෝන්ටනුයි අතර" "එතකොට ආභරණ පෙට්ටිය?"

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ඒක නැතිවෙලා පොයිරෝ මහත්මයා. " "තව එක දෙයක්, මහත්මයා,ඔබේ දුවගේ මුදල්, ඒවා ඇගේ මරණෙන් පස්සේ කාට ද?" "විවාහයෙන් පස්සේ ෆ්ලොසී හැම දෙයක්ම ඇගේ සැමියගේ නමට ලිව්වා." ඔහු විනාඩියක් පමණ සිතමින් සිට නැවතත් කතාව ඇරඹුවේ ය: "පොයිරෝ මහත්තයා, මම ඔබට කියන්නේ, මගේ බෑණා මගේ මතයේ විදියට නම් ප්‍රතිපත්තියක්වත් නැති වංචාකාරයෙක්, මගේ මගපෙන්වීම නිසා මගේ දුව හිටියේ නීතිමය මාර්ගයෙන් ඔහුගෙන් වෙන් වෙන්න ඕන්න මෙන්නයි. ඒක අමාරු දෙයක් නෙවෙයි"

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

" ඇයගෙ ජීවිතය තියෙන තුරු ඔහුට ඒවට අත තියන්න බැරිවෙන විදියට මම ඒවා හිර කරලයි තිබුණේ, ඔවුන් සම්පූර්ණයෙන්ම වෙන් වෙලා අවුරුදු ගාණක් වුණත් ඇය කෙළින්ම අපවාදයට ලක්වෙන එකෙන් බේරෙන්න ඔහු ඉල්ලපු සල්ලි ඔහුට දුන්නා. කොහොම වුණත්, මම හිතාගත්තා මේක ඉවරයක් කරනවයි කියලා. අන්තිමේදී ෆ්ලෝසි ඒකට එකග වුණාම මම නීතිඥයින්ට කිව්වා ඕන කරන දේවල් ලෑස්ති කරන්න කියලා. "

"කැරිංග්ටන් මහත්මයා දැන් කොහෙද ඉන්නේ?" "නගරයේ. මම දන්න විදියට ඔහු ඊයේ වෙනකම් රටෙන් පිටයි ඉඳලා තියෙන්නේ, ඒත් ඔහු ඊයේ රෑ ආපහු ඇවිල්ලා. " පොයිරෝ මඳ වේලාවක් සිතමින් සිටියේ ය. එවිට ඔහු මෙසේ පැවසීය: "මම හිතන්නේ ඔබට කියන්න තියෙන්නේ එච්චරයි නේ ද, මහත්මයා." "ඔබ සේවිකාව, ජේන් මේසන්ගෙන්

sinhalaebooks.com

ප්‍රශ්න කරන්න කැමති ද?'' ''කරුණාකර ඔබට පුළුවන් නම්. '' හැලිඩේ සීනුව නාද කළ අතර,පැමිණි සේවකයාට කෙටි නියෝගයක් ලබා දුන්නේ ය. මිනිත්තු කිහිපයකට පසු ජේන් මේසන් කාමරයට ඇතුළු වුණි. ඛේදවාචකයක් හමුවේ මුහුණින් එම හැඟීම් නොපෙන්වීම නිසා ඇය තද හිත් ඇත්තියක් බව හිතාගත හැකි විය. '' මට ඔබගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න පුවවන් ද? ඔබේ ස්වාමිදූව ගමන ගිය දවසේ උදේ මොකක් හරි ප්‍රශ්නෙකින් ඉන්න බවක් පෙන්නුව ද ? ''

''නෑ සර්!'' '' ඒත් බ්‍රිස්ටල් වලදී ඇයගේ විදිය වෙනස් උණා ද?'' ''ඔව්, සර්, හරි ප්‍රශ්නෙකින් හිටියේ ඇය කියන දෙය ඇය දැනගෙන හිටියෙත් නැහැ .'' ''ඇය හරියටම කිව්වේ මොකක් ද?'' ''හොඳයි, සර්, මට මතක විදියට ඇය කිව්වා: ''මේසන්, මට සැලැස්ම වෙනස් කරන් වෙනවා. කරන්න දෙයක් තියෙනවා - ඒ කිව්වේ මම මෙතැනින් බහින්නේ නැහැ. මම දිගටම යනවා. බෑග් ටික එළියට අරගෙන ඒවා බෑග් තියන තැනින් තියන්න; ඊටපස්සේ තේ ටිකක් බොන්න, ස්ටේෂමේ මම එනකම් ඉන්න.''

https://sinhalatranslationsofoldetectivestories.blogspot.com

''මැඩම් ඒක මම එනකම් මෙතන ඉන්න නේ ද?'' මම ඇසුවෙමි. ''ඔව් ඔව් එහෙම තමයි කිව්වේ. මම එනකම් ස්ටේෂමෙන් යන්න එපා. මම ආපහු කෝච්චියෙන්ම ආපහු එනවා. වෙලාවක් කියන්න බැහැ. ඒත් වැඩිය පරක්කු වෙන්නේ නැහැ.'' '' 'හොඳයි, මැඩම්, 'මම කිව්වා, එතන ප්‍රශ්න අහන්න පුළුවන් තැනක් නෙවෙයි ඒත් මට තේරුණා ඒකෙ අමුත්තක් තියෙන බව.''

sinhalaebooks.com

"ඒක ඔබේ ස්වාමි දුවගේ විදිය නෙවෙයි, එහෙම නේ ද?" " ඔව් සර්. " "ඔබ හිතන්නේ ඒ ගැන හිතන්නේ මොකක් ද?" "හොඳයි, සර්, මම හිතන්නේ ඒකට ඒ පෙට්ටියේ හිටපු මහත්මයාත් සම්බන්ධයි. ඇය ඔහුට කතා කළේ නැහැ, ඒත් ඇය කියනවා හරි ද කියලා අහන්න වගේ ඇය දෙපාරක් ඒ පැත්තට හැරුණා. " "ඒත් ඔබ ඔහුගේ මූහුණ දුටුවේ නැද්ද?" "නෑ සර්; ඔහු හැම වෙලාවෙම මට පිටුපාලයි හිටියේ. " "ඔබට ඔහුව විස්තර කරන්න පුවවන් ද? "

"ඔහු සැහැල්ලු අඳුරු තැඹිලි පාට පිට කබායක් ඇඳලා ගමන් යද්දී දාන කැප් තොප්පියක් දාගෙන හිටියා. ඔහු උසයි හීන්දෑරියි. හිස පිටුපසින් අඳුරුයි වගේ " "ඔබ ඔහුව දන්නව ද?" "අනේ නෑ,මම හිතන්නේ නැහැ, සර්." " ඒ ඔබේ ස්වාමියා කැරිංටන් මහත්මයා වෙන්න බැරි ද?" මේසන් පුදුමයට පත් විය. "ඔහ්, මම එහෙම හිතන්නේ නැහැ, සර්!"

"ඒත් ඔබට විශ්වාස නැහැ නේ ද? " "ඔහු මහත්මයාගේ ශරීර ප්‍රමාණය වගෙයි, සර්, ඒත් මම හිතුවේ නැහැ ඒ වෙලාවේ ඒ ඔහු වෙන්න පුළුවන් කියලා. අපි එයාව කලාතුරකින් තමයි දැක්කේ. . . ඒත් මට කියන්න බැහැ ඒ *ඔහු නෙවෙයි* කියලා! " පොයිරෝ නැමී බුමුතුරණෙන් ඇල්පෙනෙත්තකු අහුළා ගෙන එය දෙස රවා බැලුවේ ය. ඉන්පසු ඔහු තවදුරටත් මෙසේ ඇසුවේ ය. " ඔබ මැදිරියට එන්න කලින් මිනිහට බ්‍රිස්ටල්වලින් කෝච්චියට නගින්න පුළුවන් ද? "මේසන් හිතා බැලුවා ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔව්, සර්, මම හිතනවා. මම හිටපු පෙට්ටියේ හරි තදබදයක් තිබුණ නිසා මට එළියට එන්න විනාඩි කීපයක් ගත වුණා වේදිකාව දිගේ එද්දීත් මට සෙනඟ නිසා ටික වෙලාවක් පරක්කු වුණා. "ඒත් ඔහුට ස්වාමි දූව එක්ක කතා කරන්න ලැබෙන්න ඇත්තේ විනාඩි කීපයක් විතරයි. මම ඒක නිසා හිතන්නේ ඔහු කොරිඩෝව දිගේ එන්න ඇති." " ඇත්තෙන්ම ඒක තමයි ගොඩක් වෙලාවට වෙන්න ඇත්තේ." ඔහු විරාමයක් තැබුව ද තවමත් රවාගෙන මෙන් සිටියේ ය.

"සර්, ඔබ දන්නවද ස්වාමි දූව ඇඳගෙන හිටිය විදිය?" "පත්තරවල විස්තර කීපයක් තිබුණා, නමුත් ඔබ ඒවා තහවුරු කරනවනම් මම කැමතියි." "ඇය සුදු හිවල් හමෙන් කරපු තොප්පියකුයි සුදු තිත් තිබෙන වේලයක් පැළඳගෙන හිටියා සර් ඇදුම් විදියට ඇඳන් හිටියේ ලා නිල් පාට යන්තම් වැටීගෙන යන ලොම් රෙද්දෙන් කරපු නිල් පාට කබායකුයි සායකුයි. "

" ගොඩක් ආකර්ෂණීයයි." "ඔව්," හැලිඩේ මහතා පැවසීය. "පරීක්ෂක ජැප් හිතනවා ඒක අපරාධය වෙච්ච විදිය හොයාගන්න උදව්වක් වේවි කියලා. මොක ද ඇයව දකින ඕන කෙනකුට ඇයව මතක හිටිනවා. " "*අනිවාර්යයෙන්!* "ස්තූතියි, මෙනෙවිය." සේවිකාව කාමරයෙන් පිටව ගියා ය. "හොඳයි" පොයිරෝ ප්‍රාණවත්ව නැගිට්ටේ ය. "මට මෙතැනදී කරන්න පුළුවන් එච්චරයි. තවදෙයක් මහතමයා, මම ඔබෙන් ඉල්ලුවා ඔක්කොම කියන්න කියලා ඒත් *ඔක්කොම!* "මම එහෙම කළා."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔබට විශ්වාසද?" "අනිවාර්යයෙන්." "එහෙනම් තවත් කියන්න දෙයක් නැහැනේ. මම පරීක්ෂණය භාරගන්නේ නැහැ." "ඇයි?" "ඔබ මාත් එක්ක හදවතින් කථා කළේ නැති නිසා." "මම ඔබට සහතික වෙන්නම්" "නැහැ, ඔබ දෙයක් තියා ගන්න." මොහොතක් කල්පනා කිරීමෙන් අනතුරුව, හැලිඩේ ඔහුගේ සාක්කුවෙන් කඩදාසියක් ගෙන මගේ මිතුරාගේ අතට දුන්නේය.

"මම හිතන්නේ ඒ තමයි ඔයා පොයිරෝ මහත්මයා, මට හිතාගන්න බැරි ඔබ කොහොම ද ඒක දැනගත්තේකියලා! " පොයිරෝ සිනාසෙමින් කඩදාසිය දිග හැරියේ ය. එය සිහින් ඇලකුරින් ලියන ලද ලිපියකි. පොයිරෝඑය ශබ්ද නඟා කියෙව්වේ ය.

මට ඔබ හමුවීමට වෙලාවක් ලබා දීම ගැන ස්තූතියි.

මීට ආමන්ඩ් ඩිලෝ රොචෙෆෝර්.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

පොයිරෝ හිස නමා ගෞරව කරමින් ලිපිය නැවත හැලිඩේට භාර දුන්නේය. "මම හිතන්නේ මේක ගැන ඔබ දැනන් හිටියේ නැහැ නේ ද? " "ඒක මට අකුණු පාරක් වගේ උණා! මේ ලිපිය මගේ දූවගේ අත් බෑගයේ තිබ්ලයි මට හම්බවුනේ. ඔබ බොහෝ විට දැනගන්න, පොයිරෝ මහත්තයා, මෙම බොරුකාර සිටුවරයා හිතාගන්න පුළුවන් නරකම විදියේ කෙනෙක්. " පොයිරෝ හිස වැනුවේ ය.. "ඒත් මට දැන ගන්න ඕන ඔබ මේ ලියුම ගැන දැනගත්තේ කොහොම ද?" මගේ මිතුරා සිනාසුණේ ය.

sinhalaebooks.com

“ මහත්මයා, මම එහෙම කළේ නැහැ. ඒත් රහස් පරීක්ෂකයෙකු වුණාට අඩි සටහන් පස්සේ යන්නයි සිගරට් අළු හඳුනාගන්නයි විතරක් පුළුවන් වුණාට මදි. ඔහු හොඳ මනෝ විද්‍යාඥයෙකු වෙන්න ඕන!”“ මම දැනන් හිටියා ඔබ ඔබේ බෑණාට කැමති නැති බවත් ඔබ ඔහුව අවිශ්වාස කරන බවත් ඔබේ දියණියගේ මරණෙන් ඔහු තමයි වාසි ලබන්නේ; සේවිකාවගේ විස්තරයේ විදියට අර මිනිහා ඔහුගේ පෙනුමට සමානයි.

ඒත් ඔබ ඒ ගැන උනන්දු වුණේ නැහැ! ඇයි? අනිවාර්යයෙන්ම ඔබගේ සැකය වෙන කෙනෙක් දිහාවටයි තියෙන්නේ. ඒ නිසා ඔබ දෙයක් හංගගෙන ඉන්නවා. ” “ ඔයා හරි, පොයිරෝ මහත්තයා. මේ ලියුම හම්බවෙනකම් මම රූපට්ව තමයි සැක කළේ ඒත් මේක මාව වෙන පැත්තකට හැරෙව්වා.”

"ඔව්. සිටුවරයා කියන්නේ 'බොහෝ කාලෙකට පස්සේ, සමහර විට ඔබ හිතුවට වඩා ඉක්මනින්' කියලා. අනිවාර්යයෙන් ඔබ දැනගන්නකන් ඉන්න ඔහුට උවමනාවක් තියෙන්නේ නැතිව ඇති. එතකොට දොළහයි දාහතරේ කෝච්චියෙන් ලන්ඩන්වලින් පිටවෙලා ගිහින් ඔබේ දුවගේ පෙට්ටියට කොරිඩෝව දිගේ ඇවිල්ලා තියෙන්නනේ ඔහු ද? මට මතක විදියට නම් රොචෙෆෝර් සාමිවරයා කළුයි උසයි! ” කෝටිපතියා හිස වැනුවේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"හොඳයි, මහත්මයා, මම ඔබට සුබ දවසක් ප්‍රාර්ථනා කරමි. ස්කොට්ලන්ඩ්යාඩ්වල ආභරණවල ලැයිස්තුවක් තියෙනව ද?" "ඔව්, මම හිතන්නේ ඔබ දකින්න කැමතිනම් පරීක්ෂක ජැප් දැන් මෙහේ ඉන්නවා."

IV

ජැප් අපගේ පැරණි මිතුරෙකු වූ අතර, පොයිරෝ ඔහුව පිළිගත්තේ ය. "කොහොමද ඔබට පොයිරෝ මහත්මයා? අපි අතරේ ඉතින් තරහක් නැහැනේ, ඒ වුණත් අපි දෙයක් දිහා බලන විදියේ නම් වෙනසක් තියෙනවා. 'ඔබේ මොළේ' ට කොහොම ද? වැඩෙනව ද? " පොයිරෝ ඔහු දෙස බලා හිනැහුණේය. "ඒවා ක්‍රියාත්මකයි, මගේ හොඳ ජැප්; ඒක ඇත්තෙන්ම හොඳට වැඩ කරනවා! "

"එහෙනම් ඒක හරි. ඒකෙන් හිතල බලන්න රූපට් මහත්මයා ගෞරවනීය කෙනෙක් ද? නැත්නම් වංචාකාරයෙක් ද කියලා. අපි සමහර තැන්වලට නිතරම ඇහැ ගහගෙනයි ඉන්නේ, ඇත්තෙන්ම අපි දන්නවා එක්කෝ අපරාධකාරයා කැමැත්තෙන්ම භාර වේවි එහෙමත් නැතිනම් ඔහු හපන්කම ගැන කියවන්න ගිහිල්ලා අහුවේවි." ඒක නෙවෙයි. මම මේ බලන්නේ ඊයේ රූපට් කැරිංග්ටන් කොහෙ ද හිටියේ කියලා හොයාගන්න. ඒ ගැන හොයාගන්න අමාරුයි වගෙයි පේන්නේ."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

“මම ඔහු දිහා බලාගෙන ඉන්න මිනිහෙක් දාලයි ඉන්නේ.” “හොඳ කලින් පරිස්සම් වීමක්, ඒත් සමහර විට දවසක් ප්‍රමාදයි” කියා පොයිරෝ මෘදු ලෙස යෝජනා කළේ ය. “ඔබයි ඔබේ විහිළුයි පොයිරෝ මහත්මයා, හොඳයි, මම පැඩිංටන්වලට මාරුවුණා. බ්‍රිස්ටල්, වෙස්ටන්, ටෝන්ටන් ඒක තමයි මගේ බීට්ටුව.ගොඩක් ලොකුයි." “ඔබ වැඩට ගිහිල්ලා හවසට ඇවිත් මට විස්තර කියනව ද ?” “අනිවාර්යෙන්ම, මම ආපහු ආවොත්.“හොඳ පරීක්ෂකවරයෙක් ක්‍රියාවෙන් තමයි වැඩ කරන්නේ” කියා අපේ මිතුරා යන විට පොයිරෝ මිමිණීය.

"ඔහු මුර සංචාර යනවා; ඔහු අඩි සලකුණු මනිනවා; මඩ සහ සිගරට් අළු එකතු කරනවා! ඔහු ගොඩක් කාර්යබහුලයි! ඔහු වචනයෙන් කියන්න බැරි තරම් උද්‍යෝගමත් ! මම ඔහුට මනෝ විද්‍යාව ගැන කිව්වොත්, ඔහු කියන දේ ඔයා දන්නව ද, මගේ යාවවා? ඔහු හිනාවේවි! ඔහු එයාටම කියාගනීවි: ‘දුප්පත් පරණ පොයිරෝ! ඔහු වයසට ගිහිල්ලා! ඔහු දැන් වයසයි! ' ජැප් කියන්නේ ‘තරුණ පරම්පරාව දොරට තට්ටු කරනවා’ලු .' *ඔවුන් විශිෂ්ටයි !* ඒත් වැඩේ කියන්නේ ඔවුන් තට්ටු කරමින් ඉන්නවා ඔවුන් දකින්නේ නැහැ දොර ඇරලා තියෙන බව. ”

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ඔයා මොනව ද කරන්න යන්නේ?" "අපිට තියෙනවා අපිට ඕන විදියට කටයුතු කරන්න බලයක්, මම කෝල් එකක් ගන්න සත තුනක් වියදම් කරනවා සිටු ගෙයකට කථා කරන්න. ඔයා අර කියපු අපේ සාමිවරයාට. ඊට පස්සේ, මගේ කකුල් තෙත් බැහැලා දෙපාරක් කිවිසුම් ගිය නිසා, මම කාමරේට ගිහින් හර්බල්(ඖෂධීය) තේ එකක් බිබී ස්ප්‍රීතු ලාම්පුව ගාවට වෙලා ඉන්නවා. "

V

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

පසුදා උදෑසන වන තෙක් මම නැවතත් පොයිරෝව දුටුවේ නැත. ඔහු උදේ ආහාරය සන්සුන්ව ගනිමින් සිටිය දී මට ඔහු සොයා ගැනීමට හැකිවිය. "හොඳයි?" මම උනන්දුවෙන් විමසුවෙමි. මොකද උණේ? " "මුකුත් නැහැ." "ඒත් ජැප්?" "මම ඔහුව දැක්කේ නැහැ." "සිටුවරයා?" "ඔහු පෙරේ දා ගෙදරින් ගිහිල්ලා." "මිනීමැරුම වෙච්ච දවසේ නේ ද?" "ඔව්." "එහෙනම් ඒක ඉවරයි! රූපට් කැරිංග්ටන් නිදහස්. "

"රොචෙෆෝර් සිටුවරයා ගෙදරින් ගිය නිසා ද?, මගේ යාළුවා, ඔයා ඉක්මන් වැඩියි. " "කොහොම හරි ඔහුව අල්ලගත්තයි කියමු ඒත් ඔහු පෙළඹෙන්න හේතුව මොකක් ද? "

sinhalaebooks.com

“ඩොලර් ලක්ෂයක් වටින ආභරණ ඕන කෙනෙකුට පෙළඹෙන්න හොඳ හේතුවක් . ඒත් මට තියෙන ප්‍රශ්නය තමයි: ඇයි ඇයව මරන්නේ? නිකම්ම ආභරණ සොරකම් කළේ නැත්තේ ඇයි? ඇය නඩු කියන්නේ නැහැ. ”

“ඇයි නැත්තේ?” “ඇය කාන්තාවක් නිසා *මගේ යාළුවා.* ඇය වරක් මෙම මිනිහට ආදරය කළා. ඒ නිසා ඇය ඒ පාඩුව නිහඬව විඳගන්නවා. සිටුතුමා කාන්තාවන්ගේ ගති ගැන හොඳ විශේෂඥයෙක් - ඒ නිසා ඔහු ඒක හොඳින්ම දන්නවා! අනෙක් අතට, රූපට් කැරිංග්ටන් ඇය මරා දැම්මොත් ඔහුව අනිවාර්යයෙන් වරදකරු කරන්න පුළුවන් ආභරණ රැගෙන යන්නේ ඇයි? ” “අන්ධයෙක් වගේ.”

“සමහරවිට ඔයා හරි වෙන්න පුළුවන්, මගේ යාළුවා. ආහ්, මෙන්න ජැප්! ඔහු තට්ටු කරන එක මට අඳුන ගන්න පුළුවන්” පරීක්ෂකවරයා හොඳ සිනහවකින් යුතුව කතා කරමින් සිටියේ ය. “සුභ උදෑසනක් පොයිරෝ මහත්මයා, මේ ආපහු ආවා විතරයි. මම හොඳ වැඩ ටිකක් කළා! එතකොට ඔයා?" “මම, මම මගේ අදහස් ටික පිළිවෙලකට හදාගත්තා,” පොයිරෝ පැහැදිලිව පිළිතුරු දුන්නේ ය. ජැප් හදවතින් සිනාසුණේ ය.

“පරණ හාදයෝ අවුරුදු ගාණක් තිස්සේ පුරුදු වුණ විදිය,” ඔහු හුස්මක් හෙලුවේ ය. “ඒක අපිට ඒ කිව්වේ තරුණ පරම්පරාවට වැඩ කරන්නෙ නෑ, ” ඔහු ශබ්ද නඟා පැවසීය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"*අනුකම්පාව ඕන ද?*" පොයිරෝ විමසී ය. "හොඳයි, මා කරපු දේවල් ඔබට දැනගන්න ඕන ද?" "ඔබ මට අනුමාන කරන්න අවසර දෙනව ද? අපරාධය කරපු පිහිය ඔබ හොයාගත්තා, වෙස්ටන් සහ ටෝන්ටන් අතර ඇති දුම්රිය මාර්ගයේ පැත්තක තිබිලා, ඔබ වෙස්ටන්වලදී කැරිංග්ටන් මහත්මිය එක්ක කතා කරපු පත්තර විකුණපු ළමයාගෙන් ප්‍රශ්න කළා! " ජැප්ගේ කට වැසී ගියේ ය.

"ඔබ මොන ලෝකෙන් ද ඒක දැන ගත්තේ? ඔබේ මොළේ කියලා කියන්න එපා! " "ඒක තාමත් හොඳට වැඩෙයි කියලා පිළිගන්න එක වරදක් නෙවෙයි! මට කියන්න, ඇය පත්තර විකුණන කොල්ලට සිලිමක් දුන්න ද? " "නැහැ, ඒ ක්‍රවුන් භාගයක්!" ජැප් ආවේගය මැඩගෙන සිනාසුණේ ය. " සල්ලි තියෙන ඇමරිකානුවන්ගේ වියදම හොඳටම වැඩියි ! " " ඒ නිසා පිරිමි ළමයාට ඇයව මතක හිටින්න ඇති නේ ද?" "අනිවාර්යයෙන්ම. මොක ද ඔහුට හැමදාම ක්‍රවුන් භාග හම්බ වෙන්නේ නැහැ."

"ඇය ඔහුට කථා කරලා සඟරා දෙකක් සල්ලි දීලා අරන්. එකක කවරයේ නිල් පාටින් ඇඳන් ඉන්න ගැහැණු ළමයෙකුගේ පින්තූරයක් තිබිලා. 'ඒක මට ගැළපේවි' ඇය කියලා. ඔහ්, ඔහු ඇයව හොඳට මතක තිබිලා නැහැ. හොඳයි, ඒක මට ඇති. වෛද්‍යවරයාගේ සාක්ෂියේ විදියට අනිවාර්යයෙන්ම මිනීමැරුම වෙලා තියෙන්නේ ටෝන්ටන්වලට කලින්."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"මම හිතන්නේ ඔවුන් එවෙලේ ම පිහිය විසි කරන්න ඇති, රේල් පාර දිගේ ඒක හොය හොය ගියා හිතපු විදියටම ඒක එතැනින් හම්බවුණා;. මම අපේ මිනිහා ගැන ටෝන්ටන්වලදී අහල බැලුවා, ඒත් ඇත්තෙන්ම ඒක ලොකු ස්ටේසමක් වෙච්ච නිසා ගොඩක් අය ඔහුව දකින්නේ නැතිව ඇති. සමහරවිට ඔහු පස්සේ කෝච්චියකින් ලන්ඩන්වලට එන්න ඇති." පොයිරෝ හිස වැනුවේ ය. "ගොඩක් වෙලාවට වෙන්න පුළුවන්."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

"මම ආපහු ආවාම මට තව දෙයකුත් දැන ගන්න ලැබුණා. ඔහු ආභරණවලින් ගැලවෙන්න උත්සහ කරනවා, හරි! ඊයේ රෑ ලොකු මරකත මැණිකක් උකස් කරලා ආභරණ පෙට්ටියේ එකක්. ඔයා හිතන්නේ ඒ කවුද? " " ඔහු මිටි මිනිහෙක් කියන්න විතරයි මට පුළුවන්. " ජැප් විමතියෙන් බැලුවේ ය. "හොඳයි, ඔබ එතනදී හරි. ඔහු තරමක් මිටියි. ඒ රතු නාර්කි. "

"රතු නාර්කි කියන්නේ කවුද?" මම ඇසුවෙමි. "ප්‍රසිද්ධ මැණික් හොරෙක්, සර්. ඒ වුනත් සාමාන්‍යයෙන් මිනීමැරුම් කරන කෙනෙක් නෙවෙයි. ග්‍රේසි කිඩ් කියලා ගෑණු කෙනෙක් එක්ක තමයි සාමාන්‍යයෙන් වැඩ කරන්නේ; ඒත් ඇය මේ වෙලේ පේන්න ඉදලා නැහැ - ඇය හොරබඩුත් එක්ක ඕලන්දයට යන්න ඇති. " "ඔබ නාර්කිව අත්අඩංගුවට ගත්තා ද?"

sinhalaebooks.com

“අනිවාර්යයෙන්. ඒත් මතක තියාගන්න, අපට ඕන අනෙක් මිනිහා. කැරිංග්ටන් මහත්මියත් එක්ක කෝච්චියේ ගිහිපු මිනිහා. ඔහු තමයි වැඩේ සැලසුම් කළේ.ඒත් නාර්කි යාළුවන්ව පාවාදෙන්නේ නැහැ. ” මම පොයිරෝගේ දෑස් කොළ පැහැයෙන් බැබළෙනු දුටුවෙමි.

“මම හිතන්නේ මට නාර්කිගේ යාළුවාව හොයලා දෙන්න පුළුවන් වේවි” “ඔබේ පොඩි අදහස්වලින් එකක් නේ ද?” ජැප් පොයිරෝ දෙස තියුණු ලෙස බැලුවේ ය. “මට පුදුම ඔබ මේ වයසත් එක්ක අපිට ඕන කරන අය කොහොම අල්ලලා දෙනව ද කියලා . ” “සමහරවිට” මගේ මිතුරා මිමිණීය. “හේස්ටිංග්ස්, මගේ තොප්පියයි. බුරුසුවයි දෙන්න. තව තාමත් එළියේ වහිනවම් මගේ රබර් සපත්තුත් දෙන්න,මොක ද අපි අර තේ එකෙන් ගත්ත ගුණේ ආයි නැති කරගන්න ඕන නෑනේ. *සුබ පැතුම්*, ජැප්! ”

“ඔබටත් සුබ පැතුම්, පොයිරෝ මහත්මයා.” පොයිරෝ අපට හමු වූ පළමු කුලී රථයට අඬගැසූ අතර රියදුරු පාක් පටුමගට රථය යොමු කළේය. අපි හැලිඩේගේ නිවස ඉදිරිපිටට එන විට, ඔහු රථයෙන් එළියට බැස, රියදුරාට මුදල් ගෙවීමෙන් අනතුරුව සීනුව නාද කළේ ය. දොර විවර කළ සේවක ළමයාට ඔහු පහත් හඬින් ඉල්ලීමක් කළ අතර අපව වහාම උඩු මහලේ තිබූ කුඩා පිළිවෙලට තිබූ නිදන කාමරයකට ඇරලවන ලදී.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

පොයිරෝගේ දැස් කාමරය පුරා සැරිසරා ඉක්මනින්ම කුඩා කළු පැහැති ට්‍රන්ක පෙටට්ටියක් අසල නතර විය. ඔහු එය ඉදිරිපිට දණ ගසා එහි ඇති ලේබල් සියුම්ව පරීක්ෂා කළේ ය. මීළඟට ඔහු ඔහුගේ සාක්කුවෙන් අඹරාගත් කම්බියක් එළියට ගත්තේ ය . "හැලිඩේ මහත්මයාට මෙතන දී මාව හමුවෙන්න පුළුවන් ද කියලා අහන්න," ඔහු උරහිසට උඩින් බලා සේවක ළමයාට පැවසුවේ ය. මිනිසා පිටත්ව ගිය සැණෙන්, පොයිරෝ ට්‍රන්ක පෙට්ටියේ අගුල සමග හරඹ කරන්නට විය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

මිනිත්තු කිහිපයකින් අගුල ඇරුණු අතර පොයිරෝ එහි පියන ඔසවා එහි තිබූ ඇඳුම් පරීක්ෂා කරමින් ප්‍රවේශමෙන් ඒවා බිමින් තැබුවේ ය. පඩි පෙළෙන් බර පියවර හඬක් ඇසුණු අතර හැලිඩේ කාමරයට ඇතුළු විය " ඔබ මොකක් ද මේක අස්සේ ඉඳන් කරන්නේ?" ඔහු විමතියෙන් බලා සිටියේ ය." " මම මේ බැලුවේ මේවා දිහා" පොයිරෝ සුදු හිවල් හමෙන් කරන ලද හිස්වැස්මක් සහ දීප්තිමත් නිල් පාට කබායක් සහ සායක් පෙන්නුවේ ය. කිසිවෙකු "ඔයා මගේ ට්‍රන්ක පෙට්ටියත් එක්ක මොනව ද කරන්නේ?" යැයි ඇසුවේ ය.

හැරී බැලූ මා දුටුවේ ජේන් මේසන් කාමරයට ඇතුළු වී ඇති බවයි. "දොර වහනව ද, හේස්ටිංග්ස්. ස්තුතියි. දැන් ඒකට පිට තියාගෙන ඔයා ඔතනම ඉන්න. දැන්, හැලිඩේ මහත්මයා, මම ඔබට ග්‍රේසි කිඩ්ව හඳුන්වා දෙන්නම්, නැතිනම් ජේන් මේසන්, නැවතත් ඉක්මනින්ම පරීක්ෂක ජැප්ගේ කාරුණික ආරක්ෂාව යටතේ ඉන්න රෙඩ් නාර්කිට එකතු වෙන්න පුළුවන් වේවි ඔබට. "

sinhalaebooks.com

VI

පොයිරෝ අතක් වැනී ය. "ඒක ගොඩක් සරලයි!" ඔහු තවත් අහංකාර විය. "තමන්ගේ ස්වාමි දුව ඇඳන් හිටපු ඇඳුම් ගැන සේවිකාව ගොඩක්ම සැලකිලිමත් වුණු එක තමයි මට මුලින්ම දැණුනේ. මොක ද සේවිකාව ඒලොයිසී මෙනෙවිය ඇඳන් හිටපු ඇඳුම් ගැන අපේ අවධානය යොමු කරන්න මෙච්චර උනන්දු වුණේ? මට පෙණුනා බ්‍රිස්ටල්වල දී මැදිරියේ ඉඳපු මිනිහා ගැන තියෙන්නේ සේවිකාවගේ වචනය විතරයි. වෛද්‍යවරයාගේ සාක්ෂියත් එක්ක ගත්තත්, කැරිංග්ටන් මහත්මිය බ්‍රිස්ටල්වලට එන්න කලින් මරාදාන්න ඉඩකඩක් තියෙනවා."

"ඒත් එහෙම නම් සේවිකාවත් හවුල්කරුවෙක් වෙන්න ඕන. ඇය සහකාරියක් නම්, මේ සිද්ධියට ඇයගේ සාක්ෂිය විතරක් තියෙනවට ඇය කැමති වෙන්නේ නැහැ. කැරිංග්ටන් මහත්මිය ඇඳන් හිටිය ඇඳුම් කැපී පේනවා. සාමාන්‍යයෙන් සේවිකාවකට ඇගේ ස්වාමි දුව අඳින ඇඳුම් පැළඳුම් ගැන දැනීමක් තියෙනවා.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

" දැන්, බ්‍රිස්ටල් වලින් පස්සේ, කවුරුහරි දීප්තිමත් නිල් පැහැති කබායකුයි සායකුයි හිවල් ලොම් තොප්පියකුයි ඇඳන් ඉන්න ගැහැණු කෙනෙක් දැක්කනම් ඔහු කැරිංග්ටන් මහත්මිය දැක්කයි කියලා දිවුරනවා. "මම අපරාධය ආපහු නිර්මාණය කරන්න පටන්ගත්තා. සේවිකාව තමාම ඒ වගේ ඇඳුම් ටිකක් හොයාගන්නවා. ඇය ලන්ඩන්වල ඉඳන් බ්‍රිස්ටල් යන

sinhalaebooks.com

අතර දී උමගක වාසිය අරන් කැරිංග්ටන් මහත්මියව ක්ලෝරෝෆෝම්වලින් සිහි නැති කරලා පිහියෙන් ඇන්නා. ඇගේ සිරුර ආසනයක් යටට පෙරළුවා.”

“සේවිකාව ඇගේ තැන ගත්තා. වෙස්ටන්වල දී ඇය කැපිලා පේන්න ඕන. කොහොම ද? ගොඩක් වෙලාවට පත්තර විකුණන ළමයෙක් තෝරගන්න පුළුවන්. ඇය ඔහුට ලොකු මුදලක් දීලා ඇයව මතක හිටින විදියට සැලැස්සුවා. ඊට පස්සේ ඇගේ ඇඳුම් ගැන මතක හිටින්න සැලැස්සුවා සඟරාවක් තෝරගෙන.

“ වෙස්ටන්වලින් පිටවුණාම ඇය පිහිය විසි කරනවා. මිනීමැරුව වුණේ මේ හරියෙදියි කියලා හිතෙන්න.ඇය ඇඳුම් මාරුකරන්න ඇති නැත්නම් ඊට උඩින් දිග වැහි කබායක් ඇඳගන්න ඇති. ටෝන්ටන්වලදී ඇය කෝච්චියෙන් බැහැලා පුළුවන් වුණු ගමන් බ්‍රිස්ටල්වලට එනවා, ඇගේ සහයකයා හරි වෙලාවට ගමන් මළු ටික ගමන් මළු තියන තැනින් තියලයි තියෙන්නේ.

ඔහු ටිකට් එක ඇයට බාර දීලා ලන්ඩන්වලට එනවා. ඇය වේදිකාවට වෙලා ඉඳලා ඇගේ කොටසත් ඉවර කරලා ඇය කිව්ව විදියට රාත්‍රිය ගත කරන්න හෝටලයකට ගිහින් උදේ ලන්ඩන්වලට එනවා. “ජැප් ගිහිල්ලා ආවාම, ඔහු මගේ ඔක්කොම අනුමාන තහවුරු . ඔහු මට කිව්වා ප්‍රසිද්ධ හොරෙක් ආභරණ උකස් කරන බවක්. මම දැනන් හිටියා ඒ කවුරු උණත් ජේන් මේසන් කිව්ව මිනිහගේ විස්තරේ අනිත් පැත්ත කියලා. ඔහු කිව්වම ඒ රෙඩ් නාර්කි කියලා මම

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

දැන ගත්තා ග්‍රේසි කිඩ්ව හොයාගන්න පුළුවන් කොහෙන් ද කියලා. ”

“ එතකොට සිටුතුමා?” “මම ඒ ගැන හිතද් දී මට ඒත්තු ගියා ඔහුගේ සම්බන්ධයක් මේකට නැති බව. ඔහු ඔහුව මේකට ගෑවෙයි කියලා බය වෙලයි හිටියේ. ඒකයි ඔහු සිටු මැදුරෙන් ගියේ.” “හොඳයි, පොයිරෝ මහත්මයා, මම ඔබට ගොඩක් ණයයි. දිවා ආහාරයෙන් පස්සේ මම ලියන චෙක් එකෙන් පස්සේ ඒක පියවන්න පුළුවන් වේවි. ” පොයිරෝ නිහතමානීව සිනාසෙමින් මට මිමිණීය. “හොඳ ජැප්, ඔහුට නිල ගෞරවය ගන්න නම් පුළුවන්. හරි, ඔහුට ඔහුගේ ග්‍රේසි කිඩ් ලැබුණත්, මම හිතන්නේ ඇමරිකානුවන් කියන විදියට මම ඔහුගේ එළුවාව ගත්තා! ”

නිමි. . .

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

04. ග්‍රෑන්ඩ් මෙට්‍රොපොලිටන්හි සිදුවීමක්

"A Jewel Robbery At The Grand Metropolitan" ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරන ලද්දේ "The Curious Disappearance of the Opalsen Pearls" ලෙස *ද ස්කෙච්හි,* 1923 මාර්තු 14 කලාපයේ දී ය.

"පොයිරෝ," මම කිව්වෙමි. "වටපිටාව වෙනස් වෙන එක ඔබට හොඳයි." "ඔයා ගොඩක් හිතනවා *මගෙ යාළුවා?"* "මට ඒ ගැන විශ්වාසයි. " "එහ්?" මගේ මිතුරා සිනාසෙමින් පැවසීය. "ඒ ඔක්කොම ලෑස්ති ද?" "ඔබ ඒවි?" ඔබ මාව එක්කන් යන්න හදන්නේ කොහේ ද? ""බ්‍රිටන්වලට, ඇත්ත වශයෙන්ම, නගරයේ මගේ යාළුවෙක් මට හොඳ අදහසක් දුන්නා, මට වියදමට සල්ලි තියෙනවා. මම හිතන්නේ ග්‍රෑන්ඩ් මෙට්‍රොපොලිටන් හෝටලයේ සති අන්තයක් ගත කරන එක තමයි හොඳම දේ."

"ස්තූතියි, මම ගෞරවයෙන් පිළිගන්නවා. වයසක මනුස්සයෙක් ගැන හිතන්න තරම් ඔබට හොඳ හදවතක් තියෙනවා. ඔව්, ඔව්,මම හිතන්නේ මේක ඔබට අමතක නොවුණොත් හොඳයි."මම ඒ ව්‍යංගය ගැන සතුටු නොවුණෙමි. මට නොයෙක්වර පොයිරෝ මාගේ මතක ධාරිතාවය අවතක්සේරු කරන බව හැඟී තිබුණි. නමුත් ඔහුගේ සතුට කොතරම් ද යත් මම ඒ සිදුවුණ ස්වල්ප ගැහැට ගැන සිතීම නතර කළෙමි .

"එහෙනම්, ඒක හරිනේ" මම ඉක්මනින් ඇසුවෙමි. සෙනසුරාදා දින සැඳෑවේ දී අප සුදු ජාතිකයින් අතරේ අසුන් ගෙන රාත්‍රී ආහාරය ගනිමින් සිටියෙමු. මුළු ලෝකයාම බ්‍රිටන් වලට එක් රැස් වී සිටින බවක් පෙනෙන්නට තිබුණි.

ඇඳුම් අනර්ඝතම ඒවා වූ අතර ආභරණ ගත් කළ සමහරක් බාහිර ඔපයට හෙවත් ප්‍රදර්ශනය සඳහා පැළඳගත් ඒවා විය. එසේ වුණ ද සමහරක් උත්කෘෂ්ට ඒවා විය. “ *හහ්,* ඇත්තෙන්ම හොඳ දර්ශනයක්!” පොයිරෝ මිමිණීය. “ මේක කළුකඩකාරයන්ගෙ නිවහනක්? එහෙම නෙවෙයි ද හේස්ටිංග්ස්? ” “මම හිතන්නේ එහෙම තමයි” කියා මම පිළිතුරු දුන්නෙමි.

“ඒත් අපි හිතමු ඔවුන් මිලාධික භාණ්ඩවලින් ඇඟම වසාගන්න එකක් නැතෙයි කියලා.” පොයිරෝ වටපිට බැලුවේය. “මෙතන තියෙන ආභරණ දැක්කහම මට හිතෙන්නේ රහස් පරීක්ෂණයට වෙනුවට මගේ මොළය හොරකමට යොදවන්න. ඇත්තටම හොරෙකුට කොච්චර ලොකු අවස්ථාවක් ද! හේස්ටිංග්ස් අර බලන්න, අර කණුව ළඟ ඉන්න මහත ගැහැණු කෙනා. ඇය ඒබ් කිව්ව විදියට මැණික් වලින් වැහිලයි ඉන්නේ . ”

මම ඔහු බලා සිටි දෙස බැලුවෙමි. “ඇයි ඉතින්?” “ඒ ඔපල්සන් මහත්මියනේ”. "ඔබ ඇය දන්නවාද?" “ටිකක් විතර, ඇගේ ස්වාමි පුරුෂයා තෙල් ආකාරවලින් ධනය උපයාගත් කොටස් තැරැව්කාරයෙක්. ” රාත්‍රී ආහාරයෙන් පසු අපි විවේකාගාරයේ සිටි ඔපල්සන් යුවළ පසුකරගෙන යන විට මම ඔවුන්ට පොයිරෝ හඳුන්වා දුන්නෙමි.

අප මිනිත්තු කිහිපයක් කථාබහ කල අතර එය කෝපි පානය ගැනීමෙන් අවසන් විය. පොයිරෝ ඔපල්සන් මහත්මියගේ මිල අධික මැණික් වර්ග කිහිපයක් වර්ණනා කරමින් වචන කිහිපයක් පැවසීය. ඇය එකවරම ප්‍රීතිමත් විය .

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"එය මගේ ආසම විනෝදාංශයක් පොයිරෝ මහත්මයා. මම ආභරණවලට *කැමතියි* . එඩ් මගේ දුර්වලකම ගැන හැම දෙයක්ම දන්නවා. ඔහු එළියට ගියොත් මට මොකක් හරි අළුත් දෙයක් ගේනවා. ඔබ දුර්ලභ ගල්වලට කැමති ද? " "මට ඒවා එක්ක වැඩ කරන්න අවස්ථා ලැබිලා තියෙනවා.මගේ වෘත්තිය නිසා ලෝක ප්‍රසිද්ධ ස්වර්ණාභරණ එක්ක කටයුතු කරන්න ලැබිලා තියෙනවා."

ඔහු අන්වර්ථ නාමයන් යොදා වංශාධිපතියෙකුගේ ලෝක ප්‍රසිද්ධ ඓතිහාසික ආභරණ කිහිපයක් ගැන කෙටියෙන් විස්තර කළේ ය.ඒ අතරතුර ඔපල්සන් මහත්මිය මුව හයාගෙන අසා සිටියේ ය. ඔහු අවසන් කරන විට "ඒකමයි" ඇය කෑගැසුවාය. "ඒක නාට්‍යයක් වගේ! ඔබ දන්නවනේ, මටම අයිති දිග ඉතිහාසයක් තියෙන මුතු මාලයක් තියෙනවා. මම හිතන්නේ ඒක ලෝකයේ හොඳම මාලවලින් එකක්. ඒකෙ මුතු ඔක්කොම එකකට එකක් ගැළපෙනවා. ඒ වගේම පාට හොඳම මුතුවල පාට. මම හිතුවා උඩට ගිහින් ඒක අරන් එන්න."

පොයිරෝ විරෝධය පාමින් "ඔහ්, මැඩම්, ඔබ ගොඩක් සුහදයි. කරුණාකර ඔබ කරදර වෙන්න එපා! " යැයි පැවසුවේ ය. "ඔහ්, ඒ වුණත් මම ඒක ඔබට පෙන්වන්න කැමතියි." ඇය සෝපානය දෙසට සැහෙන තරම් කඩිමුඩියේ ගමන් කළේය. මා සමඟ කථාකරමින් සිටි ඇගේ සැමියා , පොයිරෝ දෙස විමසිල්ලෙන් බැලුවේ ය. "ඔබගේ බිරිඳ කොච්චර සුහද ද කියනවනම් ඇගේ මුතු මාලය මට පෙන්වන්න ඕන බවම කිව්වනේ. "ඔහ්, මුතු!" ඔපල්සන් මහතා තෘප්තිමත් ආකාරයකින් සිනාසුණේය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"හොඳයි, ඒවාට ඇත්තටම හොඳ පෙනුමක් තියෙනවා. ලොකු මුදලක් ගෙවන්න නම් වුණා! සල්ලි නම් ප්‍රශ්නයක් නෙවෙයි; මට ඒකට ගෙවපු මුදල කවදහරි වැඩිපුරත් එක්ක දවසක ගන්න පුළුවන්. සමහර විට තව තවත් මේ විදියටම දේවල් සිද්ධ වෙනවනම්. මුදල් නගරය ව්‍යාකූල කරනවා.ඔක්කොම මේ EPD නිසා." ඔහු අප නොදන්නා විෂයන් ගැන කථා කරන්නට විය. සේවක ළමයෙකු ඔහු වෙතට පැමිණ ඔහුගේ කනට යමක් මිමිණීය.

"එහ් - මොකක්? මම ඉක්මනට එන්නම්. ඇය අසනීප වෙලා නැහැ නේද? මහත්වරුනි, මට සමාවෙන්න. " ඔහු අප වෙතින් හදිසියෙන් නික්ම ගියේ ය. පොයිරෝ පිටුපසට ඇල වී ඔහුගේ කුඩා රුසියානු සිගරට් එකක් පත්තු කළේය. ඉන්පසු, ප්‍රවේශමෙන් හා ඉතා සූක්ෂම ලෙස හිස් කෝපි කෝප්ප පිළිවෙලට එක පේලියට තැබූ අතර ප්‍රතිඵලය දෙස සතුටු සහගතව බැලී ය.මිනිත්තු ගෙවී ගණන් ගෙවී ගියේය. ඔපල්සන් යුවළ ආපසු පැමිණෙන බවක් දක්නට නොලැබුණි.

" ඒක අමුතුයි" මම සඳහන් කළෙමි. මම මේ බැලුවේ ඔවුන් ආපහු එන්නේ කවද ද කියලා. " පොයිරෝ ඉහළ නගින දුම් වළලු දෙස බලා, කල්පනාකාරීව මෙසේ පැවසීය: "ඔවුන් එන්නේ නැහැ. " "ඒත් ඇයි?" "ඒ මොක ද කිව්වොත්, මගේ යාළුවා,දෙයක් සිද්ධ වෙලා." "මොන වගේ දෙයක්ද? ඔබ දන්නේ කොහොම ද?" මම කුතුහලයෙන් ඇසුවෙමි. පොයිරෝ සිනාසුණේය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"විනාඩි කීපයකට කලින් කළමණාකාරවරයා කාමරයෙන් එළියට ඇවිත් හදිස්සියෙන් උඩ තට්ටුවට දුවගෙන ගියා . ඔහු ගොඩක් කැළඹිලයි හිටියේ.සෝපාන ක්‍රියාකරන කෙනා සේවකයෙක් එක්ක බොහොම බැරෑරුම් කථාබහක් යෙදෙමින් හිටියා. සෝපාන සීනුව තුන්වතාවක් හැඬවුණත් ඔහු ඒක ගණන් ගත්තේ නැහැ. ඒ වගේම හැම වේටර් කෙනෙක්ම කැළඹිලයි ඉන්නේ; වේටර් කෙනෙක් කැළඹෙන්න නම්-" පොයිරෝ තම කථාව හිස වැනීමකින් අවසන් කළේ ය."මේක ඇත්තෙන්ම පළමු මට්ටමේ එකක් වන්න ඕන. අහ්, මම හිතුව දේම තමයි! මෙන්න පොලිසියට ඇවිත්. "

මිනිසුන් දෙදෙනෙක් හෝටලයට ඇතුළු විය.එක් අයෙක් නිල ඇඳුමින් සැරසී සිටි අතර අනිකා සිවිල් ඇඳුමෙන් සැරසී සිටියේ ය. ඔවුන් සේවකයෙකුට කථා කළ අතර ඒ විගසම ඔවුන්ව උඩු මහළට කැඳවාගෙන ගියේ ය. මිනිත්තු කිහිපයකට පසු එම පිරිමි ළමයා ආපසු පැමිණ අපි වාඩි වී සිටි තැන දක්වා ආවේ ය. "ඔපල්සන් මහත්මයාට ගැටළුවක්, ඔබතුමා උඩු මහලට එනවා ද? " පොයිරෝට වහා නැගිටුණි. එය දුටු යමෙක් සිතනු ඇත්තේ ඔහු කැඳවීමක් එන තෙක්ම බලා ඉන්නට ඇති බවයි.

මම කලබලයකින් තොරව ඔහු අනුගමනය කළෙමි. ඔපල්සන් යුවළගේ කාමරය පිහිටා තිබුණේ පළමු මහලේය. දොරට තට්ටු කළ පසු, සේවක ළමයා ඉවත්ව ගියේ ය. අපි කැඳවීමට පිළිතුරු දුන්නෙමු. "ඇතුලට එන්න!" කාමරය තුළ දක්නට ලැබුණේ අමුතු දර්ශනයකි. එය ඔපල්සන් මහත්මියගේ නිදන කාමරය විය.

sinhalaebooks.com

එහි මැද හාන්සි පුටුවක ඔපල්සන් මහත්මිය වැතිර සිටියේ දරුණු ලෙස හඬා වැලපෙමිණි.කඳුළු ඇයගේ මුහුණේ ආලේප කර තිබූ පූයරවල රැළි නැංවීය. ඔපල්සන් මහතා කෝපයෙන් කාමරයේ ඉහළට හා පහළට වේගයෙන් ගමන් කරමින් සිටියේය. පොලිස් නිලධාරීන් දෙදෙනා කාමරයේ මැද සිටගෙන සිටියහ. එක් අයෙකුගේ අතෙහි සටහන් පොතක් ද තිබුණේ ය.හෝටලයේ නානකාමර පිරිසිදු කරන්නිය මරණ බියෙන් මෙන් ගිනි උඳුන අසල සිටගෙන සිටියේ ය.

කාමරයේ අනෙක් පස ප්‍රංශ කාන්තාවක් වූ ඔපල්සන් මහත්මියගේ සේවිකාව සිටියේ ය, පැහැදිලිවම ඔපල්සන් මහත්මියගේ සේවිකාව හඬා වැළපෙමින් දෑත් දිගු කරමින් සිටියේ ය.ඇය ස්වාමිදුව සමඟ තරඟයට වැළපෙන බවක් දක්නට ලැබුණි.මෙම මහත් කලබැගෑනිය මැදට පොයිරෝ, පිළිවෙලට හා සිනහවෙන් යුතුව පියවර තැබීය. වහාම, පුදුම සහගත ශක්තියකින් ඔපල්සන් මහත්මිය ඇගේ පුටුවෙන් ඔහු දෙසට දිව ගියා ය.

“ඔන්න දැන්; එඩ්ට ඔහු කැමති දෙයක් කියන්න පුළුවන්, ඒත් මම වාසනාව විශ්වාස කරනවා. මට ඔබව හමුවීම ඇත්තෙන්ම දෛවය කියලයි මට හිතෙන්නේ. මට දැනෙනවා ඔබට මගේ මුතු ආයෙත් ගෙනත් දෙන්න බැරිනම් වෙන කාටවත් බැරිබව ” "සන්සුන් වන්න, මැඩම්, මම ඔබෙන් ඉල්ලන්නේ." පොයිරෝ ඇගේ අතට තට්ටු කරමින් පැවසුවේ ය. “ඔබට බය වෙන්න එපා.හැම දේම හොඳින් වේවි. හර්කියුල පොයිරෝ ඔබට උදව් කරනවා! ”

sinhalaebooks.com

ඔපල්සන් මහතා පොලිස් පරීක්ෂක වෙත හැරුණේය. "මේ මහත්මයා කැඳවූවට ඔබේ විරුද්ධත්වයක් නැහැ, මම හිතන්නේ?" "කොහෙත්ම නැහැ, සර්," ඔහු පැවසූ නමුත් එය කොහෙත්ම උනන්දුවකින් කරන ලද්දක් නොවීය. "සමහර විට දැන් ඇයගේ හොඳ ඇති නේද අපිට කරුණු ඉදිරිපත් කරන්න තරම්? " ඔපල්සන් මහත්මිය පොයිරෝ දෙස අසරණව බැලුවාය. ඔහු ඇයව නැවත ඇගේ පුටුවට ගෙන ගියේ ය.

"මැඩම්, ඔබ වාඩිවෙන්න, ඔබ කලබල වෙන්නේ නැතිව අපිට වෙච්ච දේ විස්තර කරන්න." ඉන් පසුව, ඔපල්සන් මහත්මිය ඇගේ දෑස් ප්‍රවේශම්කාරීව හකුළුවා, පටන් ගත්තාය. "මම රෑ කෑමෙන් පස්සේ උඩට ආවේ මගේ මුතු මාලය පොයිරෝ මහත්මයාට පෙන්වන්න අරගෙන යන්නයි. හෝටල් සේවිකාවයි සෙලෙස්ටීනුයි දෙන්නම සාමාන්‍ය විදියටම කාමරයේ හිටියා. "සමාවෙන්න මැඩම්,ඒත් ඔබ 'සාමාන්‍ය විදියට ' කියලා අදහස් කළේ මොකක් ද? " ඔපල්සන් මහතා එය පැහැදිලි කළේය.

" මම සෙලෙස්ටීන් ඒ කිව්වේ සේවිකාව නැතිව මේ කාමරයට කාටවත් එන්න එපා කියලයි තියෙන්නේ. සෙලෙස්ටීන් උදේට වැඩට ආවයින් පස්සෙ තමයි නානකාමර පිරිසිදු කරන කෙනා කාමරයට එන්නේරෑට ඇඳවල් සකස් කරන්න ආවත් වෙන්නේ ඒකම තමයි; එහෙම නැතිව ඇය කවදාවත් කාමරයට ඇතුළු වෙන්නේ නැහැ." ඔපල්සන් මහත්මිය තවදුරටත් මෙසේ පැවසුවාය. "හොඳයි, මම කිය කිය හිටිය විදියට, මම උඩට ඇවිත් මෙතන තියෙන ලාච්චුව ළඟට ගියා."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

ඇය කණ්ණාඩි මේසයේ දකුණු පස පහළ ලාච්චුව පෙන්වමින් පැවසුවා ය.“ ඊට පස්සේ මම මගේ ආභරණ පෙට්ටිය අරගෙන අගුළු ඇරියා. ඔක්කොම සාමාන්‍ය විදියට තිබුණත් මුතු මාලය ඒකෙ තිබුණේ නැහැ.” පරීක්ෂකවරයා ඔහුගේ සටහන් පොත සමඟ කාර්යබහුල වී සිටියේය. “ඔබ ඒක අන්තිමට දැක්කේ කොහේදි ද? ” ඔහු ඇසුවා. “මම රාත්‍රී කෑමට යද්දිත් ඒක තිබුණා.” ඔබට විශ්වාසද? ” “විශ්වාසයි. ඒක දානව ද නැද් ද කියලා මට හිතා ගන්න බැරිවුණා, අන්තිමට මම හිතුවා මරකත මැණික් හොඳයි කියලා. ඒක නිසා මම ඒවා ආයෙත් ආභරණ පෙට්ටියට දැම්මා. ”

“ ආභරණ පෙට්ටිය අගුළු දැම්මේ කවු ද?” "මමයි. මම ඒකෙ යතුර මගේ මාලෙට අමුණගෙනයි ඉන්නනේ.” ඇය එසේ පවසන විට එය ඔසවා පෙන්නුවා ය. පරීක්ෂක එය පරීක්ෂා කර ඔහුගේ උරහිස් සැලුවේ ය. “හොරාට හොර යතුරක් තියෙන්න ඕන. ඒක අමාරු වැඩක් නෙවෙයි. අගුල සරල එකක්. ඔබ ඊට පස්සේ කළේ මොකක්ද? ”“මම ඒක ආයෙත් පහළ ලාච්චුවේ දැම්මා.

“ඔබ ලාච්චුව අගුළු දැමුවේ නැද්ද?” “නැහැ, මම කවදාවත් කරන්නේ නැහැ. මම එනකන් සෙලෙස්ටීන් කාමරයේ ඉන්න නිසා ප්‍රශ්නයක් නැහැ .” පරීක්ෂකගේ මුහුණ අළු පැහැ විය. “එතකොට මම තේරුම් ගත්ත විදියට ඔබ රෑ කෑමට යද්දී මුතු මාලය මෙහේ තියලයි ගියේ ඒ වගේම සේවිකාව ඒ වෙලාවේ කාමරයෙන් පිටවෙලත් නැහැ?” හදිසියේම, සෙලෙස්ටීන් පළමු වර දැකීමේදී සිටි ආකාරයටත් වඩා කඩාවැටී සිටි අතර ඇය කන් සිදුරුවෙන අන්දමට කෑගැසුවා ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

ඉන් අනතුරුව ඇය පොයිරෝ ඉදිරියට පැන අපැහැදිලි ප්‍රංශවලින් කථාකිරීමට පටන්ගත්තේය. " මම දන්නවා! ඇය හොරා වෙන්න ඕන!මම දන්නවා පොලීසියේ අය කොහොමත් මෝඩයි කියලා ඒත් මේ ප්‍රංශ ජාතික මහත්මයා" "මම බෙල්ජියම් ජාතිකයෙක්" පොයිරෝ නිවරැදි කළ නමුත් නිවැරදි කිරීම ගැන සෙලෙස්ටීන් අවධානය යොමු කළේ නැත.

" මහත්මයා ඇයට නීතියෙන් ගැළවෙන්න ඉඩ තියන්න එපා. ඇයට හරියටම හොරෙකුගේ මූණක්මයි. ඇය මුල ඉඳලම කිව්වේ බොරු! ඇය එක පාරක් ඔරලෝසුව ගන්න හැදුවා. පොලිස් නිලධාරීන්ට ඇයව පරීක්ෂා කරන්න දෙන්න, ඇය ගාව මාලය තිබුණේ නැත්නම් ඒක පුදුමයක් වේවි! මෙම දෝෂාරෝපණය ප්‍රංශ භාෂාවෙන් සිදුවුණ ද සෙලෙස්ටීන් එය අත් පා අභිනයෙන් ද පැවසූ නිසා හෝටල සේවිකාව එයින් කොටසක් වටහා ගත්තා ය.

ඇය කෝපය නිසා රත් පැහැයට හැරුණි. "මම මුතු ගත්තා කියලා ඒ විදේශීය කාන්තාව කිව්වොත් ඒක බොරුවක්!" ඇය ආවේගශීලීව ප්‍රකාශ කළාය. "මම කවදාවත් එහෙම කරන්නේ නැහැ. " "ඇයව පරීක්ෂා කරන්න!" අනෙකා කෑගැසුවා ය. "මම කිව්ව විදියට ඔබට ඒක හම්බවේවි." "ඔබ බොරුකාරයෙක් - ඔබට ඇහෙනවද?" හෝටල් සේවිකාව කිව්වා ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඒවා ඔබම හොරකම් කරලා මගේ පිට දාන්න එපා. මොක ද, මහත්මිය උඩට එද් දී මම කාමරයට ඇවිල්ලා විනාඩි තුනක් විතරයි.ඒවගේම මම කාමරේ හිටපු වෙලාව ඇතුළත ඔබ මම දිහා හැම වෙලාවෙම බලාගෙනයි හිටියේ "

පරීක්ෂකවරයා සෙලෙස්ටීන් දෙස විමසිල්ලෙන් බැලී ය. "ඒක ඇත්තක්ද? ඔබ කාමරයෙන් එළියට නැද්ද කෙයි වෙලාවකවත්?" "ඇත්තෙන්ම මම ඇයව තනි කළේ නැහැ" කියා සෙලෙස්ටීන් අකමැත්තෙන් පැවසුවා ය. "ඒත් මම මගේ කාමරයට ගියා මේදොරින් දෙපාරක් - එක වතාවක් නූල් රීල් එකක් ගන්න අනිත් පාර කතුර ගන්න. ඇයට ඒ වෙලෙයි ඒක කරන්න ඇත්තේ. "

"ඔයා විනාඩියක්වත් ඇතුළේ හිටියේ නැහැ" කියා හෝටල් සේවිකාව කෝපයෙන් කීවා ය. "ඔයා ගිහිපු ගමන්ම ආපහු ආවා.මම කැමතියි පොලීසියේ අය මාව පරීක්ෂා කරනවානම්. මට බය වෙන්න කිසිම දෙයක් නැහැ. " මේ මොහොතේ කිසිවෙකු දොරට තට්ටු කළේ ය. පරීක්ෂක ඒ වෙත ගිය අතර පැමිණි තැනැත්තා දුටු විට ඔහුගේ මුහුණ දීප්තිමත් විය. "ආ!" ඔහුට කියැවිණි." මම අපේ කාන්තා පරීක්ෂකවරියකට පණිවිඩය යැව්වා.ඇය දැන් ආවා. සමහරවිට ඔබ වරදවා හිතන්නේ නැතිනම් ඔබට අනිත් කාමරයට යන්න පුළුවන්. "

ඔහු ඇය දෙස බලන විට ඇය දොර හරහා අනිත් කාමරයට යමින් සිටි අතර පරීක්ෂකවරිය ඇය පසුපස යමින් සිටියා ය. ප්‍රංශ කාන්තාව පුටුවක වැතිර සිටියා ය. පොයිරෝ කාමරයේ වටපිට බැලුවේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මේ අවස්ථාවේ දී මම ඇඳි කටු සටහනක් ඉදිරිපත් කිරීම යෝග්‍ය යැයි මම සිතමි.



https://sinhalatranslationofdetectivestories.blogspo

“ඒ දොරෙන් කොහෙට ද යන්නේ?” ඔහු විමසුවේ ජනේලය අසල තිබූ දොර ගැන ය. “ මම හිතන්නේ අනිත් කාමරයට,” පරීක්ෂකවරයා පැවසීය. " කොහොම වුණත් ඒක මේ පැත්තෙන් අගුළු දාලා." පොයිරෝ ඒ දෙසට ඇවිදගොස් යතුර කරකවා එය විවෘත කිරීමට උත්සහ කළේ ය.“අනෙක් පැත්තෙනුත් අගුල දාලා” ඔහු පැවසීය.“හොඳයි, ඒක අපිට අයින් කරන්න පුළුවන් වේවි.” ඔහු ජනේල දෙසට ඇවිද ගොස් සියල්ලක්ම පරීක්ෂා කළේ ය.

“ආයෙත් කිසි දෙයක් නැහැ අඩුම තරමේ එළියේ බැල්කනියක්වත් නැහැ. ” “එහෙම එකක් තිබුනත් ඒක කොහොම ද අපිට උදව්වක් වෙන්නේ, සේවිකාව කාමරයෙන් එළියට ගියේ නැත්නම්. ” පොයිරෝ පැවසුවේ *“පැහැදිලිවම” යන්නයි* .

“සේවිකාව කියන විදියට ඇය කාමරයෙන් එළියට ගියේ නැත්නම් -" හෝටල් සේවිකාව හා පොලිස් පරීක්ෂකවරිය නැවත පැමිණීම ඔහුගේ කථාවට බාධාවක් විය.

sinhalaebooks.com

"කිසි දෙයක් නැහැ" කියා දෙවැන්නා කෙටියෙන් කීවා ය. "ඇත්තටම මම කිසිදෙයක් බලාපොරොත්තු වුණේ නැහැ" කියා හෝටල් සේවිකාව පැවසුවා ය. " මට ඇත්තෙන්ම කණගාටුයි ඇය අවංක, වැදගත් කෙනෙකුගේ ගෞරවය නැතිකරන්න උත්සහ ගැනීම ගැන. " " හරි, දැන් ඔක්කාම හරි "පරීක්ෂකවරයා දොර ඇරියේ ය. දැන් කිසි කෙනෙක් ඔයාව සැක කරන්නේ නැහැ. ඔයා ගිහින් ඔයාගේ වැඩ කරගන්න" හෝටල් සේවිකාව අකැමැත්තෙන් පිටව ගියා ය .

"*ඇයවත්* පරීක්ෂා කරනව ද *?* "ඇය සෙලෙස්ටීන් පෙන්වමින් ඇසුවා ය ."ඔව් ඔව්!" ඔහු දොර වසා දමා යතුර කැරකැව්වේ ය. සෙලෙස්ටීන් පරීක්ෂකවරිය සමඟ කුඩා කාමරයට ඇතුළු විය. මිනිත්තු කිහිපයකට පසු ඇයද ආපසු පැමිණියේ ය. ඇය සතුව ද කිසිවක් තිබී නැත.

පරීක්ෂකගේ මුහුණ බරපතල විය. ඔහු ඔපල්සන් මහත්මිය දෙසට හැරුණේය. "මට කණගාටුයි මැඩම්, ඒත් හැම සාක්ෂියක්ම කියන්නේ මේකයි.ඒක කාගෙවත් ගාව නැතිනම් ඒක මේ කාමරයේ කොහේහරි හංගලා ඇති. " සලෙසේටීන් තියුණු හඬින් කෑ ගසා අතර පොයිරෝගේ අත තදින් අල්ලා ගත්තේය. පරීක්ෂකවරිය ඇය වෙතට නැමී ඇයට යමක් කෙඳිරීය.ඇය ඔහු දෙස සැකයෙන් බැලුවාය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

“ මගේ දරුවා - මම හිතන්නේ ඔබ ඒකට විරුද්ධ නොවුණොත් හොඳයි.” ඉන්පසු ඔහු පරීක්ෂකවරයා දෙසට හැරුණේය. "ඔබ මට අවසර දෙනව ද මහත්මයා? පොඩි අත්හදා බැලීමක් කරන්න - තනිකරම මගේ තෘප්තිය වෙනුවෙන්. ” “ඒක මොකක් ද කියන එකෙනුයි උදව් කරන එක ගැන තීරණය වෙන්නේ” යැයි පොලිස් නිලධාරියා පිළිතුරු දුන්නේය. පොයිරෝ නැවත වරක් සෙලෙස්ටීන් ඇමතීය.

“ඔබ අපිට කිව්වා නේ ද ඔබ නූල් රෝදයක් ගේන්න කාමරයට ගිය බව. ඒක කොතනද තිබුණේ?” “ ලාච්චු කැබිනෙට්ටුව උඩ,මහත්මයා.” “කතුර?” "එතනම." “මෙනෙවිය, ඒක ආයෙමත් කරන්න කිව්වොත් ඒක ඔබට කරදරයක් වේවි ද? ඔබ මෙතන වැඩ කරමින් වාඩිවෙලා හිටියානේඔබ කිව්ව විදියට? ” සෙලෙස්ටීන් වාඩි වී, පසුව, පොයිරෝගේ සංඥාවකින් නැඟිට, යාබද කාමරයට ගොස්, ලාච්චු කැබිනෙට්ටුවෙන් යමක් ගෙන ආපසු පැමිණියා ය.

ඒ අතර පොයිරෝ ඇගේ චලනයන් වෙත හා ඔහුගේ අත්ලේ තිබුණු ඔරලෝසුවකට අවධානය මාරුවෙන් මාරුවට යොමු කරමින් සිටියේ ය."ඔබට පුළුවන් නම් ආයෙත් සැරයක් කරන්න මෙනෙවිය." දෙවෙනි වාරය අවසානයේ ඔහු සිය සටහන් පොතේ සටහනක් තබා නැවත එය හා ඔරලෝසුව නැවත සාක්කුවට දමා ගත්තේ ය. “ස්තූතියි, මෙනෙවිය. ඔහු පරීක්ෂකවරයාට හිස නමා “ස්තූතියි ඔබගේ උදව්වට ” යැයි පැවසුවේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මෙම අධික ආචාරශීලීභාවය නිසා පරීක්ෂකවරයා තරමක් විනෝද වූ බවක් පෙනුණි. සෙලෙස්ටීන් අඬමින් පරීක්ෂකවරිය හා සිවිල් ඇඳුමින් සිටි නිලධාරියා සමග පිටත් විය. ඉන්පසු ඔපල්සන් මහත්මියට කෙටි විස්තරයක් කළ පරීක්ෂකවරයා කාමරය සම්පූර්ණයෙන්ම සෝදිසි කිරීමට කටයුතු කළේය. ඔහු ලාච්චු අදිමින්, කබඩ් විවෘත කරමින්, ඇඳ සම්පූර්ණයෙන්ම අවුල් කරමින්, බිමටද තට්ටු කරමින් බැලුවේ ය. ඔපල්සන් මහතා අවිශ්වාසයෙන් මෙන් බැලුවේ ය.

"ඔබ ඇත්තටම හිතන්නේ ඔබට ඒක සොයා ගන්න පුළුවන් කියල ද?" "ඔව්, සර්.ඒක තර්කානුකූලයි.ඇයට ඒක කාමරයෙන් එළියට අරන් යන්න වෙලාවක් තිබුණේ නැහැ.ඒපල්සන් මහත්මිය ඉක්මනින්ම හොරකම ගැන දැනගත්ත නිසා ඇයගේ සැලසුම් අවුල් වුණා.නැහැ,ඒක මෙතන තමයි හරි විදියටනම් තියෙන්න ඕන.ඔවුන් දෙන්නගෙන් කෙනෙක් ඒක මෙතන හංගන්න ඇති. හෝටල් සේවිකාවට ඒක කරන්න වෙලාවක් තිබුණයි කියලා හිතන්න අමාරුයි "" අමාරුයි නෙවෙයි ඒක වෙන්න බැහැ ." පොයිරෝ නිහඬවම කීවේය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

"එහ්?" පරීක්ෂක ඔහු දෙස බැලුවේ ය. පොයිරෝ නිහතමානීව සිනාසුණේය."මම විස්තර ඒ ගැන විස්තර කරන්නම්. හේස්ටිංග්ස් මගේ ඔරලෝසුව ඔබේ අතට ගන්න.පරිස්සමින් ඒක පවුලේ උරුමයක්! දැන් මම මෙනෙවියගේ චලනයන් ගිය වෙලාව බැලුවනේ ඇය මුලින්ම කාමරයෙන් එළියේ හිටියේ තත්පර දොළහයි, ඇය දෙවැනි පාර හිටියේ තත්පර පහළොවකට විතරයි. දැන් මම කරන දේ බලන්න.

sinhalaebooks.com

මැඩම්ට පුළුවන්නම් ආභරණ පෙට්ටියේ යතුර මට දෙන්න. ඔබට ස්තූතියි. මගේ මිතුරා හේස්ටිංග්ස්ට තියෙන්නේ 'යන්න!' කියලා කියන්න " "යන්න!" මම කිව්වා. ඇදහිය නොහැකි තරම් වේගයෙන්, පොයිරෝ කණ්නාඩි මේසයේ ලාච්චුව විවෘත කළේය, ආභරණ පෙට්ටිය එළියට ගෙන , අගුලට යතුර දමා,පෙට්ටිය විවෘත කර,ආභරණයක් තෝරා ගෙන, නැවත පෙට්ටිය වසා ඔහු පෙට්ටිය අගුළු දමා ලාච්චුවට දැම්මේ ය.එම චලනයන් විදුලියක් මෙන් විය.

"හොඳයි, *මගේ යාළුවා?* ඔහු මගෙන් ඇසුවේ හති අරිමිණි. "තත්පර හතළිස් හයක්" මම පිළිතුරු දුන්නා. "ඔබලාට පේනවා නේ ද?" ඔහු වටපිට බැලීය. "හෝටල සේවිකාවට මාලය එළියට ගන්නවත් වෙලාවක් නැහැ. ඉතින් කොහොම ද හංගන්නේ. " "එතකොට ඒක සේවිකාවගේ පැත්තටයි හැරෙන්නේ." යැයි පරීක්ෂකවරයා තෘප්තියෙන් යුතුව කියා ඔහුගේ සෝදිසිය නැවත අරඹමින් සේවිකාවගේ නිදන කාමරයට ගියේය. පොයිරෝ කල්පනා කිරීම නිසා ඔහුගේ නළල රැළි වැටී තිබුණි.

හදිසියේම ඔහු ඔපල්සන් මහතාට ප්‍රශ්නයක් එල්ල කළේය. "මේ මාලය අනිවාර්යයෙන්ම රක්ෂණය කරන්න ඇති නේ ද?." ඔපල්සන් මහතා ප්‍රශ්නයෙන් පුදුමයට පත් විය. "ඔව්, එහෙම තමයි" ඔහු පැකිළෙමින් කීවේ ය. "ඒත් ඒක වැදගත් වෙන්නේ කොහොම ද?" ඔපල්සන් මහත්මිය කඳුළු සලමින් ඇසුවේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" මට ඕන මගේ මාලය. ඒක සල්ලිවලට සමාන කරන්න බැහැ. " "මට තේරෙනවා මැඩම්," පොයිරෝ සන්සුන්ව පැවසීය. "මම හොඳට තේරෙනවා. ගැහැණු අයගේ හැටි ඔහොම තමයි. ඒක එහෙම නෙවේ ද? ඒත් මහත්මයා ඒ වුණත් ඒකට හුරු වුණොත් අපිට සැනසිල්ලක් ලැබෙනවා " "ඇත්ත වශයෙන්ම, ඇත්ත වශයෙන්ම," ඔපල්සන් මහතා තරමක් අවිනිශ්චිතව පැවසීය. "තවමත්-"

පරීක්ෂකගේ ජයග්‍රාහී හඬෙන් ඔහුට බාධා ඇති විය. ඔහු පැමිණියේ යම්කිසි දෙයකින් ඔහුගේ අතෙහි රැගෙන ය. ඔපල්සන් මහත්මිය කෑ ගසමින් පුටුවෙන් නැගිට්ටා ය. ඇයගේ ස්වභාවය එක්වරම වෙනස් විය. "ඔහ්, මගේ මාලය!" ඇය එය අත් දෙකෙන්ම ඇගේ පපුවට තද කර ගත්තාය. අපි වටේට රැස් වුණෙමු. "ඒක තිබුණේ කොහේද?" ඔපල්සන් මහත්මිය ඇසුවේ ය.

"සේවිකාවගේ ඇඳේ. මෙට්ටයේ ස්ප්‍රින්ග් අතර.ඇය ඒක හෝටල් සේවිකාව එන්න කලින් හොරකම් කරලා හංගන්න ඇති. " "ඔබ අවසර දෙනවද මැඩම්?" පොයිරෝ මෘදු ලෙස පැවසීය. ඔහු ඇයගෙන් මාලය ගෙන එය පරීක්ෂා කළේ ය. අනතුරුව හිස පහත්කර ආචාර කර එය ආපසු භාර දුන්නේය. "මැඩම්, ඔබට ඒක දැනට අපට භාර දෙන්න වෙනවා" යැයි පරීක්ෂකවරයා පැවසීය.

"අපිට නඩුව ඉවර කරන්න ඒක ඕන. අපි ඒක පුළුවන් වුණු ගමන් ඔබට එවන්නම්. " ඔපල්සන් මහතා රවා බැලුවේ ය. "ඒක ඕනම ද?" "ඔව් සර් ඒක අවශ්‍යයි. "

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔහ්, ඔහුට ඒක ගන්න ඉඩ දෙන්න, එඩ්!" ඔපල්සන් මහත්මිය පැවසුවා ය. ඔහු ඒක ගත්තම මට හොඳක් දැනෙනවා. මට දැන් නිදාගනිද්දී ඒක කවුරුහරි ගනියි කියලා බයක් නැහැ. ඒ දුෂ්ට කෙල්ල! මම ඇය එහෙම දෙයක් කරයි කියලා හිතුවේ නැහැ."

"හරි හරි දැන් ඒක ගැන හිතන එක නවත්වන්න." මට කිසිවෙකු මෘදුව තට්ටු කරනු දැනුනේ ය. ඒ පොයිරෝ ය. "මගේ යාළුවා, අපි යමුද? දැන් අපේ උදව් තව දුරටත් ඕනෑ නැහැ. " කෙසේවෙතත්, පිටතට ගිය පසු ඔහු මදක් නැවතුණු අතර පසුව මා පුදුමයට පත් කරමින් ඔහු මෙසේ පැවසීය. "මම කැමතියි අල්ලපු කාමරය බලන්න."

දොර අගුළු දමා නොතිබූ නිසා අපි ඇතුළු වුණෙමු. විශාල ඇඳවල් දෙකේ කාමරයක් වූ එය කිසිවෙකු පදිංචි නොවුණු එකක් විය. දූවිලි සැලකිය යුතු තරමක් තැන්පත් වී තිබුණු අතර, මගේ සංවේදී මිතුරා ඒ ගැන අප්‍රසාදය පළ කළේ ය. ඔහු ජනේලය අසල මේසයක් මත තිබූ ඍජුකෝණාස්‍රාකාර සලකුණකට ඇඟිල්ල දිගු කළේය.

"මම හිතන්නේ පිරිසිදු කිරීම් සෑහෙන කාලෙකින් වෙලා නැහැ" කියා ඔහු වියළි ලෙස ප්‍රකාශ කළේය. ඔහු ජනේලයෙන් පිටත කල්පනාකාරීව බලා සිටි අතර ඉනික්බිතිව කල්පනාවේ ගැලී සිටින බවක් පෙනෙන්නට තිබුණි. "හොඳයි?" මම නොඉවසිල්ලෙන් ඇසුවෙමි. "අපි මෙතැනට ආවේ ඇයි?"

sinhalaebooks.com

ඔහු සිතිවිල්ලෙන් මිදුණේ ය. "*සමාවෙන්න, මගේ යාළුවා.* මේ පැත්තෙන් දොර ඇත්තටම අගුළු දාල ද බලන්න මට ඕන වුණා තවද." "හොඳයි," මම අප කළින් සඳහන් කළ දොර දෙසට මද බැල්මක් හෙළුවෙමි. "ඒක අගුළු දාලා. " පොයිරෝ හිස වැනුවේ ය. ඔහු තවමත් සිතන බවක් පෙනෙන්නට තිබුණි."කොහොම වුණත්, ඒක ප්‍රයෝජනයක් වෙන්නේ කොහොම ද ? නඩුව විසඳුණා. මම හිතනවා ඔබට තවත් අවස්ථාවක් ලැබේවි කියලා. ඒක බොහොම සරල පරීක්ෂණයක්. ඒක ඕන කෙනෙක්ට විසඳන්න පුළුවන්" පොයිරෝ හිස වැනුවේ ය.

"මගේ යාළුවා, පරීක්ෂණය ඉවර නැහැ. මුතු හොරකම් කරපු කෙනා හොයා ගන්නකම් ඒක ඉවර වෙන්නේ නැහැ" "ඒත් සේවිකාව!" "ඇයි ඔයා එහෙම කියන්නේ?" "ඇයි, ඇයගේ මෙට්ටයෙන් ඒක හොයාගත්තනේ" කියා මම පැවසුවෙමි. "ඔන්න ඒවා!" පොයිරෝ නොඉවසිලිමත්ව පැවසීය. "ඒවා මුතු නෙවෙයි." "මොකක්ද?" "ඒවා බොරු ඒවා *මගේ යාළුවා.* " එම ප්‍රකාශය මට පුදුමයක් ඇති කලේ ය. පොයිරෝ සිනාසෙමින් සිටියේය.

" පරීක්ෂකවරයා පැහැදිලිවම ආභරණ ගැන කිසිම දෙයක් දන්නේ නැහැ. ඒක හොඳ කලබලයක් ඇති කරාවි! " "එන්න!" මම ඔහුගේ හස්තය ඇදගෙන යාමට තැත් කළෙමි."කොහෙ ද?" "අපි ඉක්මනට ඔපල්සන්ලට කියන්න ඕන." "මම හිතන්නේ නෑ." "නමුත් ඒ අසරණ ගැහැණු කෙනා" "*හොඳයි;* ඒ අසරණ ගැහැණු කෙනා, ඇයට ඒවා ආරක්ෂිතයි කියලා හිතාගෙන හොඳ රාත්‍රියක් ගත කරන්න දෙන්න. " "ඒත් හොරා ඒක අරගෙන පැනලා යාවි!"

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

“වෙනද විදියටම, මගේ යාළුවා, ඔබ කතා කරන්නේ හිතන්නේ නැතිවයි. අද රෑ ඔපල්සන් මහත්මිය ආභරණ පෙට්ටියට දාලා අගුළු දැම්මේ බොරු මාලය නෙමෙයි කියල ඔයා කියන්නේ කොහොම ද ? එහෙනම් හොරකම මීට කළින් දවසක වෙන්න බැරි ද?” “ඔහ්!” මම වික්ෂිප්තව අසා සිටියෙමි. “එහෙනම්,” පොයිරෝ කීවේය. "අපි ආයෙත් පටන්ගමු." ඔහු කාමරයෙන් පිටතට පැමිණ මද වේලාවක් සිතා කොරිඩෝවේ පහළට ගමන් කළේ ය.

ඔහු හෝටලයේ මහල් බාර සේවකයින් හා සේවිකාවන් සිටින කුඩා කුටීරය ඉදිරියේ නැවතුණේ ය.එහි ඔපල්සන් මහත්මියගේ කාමරයේ සේවිකාව කුඩා පිරිසකට තමාගේ මෑතකාලීන ආස්වාදජනක අත්දැකීම් සභාවට විස්තර කරමින් සිටියේය. ඇය කියමින් සිටි දෙයක් අතරමැද නැවැත්වී ය.

පොයිරෝ සුපුරුදු ලෙස ආචාරශීලී වෙමින් හිස නැමුවේ ය. “මම ඔබට බාධා කළාට සමාවෙන්න,කරුණාකර ඔබට අපිට ඔපල්සන් මහත්මයාගේ කාමරය ඇර දෙන්න පුළුවන් ද? ”ඒ ස්ත්‍රිය කැමැත්තෙන් නැඟිටි අතර අපි ඇය සමඟ නැවතත් කොරිඩෝව දිගේ ගියේය. ඔපල්සන් මහතාගේ කාමරය කොරිඩෝවේ අනෙක් පස තිබුණු අතර ඔහුගේ බිරිඳගේ කාමරයට මුහුණ ලා එහි දොර පිහිටා තිබුණේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

හෝටල් සේවිකාව ඇගේ යතුරෙන් එහි දොර විවර කළ අතර, අපි කාමරයට ඇතුළු වීමු. ඇය පිටත්ව යාමට යාමට සැරසෙද්දී පොයිරෝ ඇය ඇමතුවේ ය. " පොඩ්ඩක් ඉන්න මහත්මිය, ඔපල්සන් මහතාගේ බඩුවල මේ වගේ කාඩ් එකක් ඔබ කවදහරි දැකල තියෙනව ද? " ඔහු සුදු පැහැති සාමාන්‍ය කාඩ්පතක් දිගු කළේය.එය අඳුරු පැහැයක් ගත් අතර ස්වභාවයෙන් අසාමාන්‍ය විය. සේවිකාව එය රැගෙන හොඳින් පරීක්ෂා කර බැලීය.

"නෑ සර්, මට කියන්න බැහැ.කොහොම උනත්, සේවක ළමයා තමයි මහත්වරුන්ගේ කාමරවල වැඩ කරන්නෙ . " "මට තේරෙනවා. ඔබට ස්තූතියි." පොයිරෝ කාඩ්පත ආපසු ගත්තේය. කාන්තාව පිටත්ව ගියා ය. පොයිරෝ කල්පනා කරන බවක් පෙනෙන්නට තිබුණි. ඉන්පසු ඔහු හිසට තට්ටු කර ගත්තේ ය."සීනුව ගහන්න, හේස්ටිංග්ස්. සේවක ළමයාට තුන් වතාවක්. " මම කුතුහලයෙන් යුතුව එය ඉටු කළෙමි. මේ අතර, පොයිරෝ කඩදාසි දමන බඳුන බිම පෙරලා එහි අඩංගු දේ පරීක්ෂා කරමින් සිටියේ ය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

මොහොතකින් සේවක ළමයා සීනුවට පිළිතුරු දුන්නේය. ඔහුට පොයිරෝ එම ප්‍රශ්නයම යොමු කර පරීක්ෂාව සඳහා කාඩ්පත භාර දුන්නේ ය.නමුත් ප්‍රතිචාරය පෙර එක ම විය .සේවක ළමයා කිසි විටෙක එවැනි කාඩ්පතක් ඔපලසන් මහත්මයාගේ භාණ්ඩ අතර දැක නැත. පොයිරෝ ඔහුට ස්තූති කළ අතර ඔහු ආපසු යන විටදෙගිඩියාවෙන් මෙන් අනෙක් පස හැරවූ කඩදාසි කූඩය දෙස සහ බිම ඇති කසළ දෙස විමසිලිමත් බැල්මක් හෙළී ය.

sinhalaebooks.com

" මාලය ගොඩක් වැඩියෙන් රක්ෂණය කරලයි තියෙන්නේ " "පොයිරෝ,"මම පැවසුවෙමි "මට පේනවා" "මගේ යාළුවා, ඔබ මොනවත් දකින්නේ නැහැ," ඔහු ඉක්මනින් පිළිතුරු දුන්නේය. "වෙනද වගේම යන්තම්වත් නෑ.ඒක විශ්වාස කරන්නත් අමාරුයි. අපි අපේ කාමරවලට යමු. " අපි නිහඬව එසේ කළෙමු. එහි ගිය විට,මා පුදුමයට පත්කරමින් පොයිරෝ හොඳම ඇඳුමෙන් පැළඳුමෙන් සැරසී සිටියේ ය.

"මම අද රෑ ලන්ඩන්වලට යනවා.ඒක අනිවාර්යයෙන්ම කරන්න වෙනවා " "මොකක්?" "ඇත්තෙන්ම, මොළයෙන් කරපු වැඩ ඉවරයි. මම යනවා ඒවා තහවුරු කරගන්න.මම ඒක හොයාගන්නම එපැයි! හර්කියුල් පොයිරෝ රවට්ටන එක කරන්න බැහැ! " "ඔබ තව තවත් මේ දවස් ටිකේ අහංකාර වෙලා." මම ඇත්තෙන්ම ඔහුගේ මාන්නයට පිළිකුල් කළෙමි. "තරහ ගන්න එපා, මම ඔබෙන් අයදිනවා, *මගේ යාළුවා.*ඔබ මට අපේ යාළුකම වෙනුවෙන් පොඩි උදව්වක් කරනවා නේ ද? "

"ඇත්ත වශයෙන්ම," මම උනන්දුවෙන් පැවසුවෙමි. ඒ වන විට ද මට ඔහුට දැක්වූ රළු ප්‍රතිචාර ගැන පසුතැවීමක් ඇතිවී තිබුණේ ය. "ඒ මොකක් ද?" "මම ගලවලා දැම්ම මගේ කබායේ අත පිරිසිදු කරනව ද? ඔබ දැක්ක ද සුදු කුඩු වගයක් ඒකට ඇලිලා තියෙනවා. මම හිතන්නේ ඔබ අනිවාර්යයෙන්ම දකින්න ඇති කණ්නාඩි මේසයේ ලාච්චුව වටේ මම ඇඟිල්ල අරන් යනවා ? "

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"නැහැ, මම දැක්කේ නැහැ." "ඔබ ඒක බලන් ඉන්නයි තිබුණේ.ඒ විදියට මම මගේ ඇඟිල්ලට කුඩු ටිකක් අරගත්තා එවෙලෙ හදිස්සි,නිසා මම ඒක මගේ කබා අතෙන් පිහිදගත්තා; ඒත් ඒක මම හෙළා දකින කිසි පිළිවෙලක් නැති වැඩක්.ඒක මගේ ප්‍රතිපත්ති වලට විරුද්ධයි." "ඒත් ඒ කුඩු මොනව ද?" මම විශේෂයෙන් පොයිරෝගේ ප්‍රතිපත්ති ගැන උනන්දුවක් නොදක්වමි. "බෝර්ජියාස්ගේ වස නෙවෙයි" කියා පොයිරෝ පිළිතුරු දුන්නේ ය."මට ඔබට හිතෙන දේවල් ගැන හිතාගන්න පුළුවන්.එහෙමනම් මම කිව්වොත් ඒ ප්‍රංශ හුණු කියලා"

"ප්‍රංශ හුණු?" "ඔව්, කැබිනට් හදන අය ඒවා යොදන්නේ ලාච්චු හොඳින් අරින්න වහන්න පුළුවන් වෙන්නයි." මම හිනා වුණෙමි. "වයසක පව්කාරයා! මම හිතුවේ ඔයා අලුත් දෙයක් හොයා ගත්තයි කියලා." "*සුභ රැයක්!*. මගේ යාළුවා, මම බේරුණා. මම යනවා!" ඔහු ඔහු උපහාසයෙන් හා ලෙන්ගතුබවින් පිරි සිනාවක් පා දොර වසා ගියේ ය. මම කබාය අතට ගෙන බුරුසුව සඳහා මගේ අත දිගු කළෙමි.

පසු දින උදයේ, පොයිරෝගෙන් කිසි තොරතුරක් නොලැබුණු හෙයින්, මම ඇවිදීමට පිටත්ව ගියෙමි, පැරණි මිතුරන් කිහිප දෙනෙකු මට මුණගැසුණු අතර මම ඔවුන් සමඟ ඔවුන්ගේ හෝටලයේ දිවා ආහාරය ගත්තෙමි ඉන් පසු හවස් වරුවේ අපි විනෝදය සඳහා කාරයක නැඟී ගියෙමු. ටයරයක් සිදුරු වීමෙන් අප තරමක් ප්‍රමාද වුණේ ය.මම නැවත ග්‍රෑන්ඩ් මෙට්‍රොපොලිටන් හෝටලය වෙත පැමිණෙන විට අටත් පසු විය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මගේ දෑස් හමු වූ පළමු දර්ශනය වූයේ පොයිරෝ ය, ඔහු වෙනදාටත් වඩා කුඩාවට පෙණුනේ, ඔපල්සන් යුවළ අතර තෙරපී සිටීම නිසා ය.“*මගේ යාළුවා* හේස්ටිංග්ස්!” ඔහු මා හමුවීමට පැමිණියේ ය. “මගේ යාළුවා, මාව බදාගන්න. ඔක්කොම ඉවරයි! ” වාසනාවකට මෙන්, ඒ කියමන වචනාර්ථයක් පමණක් ඇති දෙයක් නොවී ය .

පොයිරෝගෙන් මෙවැන්නක් බලාපොරොත්තු විය හැක්කේ කලාතුරකිනි.“ඔබ කියන්නේ?” මම පටන් ගත්තෙමි. “අපූරුයි, මම කිව්වනේ!” ඔපල්සන් මහත්මිය ඇගේ මහත මුහුණ පුරා සිනාසෙමින් පැවසුවාය.“මම ඔයාට කිව්වේ නැද්ද, එඩ්, පොයිරෝ මහත්මයාට බැරිනම් කාටවත් බැරි බව? ” “ඔබ කිව්වා ඒ වගේම ඔබ හරි.” මම පොයිරෝ දෙස අසරණව බැලුවෙමි, ඔහු පිළිතුරු දුන්නේය.

“මගේ යාළුවා හේස්ටිංග්ස්, ඔබ එංගලන්තෙදි කිව්වා වගේ ඔක්කොම වෙන්නේ මුහුකරේදි. වාඩිවෙන්න, පරීක්ෂණය හොඳින් විසඳුණා. ඒක අවසන්” “අවසන් වුණා?” "ඔව්. ඔවුන්ව අත්අඩංගුවට ගත්තා.” “අත්අඩංගුවට ගත්තේ කාව ද? ” “ සේවක ළමයයි සේවිකාවයි*!* ඔබ සැක කළේ නැද්ද? මම යද්දී ප්‍රංශ හුණු ගැන කියපු ඉඟිය නිසා ? ” “කැබිනට් හදන අය ඒවා පාවිච්චි කරන බවක් ඔබ කිව්වා.”

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඇත්තෙන්ම ඔවුන් ඒවා යොදාගන්නවා. ලාච්චු පහසුවෙන් අරින්න හා වහන්න. කාටහරි ලාච්චුවක් සද්දයක් නැතිව අරින්න වහන්න ඕන වුණා. ඒ කාට ද? අනිවාර්යයෙන් හෝටල් සේවිකාවට තමයි. සැලැස්ම සූක්ෂ්ම එකක් වුණා. ඒක කාගෙවත් ඇසට අහුනොවෙන්නටයි හැදුවේ, ඒත් හර්කියුල පොයිරෝ ඇසට පෙණුනා."

"ඇහුම්කන් දෙන්න, මේක වුණේ මෙහෙමයි. සේවක ළමයා අල්ලපු හිස් කාමරයේ හිටියා. එම ප්‍රංශ සේවිකාව කාමරයෙන් පිටව ගිය ගමන් හෝටල් සේවිකාව විදුලිය වගේ ලාච්චුව ඇරලා ආභරණ පෙට්ටිය අරගෙන දොර හරහා ඒක සේවක ළමයට යවනවා. ඔහු ඒක ඔහුගේ හොර යතුරෙන් ඇරලා මුතු මාලය අරගෙන, ඔහුගේ වෙලාව එනකම් බලන් ඉන්නවා. සෙලෙස්ටීන් ආයෙත් කාමරයෙන් පිටව ගියාම, සැණෙකින් පෙට්ටිය නැවත දාලා ලාච්චුව වහනවා.

"මහත්මිය ඇවිත් සොරකම හොයාගත්තා. හෝටල් සේවිකාව මවා ගත්ත කේන්තියකින් පරීක්ෂණයක් ඉල්ලලා ඇගේ චරිතයට කිසි පැල්ලමක් නැතිව කාමරයෙන් පිටවෙනවා.!"

"උදේ හෝටල් සේවිකාව බොරු මාලය සෙලෙස්ටීන්ගේ කාමරයේ දමලයි තිබුණේ. හොඳ සැලැස්මක් එහෙම නෙවේ ද?" "ඒත් ඔබ ලන්ඩනයට ගියේ මොකට ද?" "ඔබට කාඩ්පත මතකද? " "අනිවාර්යයෙන්. ඒක මට ඒ වෙලෙත් ප්‍රශ්නයක් තාමත් ප්‍රශ්නයක්. මම හිතුවේ-"

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

මම අවුල් වී ගිය සිතින් ඔපල්සන් මහතා දෙසට මද බැල්මක් හෙලුවෙමි. පොයිරෝ සිනාසුණේ ය. " *විහිළුවක්!* විශේෂයෙන්ම සේවක ළමයව අල්ලගන්න. ඒක ඇඟිලි සළකුණු හදපු මතුපිටක් තියෙන එකක්. මම කෙලින්ම ස්කොට්ලන්යාඩ් ගිහින් මගේ පරණ යාළුවා ජැප්ට විස්තර ටික කිව්වා." " මම සැකකළ විදියටම ඒ ඇඟිලි සලකුණු පොලීසියට ඕන කරලා තිබුණු ආභරණ හොරු දෙන්නෙක්ගේ . ජැප් මාත් එක්ක ඇවිත් හොරු අත්අඩංගුවට ගත්තා.

මාලය සේවකයගේ කාමරයෙන් හමුවුණා. දක්ෂයෝ දෙන්නෙක්, ඒත් ඔවුන් *පිළිවෙලක් නැතිකම* නිසා අසාර්ථක වුණා. හේස්ටිංග්ස් මම ඔබට කියලා නැද්ද තිස්හය වතාවක්වත් පිළිවෙල නැති නිසා -?" "තිස් හය පාරක් නෙවෙයි තිස් හයදාස්වාරයක් විතර !" මම බාධා කළෙමි. "ඒත් ඔවුන්ගේ පිලිවෙල නැතිවුණේ කොහේදි ද?"

" *මගේ යාළුවා,* සේවකයෙක් හා සේවකයෙක් විදියට වෙස්වලා ගන්න එක හොඳ සැලැස්මක්, ඒත් වැඩ මගහරින එක කරන්න හොඳම නැති දෙයක්. ඔවුන් හිස් කාමරය පිරිසිදු කිරීම අතහැරියා. ඒ නිසා, සේවකයා මේසය උඩ ආභරණ පෙට්ටිය තියපු නිසා එතන හරි හතරැස් ලකුණක් හිටියා. "මම දැනන් හිටියා" කියා මම කෑගැසුවෙමි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"මීට කලින්, මට හිතාගන්න බැහැ. ඊළඟට මම දැනන් හිටියා*!*" මොහොතක නිහඬතාවක් විය. ඔපල්සන් මහත්මිය කවියක් මෙන් "මට මගේ මුතු ලැබුණා" කියා පැවසුවා ය. "හොඳයි, මම රෑ කෑමට ගියොත් හොඳයි" මම කීවෙමි. පොයිරෝ මා සමඟ පැමිණියේ ය. "ඔබ කියන්නේ මටත් ප්‍රශංසාව ලැබෙන්න ඕන කියල ද?" මම ඇසුවෙමි.

"*ඔක්කොම නෙවෙයි*" කියා පොයිරෝ සන්සුන්ව පිළිතුරු දුන්නේය. ජැපුයි පරීක්ෂකවරයයි ඔවුන් දෙන්නට නය ගෙවාවි. ඒ වගේම "- ඔහු තම සාක්කුව තට්ටු කළේය " මට ඔපල්සන් මහතාගෙන් චෙක් එකක් තියෙනවා, මගේ යාළුවා? මේ සති අති අන්තයේ වැඩක් නැහැනේ. ලබන සති අන්තයේ දී අපි ආපහු මෙහේ එමු. මේ වතාවේ මගේ වියදම? "

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

නිමි. . .

sinhalaebooks.com

05. වික්ටරි බෝල් නර්තන රාත්‍රිය

"The Affair At The Victory Ball" ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරනු ලැබුවේ *ද ස්කෙච්හි* **1923** මාර්තු **7** කලාපයේදී ය.

පෙර බෙල්ජියම් හමුදාවේ ප්‍රධානියා වූ මගේ මිතුරා වූ හර්කියුල පොයිරෝට ස්ටයිල්ස් වලව්වේ පරීක්ෂණය[3] ඔහුගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය විය. ඔහුගේ සාර්ථකත්වය නිසා ඔහු සුප්‍රකට වූ අතර, අපරාධ ගැටළු විසඳීමට තම කාලය කැපකිරීමට ඔහු තීරණය කළේ ය. සොම්හිදී තුවාල වී හමුදාවෙන් ඉවත් කිරීමෙන් පසු මම ඔහුත් සමඟ ලන්ඩන් නුවරට ආවෙමි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

ඔහුගේ බොහෝ පරීක්ෂණ පිළිබඳව මට හොඳ දැනුමක් ඇති හෙයින්, මට වඩාත් සිත්ගන්නාසුලු පරීක්ෂණ කිහිපයක් තෝරාගෙන ඒවා වාර්තාගත කරන ලෙස මට යෝජනා කළේ ය. එසේ කිරීමේ දී එවකට මෙතරම් පුළුල් මහජන උනන්දුවක් ඇතිකළ අමුතු පටළැවිල්ලෙන් ආරම්භ කිරීම හොඳම දෙය බව මට හැඟේ. මම එය වික්ටරි බෝල් නර්තන රාත්‍රියේ සිදුවූ සිදුවීමකි. සමහර විට එයින් පොයිරෝගේ සුවිශේෂී ක්‍රම පිළිබඳ පූර්ණ ලෙස නිරූපණය නොවුනත් තවත් සමහරක් සැඟවුණු සිද්ධීන්, එහි සංවේදී ලක්ෂණ, ඊට සම්බන්ධ ප්‍රසිද්ධ පුද්ගලයින් සහ විශාල ප්‍රචාරයක් එයට පුවත්පත් මගින් ලබා දීම එය තෝරාගැනීමට *ප්‍රධාන හේතුව* ලෙස දැක්විය හැක.

---

3 1920 දී මුද්‍රණය කර ඇති මෙය The Mysterious Affair At Styles ලෙස පළවී ඇත.

sinhalaebooks.com

පොයිරෝගේ ගැටළු විසඳීමේ දක්ෂතාවය දැක්වීමේ දී මෙය මුලින්ම පාඨකයා වෙත ඉදිරිපත් කළ යුතු යැයි මට හැඟේ.

එය වසන්තයේ හොඳ උදෑසනක් වූ අතර අපි පොයිරෝගේ කාමරයේ වාඩි වී සිටියෙමු. මගේ කුඩා මිතුරා සුපුරුදු ලෙස පිළිවෙලට ඇඳ පැළඳ ගෙන සිටි අතර ඔහුගේ බිත්තර හැඩැති හිස එක් පැත්තකට නැඹුරු කරගෙන සියුම් ලෙස උඩුරැවුලෙහි නව කේශාලේපයක් ආලේප කළේ ය. අහිංසක වූ මාන්නය පොයිරෝගේ ගතිලක්ෂණයක් වූ අතර එය ඔහුගේ පිළිවෙලට ඇති කැමැත්ත හේතුවෙන් ඇතිවූවකි. මම කියවමින් සිටි *Daily Newsmonger* පුවත්පත පහත හෙළා සිතිවිල්ලෙහි ගැලී සිටින විට පොයිරෝගේ කටහඬ ඇසුණි.

“මොනවා ගැන ද ඔයා මෙච්චර හිතන්නේ *මගේ යාළුවා?* ” “ඔයාට කියන්න යාළුවා මම හිතමින් හිටියේ මේ පත්තරවල පිටු පුරා තියෙන වික්ටරි බෝල්වල සිද්ධිය ගැනයි.” මම කථා කරමින් පුවත්පතට තට්ටු කෙරුවෙමි. "ඔව්, ඉතින්?"

“කෙනෙක් මේක කියවන වාර ගණනට අභිරහස තව තවත් අපැහැදිලි වෙනවා!” මම එහි විෂය පිළිබඳ උද්යෝගයක් දැක්වූවෙමි. “ක්‍රොන්ෂෝ සාමිවරයා මැරුවේ කවුද? එදිනම රාත්‍රියේ කොකෝ කෝර්ට්නිගේ මරණය අහම්බයක් ද? නැත්නම් හදිසි අනතුරක් ද ? නැත්නම් ඇය හිතාමතාම කොකේන් අධික ලෙස පානය කළාද? ” මම කථාව නවත්වා ඉන්පසු නාට්‍යානුරූපීව “මේවා මම මගෙන්ම අහන ප්‍රශ්න.” යැයි පැවසුවෙමි.

https://sinhalatranslationofdetectivestories.blogspot.com

sinhalaebooks.com

පොයිරෝ මගේ කථාවට බාධා කළේ නැත. ඔහු ජනේලයෙන් පිටතට එබිකම් කර මිමිණුවේ "ඇත්තෙන්ම , මේ අළුත් කේශාලේපය උඩු රැවුලට කදිමයි" යැයි පැවසුවේ ය. කෙසේවෙතත්, ඔහු කඩිමුඩියේ මෙසේ පැවසීය: "එහෙනම්, ඔබේ ප්‍රශ්නවලට ඔබ උත්තර හොයාගන්නේ කොහොම ද?" නමුත් මම පිළිතුරු දීමට පෙර, දොර විවර වූ අතර, අපේ නිවෙස් හිමිකාරිය පොලිස් පරීක්ෂක ජැප් පැමිණ ඇතැයි පැවසුවා ය.

ස්කොට්ලන්ඩ්යාඩ්හි පොලිස් පරීක්ෂකවරයා අපගේ පැරණි මිතුරෙකු වූ අතර අපි ඔහුව උණුසුම් ලෙස පිළිගත්තෙමු. "ආහ්, මගේ මිතුරු ජැප්, ඔබ අපිව බලන්න අරන් ආවේ මොනවා ද?" "හොඳයි, මොන්සියර්[4] පොයිරෝ," ජැප් අසුන්ගැනීමෙන් පසු මා දෙස බලා,

"මට පැටලිච්ච පරීක්ෂණයක් භාර වුණා. ඒක ඔබේ සිත ඇදගනීවි යැයි හිතපු නිසා මම ආවේ ඒකට ඇඟිලි ගහලා බලන්න කැමති ද කියලා අහන්න " පොයිරෝට ජැප්ගේ හැකියාවන් ගැන හොඳ මතයක් තිබුණ ද, ඔහුගේ ක්‍රමවේදයක් නොමැති බව හෙළා දැක්කේ ය.

නමුත් මගේ පැත්තෙන් රහස් පරීක්ෂකයාගේ ඉහළම කුසලතාවය ගැටළු ප්‍රදානය කිරීමේ මුවාවෙන් උදවු ලබා ගැනීම බව මම විශ්වාස කරමි.

---

4 ප්‍රංශ කථාකරන්නෙකුට ඇමතුම් පදය (Mr. යන්නට සමාන පදය)

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

“ ඒ වික්ටරි බෝල්වල සිද්ධිය” යැයි ජැප් ඒත්තු ගැන්වීය. "එන්න, ඔබ එයට ඇඟිලි ගැසීමට කැමතියි ද?"පොයිරෝ මා දෙස සිනාසුණේය. “මගේ මිතුරා හේස්ටිංග්ස් කොහොමත් කැමතියි. ඔහු මේ මාතෘකාව ගැන දිගින් දිගටම කල්පනා කරමින් සිටියේ *එහෙම නේද යාළුවා* ”

“හොඳයි, සර්” යැයි ජැප් මහත්මා ගතියෙන් පැවසී ය. “ඔබත් එහි සිටිය යුතුයි. මට ඔබට කියන්න පුළුවන්, මේ වගේ සිද්ධියක් ගැන දැනුමක් තිබීම ඔබේ ගෞරවයට හොඳයි. දැන් අපි කාරණයට බහිමු. මම හිතන්නේ ඔබ දන්නවා සිද්ධියේ ප්‍රධාන කරුණු එහෙම නේද පොයිරෝ මහත්මයා? ” “පුවත්පත්වලින් විතරයි. මාධ්‍යවේදියා හිතන විදිය සමහර විට නොමඟ යවන සුළුයි. මට මුළු කථාවම මුල ඉඳන් කියන්න. ” ජැප් සුව පහසු ලෙස කකුල් සකසාගෙන කථාව ආරම්භ කළේය.

“ හැමෝම දන්නා විදියට ගිය අඟහරුවාදා මහා වික්ටරි බෝල් නර්තනය පැවැත්වුණා. සෑම කෙනෙක්ම දන්නා විදියට ක්‍රොන්ෂෝ සාමිවරයා සහ පක්ෂයත් මුළු ලන්ඩනයම වාගේත් සහභාගී වුණා. “ඔහුගේ ඩොසියරය[5]? පොයිරෝ බාධා කළේ ය. “මම කිව්වේ ඔහුගේ ජීව විද්‍යාව, නැහැ මට වැරදුණා මොකක් ද එයට කියන්නේ, චරිතය? ”

---

5 (කෙනකු හෝ සිදුවීමක් හෝ විෂයයක්) පිළිබඳ රැස්කරගත් තොරතුරු ආදිය අඩංගු ලේඛන ගොන්න

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ක්‍රොන්ෂෝ සාමිවරයා ඔහුගේ පරම්පරාවේ පස්වන වංශාධිපතියා, වයස අවුරුදු විසිපහයි, ධනවත්, අවිවාහක සහ නාට්‍යවලට ඇල්මක් දක්වන කෙනෙක්. ඔහු ඇල්බනි නාට්‍ය ශාලාවේ කෝර්ට්නි මෙනෙවිය සමඟ විවාහ ගිවිසගෙන ඇති බවට කටකතා පැතිරිලා තියෙනවා. ඇයව මිතුරන් අඳුනන්නේ 'කොකෝ' කියන නමින් ඒ වගේම ඇය බොහොම ලස්සන තරුණ කාන්තාවක්."

"හොඳයි. *දිගටම කරගෙන යන්න*" "ක්‍රොන්ෂෝ සාමිවරයාගේ පක්ෂයේ හය දෙනෙක් ඉන්නවා: ඔහු, ඔහුගේ මාමා, ගෞරවනීය යූස්ටස් බෙල්ටේන්, ලස්සන ඇමරිකානු වැන්දඹුව, මැලාබි මහත්මිය, තරුණ නළුවෙක් වන, ක්‍රිස් ඩේවිඩ්සන්සහ ඔහුගේ බිරිඳ සහ අවසන් කෙනා නමුත් අවම වශයෙන් මෙනෙවිය කොකෝ කෝර්ට්නි. එය ඔබ හිතන විදියටම හොඳ උත්සවයක් වුණා. ක්‍රොන්ෂෝ සාමිවරයා සහ ඔහුගේ පක්ෂය පරණ ඉතාලි ප්‍රහසන නාට්‍යයක් ඉදිරිපත් කළා"

"*ප්‍රහසනය*" පොයිරෝ මිමිණීය. "මම එය දන්නවා." "කොහොම හරි, යූස්ටස් බෙල්ටේන්ගේ චීන ප්‍රතිමා කට්ටලයකින් තමයි ඇඳුම්වල සැලසුම් නිර්මාණය කරලා තියෙන්නේ."

"ක්‍රොන්ෂෝ සාමිවරයා තමයි විකට චරිතය(හාර්ල්ක්වින්)කළේ, බෙල්ටේන් පුන්චිනෙලෝ වුණා . මැලාබි මහත්මිය ඔහුට පුල්සිනෙල්ලාගේ[5] චරිතය ගැළපුවා. ඩේවිඩ්සන්ලා පියරොට් සහ පියරෙට් චරිත කළා. ඇත්ත වශයෙන්ම, කෝර්ට්නි මෙනෙවිය කොලොම්බින් වුණා.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

සවස් යාමයේ දී යම්කිසි වැරැද්දක් ඇති බවක් පෙනෙන්නට තිබුණා. ක්‍රොන්ෂෝ සාමිවරයා කනස්සළුව, සුපුරුදු විදියෙන් බැහැරව සිටියා. පක්ෂය කුඩා පෞද්ගලික කාමරයක රාත්‍රී ආහාරය සඳහා එකට රැස් වූ විට කෝර්ට්නි මෙනෙවිය අඩමින් සිටි බව පෙනුණු අතර ඇය හැඟීම්බරව සිටියා ය. ආහාරය සියළු දෙනාටම අපහසුතාවයක් වුණු අතර ඔවුන් සියල්ලෝම රාත්‍රී භෝජන ශාලාවෙන් පිටව යද්දී, ඇය ක්‍රිස් ඩේවිඩ්සන් වෙත හැරී ඔහුගෙන් ඉල්ලලා තියෙනවා ඇයට අසනීප නිසා ගෙදරට ඇරලවන ලෙස තරුණ නළුවා පැකිලී, ක්‍රොන්ෂෝ සාමිවරයා දෙස බලා ඔහුට කතා කරලා.

අවසානයේ ඔහු ඔවුන් දෙදෙනාම එක්කගෙන රාත්‍රී භෝජන ශාලාවට ගියා" "නමුත් සමාදානයක් ඇති කිරීම සඳහා ඔහු දැරූ සියලු උත්සාහයන් නිෂ්ඵල වෙච්ච ඒ නිසා ඔහු කුලී රථයකට නැගලා තියෙනවා" හඬා වැළපෙන කෝර්ට්නි මෙනෙවිය නැවත ඇගේ මහල් නිවාසයට ඇරලන්නට. ඇය ඔහු කෙරෙහි විශ්වාසය නොතැබුව ද යන්තමින් නැවත නැවතත් පවසා ඇත්තේ

'පරණ ක්‍රොන්ච් ගැන කණගාටුයි' යන වචනයි. ඇගේ මරණය අහම්බෙන් නොවන්නට ඇති බවට අපට ඇති එකම ඉඟිය එයයි. එය හොඳයි අපිට ටිකක් ඉදිරියට යන්න. ඩේවිඩ්සන් ඇයව තරමක් සන්සුන් කර එළියට පැමිණෙන විට නැවත කොලෝසස් ශාලාවට එන්න වෙලාව මදි නිසා ඩේවිඩ්සන් කෙලින්ම චෙල්සි හි පිහිටි ඔහුගේ මහල් නිවාසයට ගිහිල්ලා තියෙනවා.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ටික වේලාවකට පසු ඔහුගේ බිරිඳ නිවසට ආවහම තමයි ඔහු පිටවුණායින් පසුව සිද්ද වුණු ඛේදවාචකය ගැන විස්තරය කියල තියෙන්නේ."

"ක්‍රොන්ෂෝ සාමිවරයා, වික්ටරි බෝලය කෙරීගෙන යද්දී වඩ වඩාත් කනස්සල්ලට පත්වෙලා තියෙනවා. ඔහු තම පක්ෂයයේ සමාගමයෙන් ඈත්වෙලයි ඉඳලා තියෙන්නේ. අලුයම් කාලයේ දී ඔවුන් ඔහුව දැකලා තියෙන්නේ කලාතුරකින්. ඒ පාන්දර එකහමාරට විතරලු. උත්සවය අවසන් කිරීමේ නර්තනයට කලින් හැමෝම දමාගෙන හිටි වෙස් මුහුණු ගලවනකොට, ක්‍රොන්ෂෝ සාමිවරයාගේ වෙස්වළාගැනීම ගැන දැන හිටි සහෝදර නිලධාරියෙක් වුණු කැප්ටන් ඩිග්බි ඔහු පෙට්ටියක හිටගෙන ඉන්නවා දැකලා තියෙනවා.

"හලෝ, ක්‍රොන්ච්!" ඔහු කතා කරලා. 'පහළට ඇවිත් සමාජශීලී වෙන්න! ඔයා මොනවද ඔතනට වෙලා කරන්නේ? තම්බපු බකමූණෙකු වගේ? එන්න; දැන් හොඳ පරණ උත්සවයක් පටන්ගන්නවා.' "හරි!" ක්‍රොන්ෂෝ ප්‍රතිචාර දක්වලා. " මම එනකම් ඉන්න නැත්නම් මට ඔයාව සෙනඟ අස්සේ හොයාගන්න බැරිවෙයි."

"ඔහු කතා කරමින් පෙට්ටියෙන් එළියට ඇවිත්. ඩේවිඩ්සන් මහත්මිය එක්ක කැප්ටන් ඩිග්බි ඔහු එනකල් බලා ඉඳලා තියෙනවා. මිනිත්තු ගණන් ගත වෙලත් ක්‍රොන්ෂෝ සාමිවරයා ඇවිල්ලා නැහැ. අවසානයේ ඩිග්බිගේ ඉවසීම ඉවර වෙලා. "මිනිහා හිතනව ද අපි ඔහු එනකම් මුළු රැයම ඉන්නවා කියලා?' ඔහු කෑගහලා."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඒ වෙලාවේ මැලාබ් මහත්මිය ඔවුන් සමඟ එකතු වුණු නිසා ඔවුන් ඇයට තත්ත්වය පැහැදිලි කරලා. " 'දැන් තත්ත්වය' , මැලාබ් මහත්මිය උද්‍යෝගයෙන් කියලා,'ඔහු අද රෑ ඔළුව තුවාල වුණු වලහෙක් වගේ. අපි යමු ගිහින් ඔහුව හැංගිලා ඉන්න තැනින් එළියට ඇදල ගමු.' සෙවීම ආරම්භ කළ නමුත් මැලාබ් මහත්මියට ඔහු ඔවුන් රෑ ආහාර ගත් ස්ථානයේ සිටීමට ඉඩ ඇති බව සිහි වෙන තෙක් එය සාර්ථක වූයේ නැත. ඔවුන් එහි ගිය විට දැකි දර්ශනය කොයිවගේ ද කියලා ඔබට හිතාගන්න පුළුවන් ද!? එතන විකටයා ඉඳලා ඒත් ඔහුගේ පපුවේ මේස පිහියක් එක්ක බිම වැටිලා! "

ජැප් නැවතුණ අතර, පොයිරෝ හිස වනා, විශේෂඥ ප්‍රීතියකින් මෙසේ පැවසීය: "*හොඳ ගනුදෙනුවක්*" අපරාධකරු පිළිබඳ කිසිදු හෝඩුවාවක් නොතිබුණි! නමුත් එය කොහොම ද වුණේ! "
පරීක්ෂක ජැප් තවදුරටත් පැවසුවේ "හොඳයි, ඔබ හේතූ දන්නවා. ඊළඟ දවසේ හැම පුවත්පතකම සිරස්තලය එය වුනත් කෝර්ට්නි මෙනෙවියගේ මරණය ගැන කෙටි විස්තරයක් විතරක් තිබුණා. නිළිය ඇගේ ඇඳේ මියගොස් ඇති අතර ඇගේ මරණයට හේතුව මත්ද්‍රව්‍ය අධික ලෙස පානය කිරීමයි. "

එය අත්වැරැද්දක් ද? නැත්නම් සියදිවි නසා ගැනීමක්ද? සාක්ෂි දීමට කැඳවූ ඇගේ සේවිකාව ඇයගේ ස්වාමි දුව මත්ද්‍රව්‍ය ගන්නියක් බව පිළිගත්තා. මරණය හදිසි අනතුරක් බවට තීන්දුව ලැබුණා.එහෙම උනත් අපට ඇය සියදිවි නසාගන්න තියෙන හැකියාව ඉවත දාන්න බැහැ."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඇගේ මරණය විශේෂයෙන් අවාසනාවන්තයි, කලින් දින රාත්‍රියේ ඇති වූ ආරවුලට එය කිසිදු හෝඩුවාවක් නොදක්වන නිසා. ඒ කෙසේ වුවත්,මියගිය ක්‍රොන්ෂෝ සාමිවරයාගේ සිරුරේ තිබී කුඩා එනමල් ආලේපිත පෙට්ටියක් හමුවෙලා තියෙනවා. එහි *කොකෝ* ලෙස දියමන්තිවලින් අල්ලා තිබුණු අතර අඩක් විතර මත්ද්‍රව්‍ය වලින් පිරී තිබුණා. කෝර්ට්නි මෙනෙවියගේ මෙහෙකාරිය විසින් තමාගේ ස්වාමිදුවට අයිති දෙයක් බවට හඳුනාගත්තා. ඒක නිසා ඇය ඉක්මනින්ම එහි වහලෙක් වුණු බවයි මෙහෙකාරිය සාක්ෂි දුන්නේ "

"ක්‍රොන්ෂෝ සාමිවරයා මත්ද්‍රව්‍ය පාවිච්චි කරන කෙනෙක් ද?" "ඔහු මත්ද්‍රව්‍යවලින් බොහෝ දුරස් වුණු කෙනෙක් ඔහු ඒවාට අසාමාන්‍ය ලෙස විරුද්ධ වුණා. " පොයිරෝ කල්පනාකාරීව හිස වැනී ය. "ඒත් පෙට්ටිය ඔහු ළඟයි තිබුණේ ඒ වගේම කෝර්ට්නි මෙනෙවිය එය ගත් බව ඔහු දැන හිටියා.දැන් හැඟවෙන විදියට ඒක නෙවෙයි ද, මගේ හොඳ ජැප්? "

"ආ!" ජැප් තරමක් නොපැහැදිලි ලෙස පැවසීය. මම සිනාසුණෙමි. "හොඳයි, එයයි සිද්ධිය. ඔබ ඒ ගැන සිතන්නේ කුමක්ද? " "වාර්තා කරල නැති හෝඩුවාවක් ඔබ සොයාගෙන නැද්ද?""ඔව්, මේක තිබුණා." ජැප් සාක්කුවෙන් කුඩා වස්තුවක් ගෙන එය පොයිරෝ වෙත භාර දුන්නේය. එය ඇඳුම් අලංකරණයට යොදාගන්නා මරකත කොළ පැහැති කුඩා සිල්ක් බෝලයක් වූ අතර,එය වේගයෙන් ඇද ගලවාගෙන ඇති බවට හැඟෙන පරිදි එහි නූල් කිහිපයක් ගැලවී එල්ලෙමින් තිබුණි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"අපි එය මැරුණු මිනිසාගේ අතේ මිට මොලවාගෙන තිබෙද්දියි හමුවුණේ" යැයි පරීක්ෂක ජැප් පැහැදිලි කළේ ය. පොයිරෝ කිසිදු දෙයක් නොකියා එය ආපසු භාර දී "ක්‍රොන්ෂෝ සාමිවරයාට හතුරන් හිටිය ද?" යනුවෙන් විමසී ය.

"දන්න විදියට කවුරුත් නැහැ. ඔහු ජනප්‍රිය තරුණයෙක් වගේ. " "ඔහුගේ මරණයෙන් වාසි ලැබෙන්නේ කාට ද?" " ඔහුගේ මාමා වන ගෞරවනීය යූස්ටස් බෙල්ටේන්ට පක්ෂ මුල්පුටුව හා වතු ලැබෙනවා. ඔහුට එරෙහිව සැක සහිත කරුණු එකක් දෙකක් තියෙනවා. කුඩා රාත්‍රී භෝජන ශාලාව අසලින් යද්දී ප්‍රචණ්ඩ බහින්බස් වීමක් ඇසුණු බවත් ඔවුන්ගෙන් එක්කෙනෙක් යූස්ටස් බෙල්ටේන් බවත් කිහිප දෙනෙක් කියනවා. ඔබට පේනව ද, මේස පිහිය මේසය මතින් ඩැහැ ගැනීම ක්ෂණික කෝපය නිසා සිදුවුණු බව පෙනෙනවා."

"බෙල්ටේන් මහතා මේ ගැන කියන්නේ මොනවා ද?" "වේටර්වරයන්ගෙන් එක් අයෙක් බීම වර්ග සංග්‍රහ කිරීමේ දී නරක ලෙස හැසිරුණු නිසා ඔහුට බැණ වැදුණු බවයි ඔහු ප්‍රකාශ කර තිබෙන්නේ. ඒ වගේම එම වෙලාව එකහ මාරට කිට්ටු බව ඔබට පෙනෙනවා ඇති කැප්ටන් ඩිග්බිගේ සාක්ෂියට අනුව කාලය එම වෙලාවමයි. ඔහු ක්‍රොන්ෂෝ සමඟ කතා කිරීම සහ මෘත ශරීරය සොයා ගැනීම අතර ගත වූයේ මිනිත්තු දහයක් විතරයි. " "කොහොම වුණත්, පුංචිනෙලෝ ලෙස බෙල්ටේන් මහතා මොල්ලියක් හා රේන්ද ලොව්ච්චියක් ඇඳ සිටි බවයි මම හිතන්නේ ." පොයිරෝ දෙස කුතුහලයෙන් බලමින් ජැප් පැවසුවේ

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

" ඇත්තෙන්ම ඇඳ සිටි ඇඳුම් පැළඳුම් ගැන මම හරියටම දන්නේ නැහැ ඒ වගේම ඒවයි මේ මිනීමැරුමයි අතර තිබෙන සම්බන්ධයක් මටනම් පේන්නේ නැහැ"

"නැහැ?" පොයිරෝගේ සිනහවෙහි සමච්චල් සහගත බවක් තිබිණි. ඔහු නිහඬව ඉදිරියට ගියේය, ඔහුගේ දෑස් බැබළුණි : "මේ කුඩා රාත්‍රී භෝජනාගාරයේ තිරයක් තිබුණා එහෙම නැද්ද? " "ඔව් නමුත්- " "මිනිසෙකු හැංගී ඉන්න එය පිටුපස ඉඩක් තිබුන ද?" "ඔව් ඇත්ත වශයෙන්ම පොඩි ඉඩක් තිබුණා, නමුත් ඔබ ඒ ගැන දැන සිටියේ කොහොම ද - ඔබ එහේ ගිහින් නැහැ, පොයිරෝ මහත්මයා ඔබ ගිහින් තියෙනව ද?"

"නෑ, මගේ හොඳ ජැප්, මම මගේ මොළයෙන් තිරය සැපයුවා. එය නැතිව නාට්‍යය තර්කානුකූල වෙන්නේ නැහැ" සෑම විටම තර්කානුකූල විය යුතුය. නමුත් මට කියන්න, ඔවුන් වෛද්‍යවරයකු කැඳවූයේ නැද්ද? " "එක පාරක්, ඇත්ත වශයෙන්ම. නමුත් කරන්න පුළුවන් මුකුත් තිබුණේ නැහැ. මරණය ක්ෂණිකව වෙන්න ඇති. " පොයිරෝ නොඉවසිලිමත්ව හිස වැනුවේ ය. "ඔව්, ඔව්, මට තේරෙනවා. මේ වෛද්‍යවරයා මරණ පරීක්ෂණයේදී සාක්ෂි දුන්නා ද? "

"ඔව්." " අසාමාන්‍ය රෝග ලක්ෂණයක් ගැන ඔහු මුකුත් කීවේ නැද්ද?- ශරීරයේ පෙනුම ගැන අසාමාන්‍ය ලක්ෂණයක්වත්? ජැප් පොඩි මිනිසා දෙස පුදුමයෙන් බැලීය. "ඔව්, පොයිරෝ මහත්තයා, ඔබ, මේවා දැනගන්නේ කොහොම ද කියලා මට හිතාගන්න බැහැ."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"නමුත් ඔහු සඳහන් කළා අත් පා වල තද ගතිය හා දරදඬු ගතිය නිසා ඔහුට තම රාජකාරිය කිරීමට සෑහෙන අමාරු වුණ බවක්. ""ආහා!" පොයිරෝ පැවසීය. "ආහා! *මම මැරෙනවා !* ඒක කෙනෙකුට සිතීමට ඉඩ සලසන දෙයක් ජැප්,එහෙම නෙවෙයි ද? " එය නිසැකවම ජැප්ට සිතීමට දෙයක් දී නැති බව මම දුටුවෙමි. "ඔබ වස දීමක් ගැන සිතන්නේ නම්, මහත්මයා ඔබම හිතන්න මුලින්ම මිනිහෙකුට වස දී පසුව ඔහුට පිහියකිනුත් ඇනින මිනිහෙක් ඉන්නවද කියලා! "

"ඇත්ත වශයෙන්ම ඒක විහිළුවක්" පොයිරෝ සන්සුන් ව එකඟ විය."දැන් ඔබට මොනවා හරි දකින්න මහත්මයා? ඔබ මෘත ශරීරය හමුවුණ කාමරය පරීක්ෂා කිරීමට කැමති ද?." පොයිරෝ අත වැනුවේ ය. "දැනට එපා. මට උනන්දුවක් දක්වන එකම දෙය ඔබ මට කිව්වා - ක්‍රොන්ෂෝ සාමිවරයාගේ මත්ද්‍රව්‍ය ගැනීම ගැන අදහස් ""එහෙනම් ඔබට කිසිදෙයක් බලන්න අවශ්‍ය නැද් ද?" "එක දෙයක් විතරයි.""ඒ මොකක් ද?"

"ඇඳුම් සැලසුම් පිටපත් කළ චීන ප්‍රතිමා කට්ටලය." ජැප් විමතියෙන් බැලුවේ ය."හොඳයි, ඔබ විහිලුකාරයෙක්!" "ඔබට ඒක මා වෙනුවෙන් කරන්න පුළුවන් ද?" "ඔබ කැමති නම් දැන් බර්ක්ලි චතුරශ්‍රයට එන්න.ඔබට බලන්න හැකිවේවි බෙල්ටේන් මහතා හෝ ඔහුගේ ආධිපත්‍යය, මා කිව්වෙ නැත්නම් ඔබට ප්‍රතිමා බලන්න බැරිවේවි. "

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

අපි කුලී රථයකින් කුලී රථයකින් ගමන් ඇරඹුවෙමු. නව ක්‍රොන්ෂෝ සාමිවරයා නිවසේ සිටියේ නැති නමුත් ජැප්ගේ ඉල්ලීම පරිදි අප එකතුවේ අනර්ඝතම භාණ්ඩ තබා ඇති "චීන කාමරයට" රැගෙන යනු ලැබී ය. ජැප් අසරණව වටපිට බැලී ය."මහත්මයා, ඔබට අවශ්‍ය දෙය ඔබ කොහොම හොයාගන්නව ද කියල මට හිතාගන්නත් බැහැ."

නමුත් පොයිරෝ ඒ වන විටත් ආවරණ පුවරුව ඉදිරිපිටට පුටුවක් ඇදගෙන එය යුහුසුළු රොබින් කෙනෙක් මෙන් නරඹමින් සිටියේ ය. දර්පණයට ඉහළින්, කුඩා රාක්කයක, චීන රූප හය පිහිටුවා තිබුණේ ය. පොයිරෝ ඔහු ඒවා මිනිත්තු කිහිපයක් පරීක්ෂා කර අපට අදහස් කිහිපයක් ඉදිරිපත් කරමින් ඒවා ඉතා සුළු වශයෙන් විමසා බැලීය.

"'*මෙන්න ඔවුන්*' පැරණි ඉතාලි ප්‍රහසන. යුගල තුනක්! හාර්ලෙක්වින් සහ කොලොම්බින්, පියරොට් සහ පියරෙට් සුදු හා කොළ පැහැයට බොහොම ලස්සනයි - පුන්චිනෙලෝ සහ පුල්සිනෙලා ලා දම් සහ කහ පැහැයෙන් යුක්ත වේ.පුන්චිනෙලෝගේ ඇඳුම - රේන්ද ලොච්චිය සහ, මොල්ලිය , කලු උස තොප්පිය. ඔව්, මම හිතුවා වගේ, ගොඩක් සූක්ෂ්මව හදලා තියෙනවා. "

ඔහු ප්‍රතිමා පරිස්සමින් නැවත තබා පහළට පැන්නේය. ජැප් සෑහීමකට පත්නොවන බවක් පෙනුනද, පොයිරෝට පැහැදිලිවම කිසිවක් පැහැදිලි කිරීමේ අදහසක් නොතිබූ හෙයින්, රහස් පරීක්ෂකවරයා මේ කාරණය සම්බන්ධයෙන් ඔහුට කළ හැකි හොඳම දේ පෙන්වීය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

අපි පිටත් වීමට සූදානම් වෙමින් සිටියදී, නිවසෙහි ප්‍රධානියා පැමිණ හෙයින් ජැප් අපව හඳුන්වා දුන්නේ ය. හයවන විස්කවුන්ට් ක්‍රොන්ෂෝ පනස් වියැති පමණ විනීත, නපුරු මුහුණකින් යුත් තැනැත්තෙක් විය.ඔහු වයෝවෘද්ධ සලෙලුවෙක් සේ පෙණුනි.ඔහුගේ කැපී පෙනීමට උත්සහ දරන සිත් නොගන්නෙකුගේ ලක්ෂණ හේතුවෙන් මම ඔහු කෙරෙහි අප්‍රසාදයෙන් සිටියෙමි.

ඔහු අපට කාරුණිකව ආචාර කළ අතර, පොයිරෝගේ දක්ෂතාව පිළිබඳ විශිෂ්ට දේතමා අසා ඇති බව ප්‍රකාශ කළේ ය. සෑම අතින්ම ඔහු අපව ඔහුගේ නියමයන්ට යටත් කරගන්නා ලදී. ‘‘පොලිසිය ඔවුන්ට හැකි සෑම දෙයක්ම කරනවා, මම දන්නවා,’’ පොයිරෝ පැවසීය.‘‘ඒත් මට බය මගේ බෑණනුවන්ගේ මරණයේ අභිරහස හෙළිනොවෙයි ද කියලා මුළු දේම එය සම්පූර්ණයෙන්ම අභිරහසෙන් වටවෙලයි තියෙන්නේ. ’’පොයිරෝ ඔහු දෙස තියුණු ලෙස බලා සිටියේය.

‘‘ඔබේ බෑණාට ඔබ දන්නා සතුරන් සිටියේ නැද්ද?’’ ‘‘කිසිම කෙනෙක් නැහැ. මට ඒ ගැන විශ්වාසයි. ’’ ඔහු විරාමයක් තබා පසුව මෙසේ පැවසීය: ‘‘ඔබට කිසියම් ප්‍රශ්නයක් තියෙනවම් ඒක අහන්න- ’’ ‘‘එකක් පමණයි.’’ පොයිරෝගේ කටහඬ බරපතල විය. ‘‘ඇඳුම් පැළඳුම් ඒවා *හරියටම* ඔබේ ප්‍රතිමාවලින් ද සැලසුම් කලේ? ’’ ‘‘එයින් තමයි ආකෘතිය හැදුවේ.’’ ‘‘ස්තූතියි, ඔබට’’. මට දැනගන්න අවශ්‍ය එච්චරයි. මම ඔබට සුබ දවසක් ප්‍රාර්ථනා කරනවා. ’’

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඊළඟට මොනව ද?" අපි ඉක්මනින් පාරට බසින විට ජැප් ඇසුවේය. "මට ස්කොට්ලන්යාඩ් එකට වාර්තා කරන්න වෙනවා, ඔබ දන්නවනෙ. " " *හොඳයි!* මම ඔබව තියාගන්නේ නැහැ. මට තවත් අවධානය යොමුකරන්න පොඩි කාරණයක් තියෙනවා, ඊට පස්සේ" "ඔව්?" "මේ අපරාධය විසඳෙනවා. "

"මොකක්ද? ඔබ එය නෙවෙයි අදහස් කළේ! ක්‍රොන්ෂෝ සාමිවරයා මැරුවේ කවුද කියලා ඔබ දන්නවාද? " "*සම්පූර්ණයෙන්ම.*" "ඒ කවුද? යූස්ටස් බෙල්ටේන්? " "ආහ්, *මගේ යාළුවා* , ඔබ දන්නවා මගේ පොඩි දුර්වලතාවය! මම අන්තිම මොහොත දක්වාම නූල් පොටවල් මම ගාවම තියාගන්නවා. ඒත් බයවෙන්න එපා. කාලය ආවම මම ඔක්කොම කියන්නම්. මට ෙගෞරවයක් අවශ්‍ය නැහැ මොක ද මේක ඔබේ නඩුව.හැබැයි ඔබ මට මේකේ විසඳීම මගේ මාර්ගයෙන් විසඳන්න මට ඉඩ දෙන්න "

"ඒක සාධාරණයි" කියා ජැප් පැවසීය. "එහෙනම්, කවදා හරි විසඳුම ආවොත් මම නම් කියන්නේ ඔබ බෙල්ලෙක්, එහෙම නේද? " පොයිරෝ සිනාසුණේය. "හොඳයි,වෙලාව ගිහින්. මම මූලස්ථානයට යනවා." ඔහු ගිය අතර පොයිරෝ පසුකර යන කුලී රථයකට නවත්වන ලෙස සංඥා කළේය. "අපි දැන් කොහෙද යන්නේ?" මම කුතුහලයෙන් ඇසුවෙමි. "ඩේවිඩ්සන්ල බලන්න වෙල්සිවලට." ඔහු ලිපිනය රියදුරාට ලබා දුන්නේය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"අළුත් ක්‍රොන්ෂෝ සාමිවරයා ගැන ඔබට හිතෙන්නේ මොනව ද?" මම ඇසුවෙමි."මොනව කියන්න ද මගේ යාළුවා?""මම නම් ඔහුව අවිශ්වාස කරනවා.""ඔබ හිතන්නේ ඔහු කතන්දර පොත්වල 'දුෂ්ට මාමා' වගේ කියා නේද?""එහෙම නේද?""මම, මම හිතන්නේ ඔහු අපිත් එක්ක කුළුපග වුණා" යැයි පොයිරෝ පැවසීය. "ඔහුට ඔහුගේ හේතු තියෙන්න ඇති!"පොයිරෝ මා දෙස බලා, කනගාටුවෙන් හිස ගසා දමා, "ක්‍රමෝපායයන් නැහැ. " යැයි පැවසුවේ ය. ඩේවිඩ්සන්ලා ජීවත් වූයේ "මැන්ෂන්" මහල් නිවාසයේ තුන්වන මහලේය. ඩේවිඩ්සන් මහතා නොමැති වුවත් මහත්මිය සිටි හෙයින් අපව පෙරදිග ආකාරයේ සැරසිලි තිබූ දිගු එහෙත් පහත් කාමරයකට අපව කැඳවාගෙන යන ලදී. එහි වාතය නාසයට පීඩාකාරී බවක් දැනුණු අතර එය හඳුන්කූරු නිසා ඇති වූ අධික සුවඳ නිසා ය.

ඩේවිඩ්සන් මහත්මිය ඉක්මනින් අප වෙත පැමිණි අතර ඇය කුඩා, පැහැපත් තැනැත්තියක් විය. ඇයගේ නිල් ඇස් වල තිබුණු දීප්තිය හා විචක්ෂණශීලී බව නිසා සැඟවී ගිය ද ඒවායේ දුක්ඛදායක බවක් හා සිත් ඇදගන්නා සුළු බවක් පෙනෙන්නට තිබුණි. පොයිරෝ මෙම සිද්ධිය සමඟ අපගේ සම්බන්ධතාවය පැහැදිලි කළ අතර ඇය කනගාටුවෙන් හිස වැනුවා ය. "දුප්පත් ක්‍රොන්ච් සහ දුප්පත් කොකෝ ! අපි දෙදෙනාම ඇයට ගොඩක් හිතවත් ඇයගේ මරණය අපට ගොඩක් දුකක්. ඔබට මගෙන් අහන්න ඕන මොනව ද? මම ඒ බිහිසුණු රැයට ආපහු යන්න ඕනම ද?"

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

“ මැඩම්, මාව විශ්වාස කරන්න, මට ඔබේ හැඟීම් තේරෙනවා. ඇත්ත වශයෙන්ම, පරීක්ෂක ජැප් අවශ්‍ය ඔක්කොම මට කියලයි තියෙන්නෙ. එදා රාත්‍රියේ ඔබ ඇඳගෙන හිටි ඇඳුම බලන්න මට පුළුවන් ද? ”

ඇය තරමක් පුදුමයට පත් වූ බවක් පෙනෙන්නට තිබූ අතර, පොයිරෝ සුමටව මෙසේ පැවසීය: “ඔබ තේරුම් ගත්තා මැඩම්, මම මගේ රටේ විදියටයි වැඩ කරන්නෙ. එහිදී අපි සෑම විටම අපරාධය ආයෙත් සකස් කරනවා. ඒක වෙන්න පුළුවන් සත්‍ය විදිය *ප්‍රතිනිර්මාණය* කළ යුතුයි, එහෙම නම්, ඇඳුම් පැළඳුම් එයට ගොඩක් වැදගත්. ” ඩේවිඩ්සන් මහත්මිය තවමත් තරමක් සැක සහිත ලෙස බැලුවාය.

“ඇත්ත වශයෙන්ම අපරාධයක් ප්‍රතිනිර්මාණය කිරීම ගැන මම අහලා තියෙනවා. “ඒත් මම දැනගෙන හිටියේ නැහැ ඔයා ඒ ගැන දන්නවයි කියලා. ඒත් මම දැන් ඇඳුම ගේන්නම්. ” ඇය කාමරයෙන් පිටව ගොස් සුදු සැටින් සහ කොළ පැහැයෙන් යුත් ඇඳුමක් රැගෙන වහාම ආපසු පැමිණියාය. පොයිරෝ එය ඇයගෙන් ගෙන එය පරීක්ෂා කර හිස නමමින් ආපසු භාර දුන්නේය.

“*ඔබට ස්තූතියි මැඩම්!* මට පේන විදියට ඔබ ඔබගේ කොල පාට වූල් බෝලයක් නැති කරගෙන, මෙතන මේ උරහිස ළඟ එක. ”“ඔව්, එය එය එහි දී ඉරුණා. මම ඒක අරගෙන ක්‍රොන්ෂෝ සාමිවරයාට දුන්නා මම වෙනුවෙන් තියාගන්න. “ඒ රාත්‍රී ආහාරයෙන් පස්සෙ ද?” "ඔව්."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"බේදවාචකයට වැඩි වෙලාවකට කලින් නොවේ නේද සමහරවිට?"ඩේවිඩ්සන් මහත්මියගේ සුදුමැලි දෑස් තුළ එක්වරම ක්ලාන්ත ගතියක් ඇති වූ අතර ඇය ඉක්මනින් පිළිතුරු දුන්නාය: "අනේ නෑ" ඊට ගොඩක් වෙලාවකට කළින්. ඇත්තෙන්ම රෑ කෑම ඉවරවෙනවත් එක්කම. " "මට ජේනවා. හොඳයි, එපමණයි. මම ඔබව තවත් අවුල් කරන්නේ නැහැ. *ආයුබෝවන්, මැඩම්.*" "හොඳයි", අපි ගොඩනැගිල්ලෙන් එළියට එන විට මම පැවසුවෙමි," එය වූල් බෝලයේඅභිරහස පැහැදිලි කරනවා" "මට පුදුමයි." "ඇයි, ඔබ අදහස් කරන්නේ මොකක් ද?" "හේස්ටිංග්ස්, මම ඇඳුම පරීක්ෂාකරනවා ඔයා දැක්කා නේ ද? ""ඔව්?"

" *හොඳයි,* ඇයකිව්ව විදියට,නැතිවෙච්ච බෝලය ඉරිලා නැහැ. ඇය කිව්ව විදියට නෙවේ, එය *කපලයි* තිබුණේ, *මගේ* යාළුවා, කතුරකින්'. නූල් ඔක්කොම එකම දිගටයි තිබුණේ. " "මගෙ දෙවියනේ!" මම කෑගැසුවෙමි. "මේක තව තවත් අවුල් වෙනවා." "ඒකෙ අනිත් පැත්ත,ඒක තවත් ලේසි වෙනවා." "පොයිරෝ, කවදාහරි මම ඔබව මරනවා! ඔබ ලේසියෙන් හොයාගන්න හැම දෙයක්ම තත්වය තිබුණටත් වඩා අමාරු කරනවා! "

"ඒ වුණත් මම පැහැදිලි කරද්දී ,*මගේ යාළුවා,*ඒක හරිම ලේසි වෙන්නෙ නැද් ද?" "ඔව්; එය තමයි කරදරකාරී කොටස! මට හිතෙනවා මට ඒක තනියම කරන්න තිබුණා කියලා. ""ඉතින් ඔබට පුළුවන්, හේස්ටිංග්ස්, ඉතින් ඔබට පුළුවන්. ඔබ ඔබේ අදහස් පෙළගස්වන විදියේ අවුල හදාගත්තොතින්! ක්‍රමයක් නැතිව - "

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඔව්, ඔව්," මම කඩිමුඩියේ කීවෙමි, මක්නිසාද යත්, පොයිරෝ තම ප්‍රියතම තේමාව ගැන කථා කරන විට අවසානයක් නොමැති බව මා දැන සිටි බැවිණි. "හොඳයි. මට කියන්න, අපි ඊළඟට කරන්නේ මොනව ද? ඔබ ඇත්තටම අපරාධය නැවත සකස් කිරීමට යනවාද? " "එහෙම නෙවෙයි. නාට්‍යය අවසන් බව අපි හිතමු, ඒත් මම යෝජනා කරන්නේ "විකට අංගයක්" එකතු කරන්න? "

මෙම පුදුමාකාර රංගනය සඳහා දිනය ලෙස ඊළඟ අඟහරුවාදා පොයිරෝ විසින් නියම කරන ලදී. එහි සූදානම මට මහත් කුතුහලයක් ඇති කළේ ය. කාමරයේ එක් පැත්තක සුදු තිරයක් ස්ථාපිත කළේ ය. දෙපස බර තිර තිබුණේ ය. ආලෝකකරණ උපකරණ සහිත මිනිසෙක් ඊළඟට පැමිණියේ ය, අවසානයේ කණ්ඩායමක් පොයිරෝගේ නිදන කාමරය තාවකාලික ඇඳුම් මාරුකරන කාමරයක් ලෙස නාට්‍ය වෘත්තියේ විශේෂඥ කණ්ඩායමක් පැමිණ කළේ ය.

අටට මඳ වෙලාවකට පෙර ජැප් පැමිණියේ සතුටු සිතින් නොවේ. මම නිල රහස් පරීක්ෂකවරයා කැඳවූයේ ඔහු සැලැසමට අවශ්‍ය වූ නිසා ය. "ඔහුගේ අදහස් හැම තිස්සෙම අවුල් සහගතයි. නමුත් එහිදී, එයින් කිසි හානියක් කරන්න බැහැ, ඔහු කියන විදියට, එයට අපිව කරදර වීමෙන් ගලවා ගත හැකියි. ඔහු නඩු සම්බන්ධයෙන් ඉතා දක්ෂයි. ඇත්ත වශයෙන්ම මමත් ඔහුත් එකම හෝඩුවා පස්සෙ තමයි ගියේ"

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

ජැප් මෙහි සත්‍යය වැසීමට තැත් කරන බව මට ඉවෙන් මෙන් දැනුණි -"ඒත් මම ඔහුට ඔහුගේ විදියට මේක කරන්න ඉඩ දෙන බවට පොරොන්දු වුණානේ. ආ! මෙන්න කට්ටිය. " පළමුවෙන්ම නව ක්‍රොන්ෂෝ සාමිවරයා පැමිණියේ, මා මෙතෙක් දැක නැති මැලාබි මහත්මිය සමඟ ය. ඇය ලස්සන,
අඳුරු හිසකෙස් ඇති කාන්තාවකි.ඇය සසල වී සිටින බවක් දක්නට ලැබිණි. ඩේවිඩ්සන් මහත්මයා ඊළඟට ආවේය . ක්‍රිස් ඩේවිඩ්සන් මම පළමු වරට දුටුවෙමි. උස හා අඳුරු පැහැයෙන් යුත් ඔහු නළුවෙකු මෙන් කඩවසම් විය. පොයිරෝ තිරයට මුහුණ ලා සිටින ලෙස පක්ෂයට ආසන සකස් කර තිබුණි. මෙය දීප්තිමත් ආලෝකයකින් ආලෝකමත් විය.

පොයිරෝ අනෙක් විදුලි පහන් නිවා දැමුවේ තිරය හැර කාමරය අන්ධකාරයේ ගිලෙන ලෙස ය. පොයිරෝගේ හඬ අඳුරෙන් නැඟී ආවේ ය. "නෝනාවරුනි මහත්වරුනි,මම ඔබට පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්.රූප හයක් තිරය හරහා ගමන් කරාවි.ඔවුන් ඔබට හුරුපුරුදුයි. පියරොට් සහ ඔහුගේ පියරේට්; පුන්චිනෙලෝ විකටයා සහ අලංකාර පුල්සිනෙලා;ලස්සන කොලම්බයින්, සැහැල්ලුවෙන් නටන, හාර්ලෙක්වින්, ආත්මය, මිනිසාට නොපෙනෙන! "

මෙම හඳුන්වාදීමේ වචන සමඟ, ප්‍රදර්ශනය ආරම්භ විය. පොයිරෝ සඳහන් කළ සෑම රූපයක්ම තිරය ඉදිරිපිටට පැන පැන පැමිණ, මොහොතකට එහි රැඳී සිටිමින් අතුරුදහන් විය. විදුලි පහන් දැල්වුණු විට සභනයෙන් හෙළු සුසුමක් ඇසුණි.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

ඔවුන් කුමක් සිදුවේ දැයි නොදැන බියෙන් සියලු දෙනා නොසන්සුන් වී සිටියහ. මට පෙනුණු ආකාරයට නඩු විභාගය අසාර්ථක වී තිබුණි. අපරාධකරු අප අතර සිටී නම්, පොයිරෝ ඔහුගෙන් බලාපොරොත්තු වී ඇත්තේහුරුපුරුදු ප්‍රතිමාවක් දුටු විට ඔහුගේ කටින් කුමක් හෝ පිටවේ යැයි දැයි මට සිතුණි.එසේ නම් ඔහුගේ සැලැස්ම බිඳ වැටී ඇත.

කෙසේවෙතත්, පොයිරෝ අංශු මාත්‍රයකිනුදු කැළඹී සිටියේ නැත. ඔහු ඉදිරියට පැමිණියේ ය.
"දැන්, නෝනාවරුනි මහත්වරුනි,මම හිතනවා ඔබලා මට ඔබ දැකපු දේවල් කියාවි කියලා, නව ක්‍රොන්ෂෝ සාමිතුමනි ඔබ පටන් ගන්නව ද? " ඔහු පැටලී සිටින බවක් පෙණුනි. "මට බයයි මට තාම තේරුණේ නැහැ."

" අප දැන් දැකපු දේ මට කියන්න.""මම - හොඳයි, මම කිව යුතුයි, මම දැක්කා පැරණි ඉතාලි නාට්‍යයක චරිතවලට අනුව හදපු ප්‍රතිමා හයක්.හ්... එදා රාත්‍රියෙහි අප ඉදිරිපත් කරපු චරිත ටික"පොයිරෝ එහිදී "ඒ රැය අමතක කරන්න එපා සාමිතුමනි". "ඔබේ කතාවේ පළමු කොටසයි මට අවශ්‍ය. මැඩම්, සාමිතුමා සමඟ එකඟද? "මැලාබි මහත්මියගේ පැත්තට ඔහු හැරුණි. "ඇත්තෙන්ම ඔව්."

"ඉතාලි ප්‍රහසන නියෝජනය කරන චරිත හයක් ඔබ දැක ඇති බවට ඔබ එකඟද?""ඇයි, නිසැකවම."" ඩේවිඩ්සන් මහත්මයා? ඔබත්?" "ඔව්.""මහත්මිය?" "ඔව්." ඔහු අප දෙස බැලුවේය. ඔහුගේ මුහුණ රත් පැහැ ගැන් වී ඇති අතර ඔහුගේ ඇස් බළලෙකුගේ මෙන් කොළ පාට විය.

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"එහෙත්, *ඔබ සියල්ල වැරදියි!* එදා රාත්‍රියෙදි වගේම ඔබේ ඇස් ඔබට බොරු කළා. ඔබේ ඇස්වලින් දේවල් දකින්න පුළුවන් හැබැයි ඒවා හැමතිස්සෙම සත්‍යය පැවසුවේ නැහැ"ඔබ දේවල් බලන්න මනසෙහි දැසින්; අළු පැහැති කුඩා සෙල භාවිතා කරන්න! එහෙනම්, අද රෑ ඒ ගැන දැනගන්න වික්ටරි බෝල් දින රාත්‍රියේ, ඔබ දුටුවේ ප්‍රතිමා *හයක්* නොව *පහක්!* බලන්න! " විදුලි පහන් නැවතත් නිවී ගියේය. තිරය ඉදිරිපිට රූපයක් පැමිණියේ ය - පියරොට්! "මේ කව් ද?" පොයිරෝ ඇසුවේ ය.

"එය පියරොට් ද?" "ඔව්" කියා අපි සියල්ලෝම කෑගැසුවෙමු."නැවත බලන්න!" වේගවත් චලනයකින් මිනිසා සිය ලිහිල් පියරොට් ඇඳුම ගලවා දැමී ය. එතන සිටියේ හාර්ලෙක්වින් ය! ඒ මොහොතේම කෑගැසීමක් හා පුටු පෙරලීමක් ඇසුණි. "ඔබට ශාප කරන්න" ඩේවිඩ්සන්ගේ කටහඬ ඇසුණි. "ඔබට ශාප කරන්න! ඔයා කොහොමද අනුමාන කළේ? " " මම ඔබව අත්අඩංගුවට ගන්නවා ක්‍රිස්ටෝපර් ඩේවිඩ්සන් ක්‍රොන්ෂෝ සාමිවරයා මරාදැමීමේ වරදට ඔබ කියන ඕනම දෙයක් ඔබට විරුද්ධ සාක්ෂියක් හැටියට යොදා ගන්නවා"

පැය තුන්කාලකට පසු කුඩා රාත්‍රී භෝජන සංග්‍රහයක් විය. පොයිරෝගේ මුහුණ සිනහවෙන් පිරී තිබුණේ ය.ඔහුට තිබූ ඊළඟ රාජකාරිය වූයේආගන්තුක සත්කාර කිරීමට සහ අපගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම ය. "ඒ සියල්ල ඉතා සරලයි. කොළ වූල් බෝලය ගනිමු."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"එය හඟවනවා එය සාමිවරයා මිනීමරුවාගේ ඇඳුමෙන් ඉරාගත් බවට, මම පියරෙට් මගේ මනසින් බැහැර කළා. (මේස පිහියක් ගෙදර ගෙනයාමට සැලකිය යුතු ශක්තියක් අවශ්‍ය වේ) අපරාධකරු ලෙස පියරොට් සැසඳේ . නමුත් මිනීමැරීමට පැය දෙකකට පමණ පෙර පියරොට් පිටව ගියා. එහෙනම් ඔහුට ක්‍රොන්ෂෝ සාමිවරයා මරාදැමීමට ආපසු එන්න සිදුවෙනවා.එහෙමත් නැත්නම්, *හොඳයි,* එහෙනම් ඔහු යන්න කලින් ඔහුව මරාදැමිය යුතුයි! එය කළ නොහැකිද?"

"එදින සවස රාත්‍රී ආහාරයෙන් පසු ක්‍රොන්ෂෝ සාමිවරයා දුටුවේ කවුද? ඩේවිඩ්සන් මහත්මිය විතරයි, ඇය වූල් බෝලය ගැන දුන් කට උත්තරය,බොරුවක් බවට මම අනුමාන කළා, ඇත්ත වශයෙන්ම, ඇය තමන්ගේ සැමියාගේ ඇඳුමෙන් සාමිවරයා ඉරාගත් වූල් බෝලය වෙනුවට තමන්ගේ එකක් කපා දුන්නා. ඒත්, එකහමාරට පෙට්ටියේ හිටියේ කවු ද? ඒක අනිවාර්යෙන්ම වෙස්වලාගැනීමක්. බෙල්ටේන් මහතා වැරදිකරු වීමේ හැකියාව මම මොහොතක් හිතා බැලුවා."

එහෙත් ඔහුගේ අමතර කොටස් තිබුණු ඇඳුම නිසා ඔහුට එම හාර්ලෙක්වින් හා පුන්චිනෙලෝ චරිත දෙකම කරන්න බැරි බව පැහැදිලියි. අනෙක් අතට, සාමිවරයාගේ උසින්ම යුත් තරුණයෙකු වන ඩේවිඩ්සන්ට වෘත්තියෙන් නළුවෙකු වුණු , කාරණය ඉතා ලේසියි. "ඒත් එක දෙයක් මට කරදරයක් වුණා. පැය දෙකකට කලින් මිය ගොස් සිටි අයෙක් සහ විනාඩි දහයක් මිය ගිය අයෙක් අතර වෙනස වටහා ගැනීමට වෛද්‍යවරයෙකුට බැරිවෙන්න පුළුවන් ද?"

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

හොඳයි, වෛද්‍යවරයා එය තේරුම් ගත්තා! නමුත් ඔහුව සිරුර පරීක්ෂාවට පෙර , 'මේ කෙනා මැරිලා කොච්චර වෙලාවක් ගිහින් දැයි ' ඇසූ විට. මිනිත්තු දහයකට පෙර මිනිසා පණපිටින් දැක ඇති බව ඔහුට කිවූ නිසා ඔහුගේ පරීක්ෂණ ප්‍රතිඵලය වැරදි යැයි ඔහුට හිතුණා,. ඒ නිසා ඔහු පරීක්ෂාවේ දී අත් පා වල දරදඬු ගතිය කරදරයක් වුණු බව කියා එය යන්තමින් ඇහෙව්වා! "සියල්ල දැන් මගේ න්‍යාය අනුවයි වෙන්නෙ. ඩේවිඩ්සන් ක්‍රොන්ෂෝ සාමිවරයා මරා දමා ඇත්තේ රාත්‍රී භෝජනයෙන් පසු, ඔබට මතක ඇති ඔහු රාත්‍රි ආහාරයෙන් පසු නැවත භෝජන ශාලාවට ගිය බව.

ඊළඟට ඔහු කෝර්ට්නි මෙනෙවිය සමඟ පිටත් වුණා, ඇගේ මහල් නිවාසයේ දොර ළඟට ඇරලවා (ඔහු කිව්ව විදියට ඇතුලට ගිහින් ඇය සන්සුන් කළේ නැහැ) කොලෝසස් ශාලාවට ආපහු ආවා. නමුත් පියරොට් විදියට නෙවෙයි හාර්ලෙක්වින් ලෙස එය ඔහුගේ පිටත ඇඳුම ඉවත් කිරීමෙන් එය කළ හැකි විය." මියගිය මිනිසාගේ මාමා ඉදිරියට නැඹුරු වූ අතර ඔහුගේ දෑස් ව්‍යාකූල විය.

"ඒත් එහෙම නම්,ඔහු එය කිරීමට වික්ටරි බෝල් නර්තනයම තෝරගත්තේ ඇයි . ඔහු එයට පෙළඹීමේ හේතුව මොකක් ද? මට ඒක හිතාගන්න බැහැ. " "ආ! එහිදී අපි දෙවන බේදවාචකය බලමු. එක් සරල කරුණක් තිබුණා හැමෝම නොසලකා හැරිය. කොර්ට්නි මෙනෙවිය මිය ගියේ කොකේන් විෂ වීමෙන් ක්‍රොන්ෂෝ සාමිවරයාගේ සිරුරේ තිබී එනමල් පෙට්ටියේ තමයි ඇයගේ මත්ද්‍රව්‍ය තිබුණේ. එහෙම නම්, ඇය මරා දැමුනු මාත්‍රාව එය ලබාගත්තේ කොහෙන්ද?"

sinhalaebooks.com

ඇයට එය සපයන්න පුළුවන් වුනේ එක් පුද්ගලයෙකුට විතරයි- ඩේවිඩ්සන්. ඒක ඒක්කොම පැහැදිලි කරනවා. ඒක ඇයගේ ඩේවිඩ්සන් එක්ක තිබුණු මිත්‍රත්වයත් ඇයව ගෙදර ඇරලවන ලෙස ඩේවිඩ්සන් ගෙන් ඉල්ලා සිටීමත් පැහැදිලි කරනවා . මත්ද්‍රව්‍ය ගැනීමට දැඩි ලෙස විරුද්ධ ක්‍රොන්ෂෝ සාමිවරයා ඇය මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී ඇති බව සොයාගත්තහම ඩේවිඩ්සන් ඇයට එය සැපයූ බවට සැක කළා. ඩේවිඩ්සන් මේක ප්‍රතික්ෂේප කළ බවට සැකයක් නැහැ, නමුත් ක්‍රොන්ෂෝ සාමිවරයා කෝර්ට්නි මෙනෙවියගෙන් උත්සවයේ දී ඇත්ත දැනගැනීමට ලෑස්තිවෙලයි හිටියේ.

අවාසනාවන්ත ගැහැණු ළමයාට ඔහු සමාව දුන්නත්, ජීවිකාව මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරගත් පුද්ගලයාට සමාව නොදුන්නේ ය. ඒක හෙළිවුණොත් ඩේවිඩ්සන්ට කරදර සිදුවන බව අනිවාර්යයි. ඔහු උත්සවයට ගයේ කොහොමහරි සාමිවරයාව නිශ්ශබ්ද කරන අරමුණින්."

"එහෙනම් කොකෝගේ මරණය අහම්බයක්ද?" "එය ඩේවිඩ්සන් විසින් දක්ෂ ලෙස කරන දෙයක් කියායි මමනම් හිතන්නෙ. ඇය ක්‍රොන්ෂෝ සාමිවරා එක්ක කේන්තියෙනුයි හිටියේ ඔහුගේ නින්දා අපහාස නිසාත් ඇයගෙන් මත්ද්‍රව්‍ය ලබා ගැනීම නිසාත්. ඩේවිඩ්සන් සැපයුවා විෂ මත්ද්‍රව්‍ය. "තවත් දෙයක්," මම කීවෙමි. "බිත්තියේ තිබුණු ඉඩ සහ තිරය? ඔබ ඒවා ගැන දැනගත්තේ කෙසේද? " "ඇයි, *මගේ යාළුවා,* ඒක ඔක්කොටම වඩා සරලයි . වේටර්වරු ඒ කුඩා කාමරයේ ඇතුළත හා පිටත හිටියා."

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

sinhalaebooks.com

"ඉතින්, පැහැදිලිවම, සිරුර බිම තිබුණොත් ඒක හමුවෙනවා. එය සැඟවිය හැකි තැනක් කාමරයේ තියෙන්න ඕන. ඒක නිසා මම තිරයක් ඒක පිටුපස බිත්තියේ ඇති ඉඩක් ගැන හිතුවා. ඩේවිඩ්සන් සිරුර ඇදගෙන ගිහින් හංගලා, ඊට පස්සේ ආපහු ඇවිත් ඔහුට අවධානය අරගෙන සිරුර තිබුණු තැනින් එළියට ඇද්දා.ඒක හොඳ සැලැස්මක්. ඔහු දක්ෂයෙක්! "

එහෙත්, පොයිරෝගේ කොළ පැහැති දෑස් තුළ ඔහු නොකියූ දෙයක් තිබිණි. "ඒත් හර්කියුල පොයිරෝ තරම් දක්ෂ නැහැ! "

නිමි. . .

https://sinhalatranslationsofdetectivestories.blogspot.com

මෙවැනි ඉහළම තත්වයේ ගුණාත්මක PDF ලබා ගැනීමට
https://sinhalatranslationsofdetectivestories.blogspot.com/

වෙත පිවිසෙන්න.